
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ බක් පුර පසළොස්වක පෝද 2023 අප්‍රේල් 05 බදාදා BUDUSARANA WEDNESDAY APRIL 05, 2023

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 41 පත්‍රය, පිටු 32 ආරම්භය 1965-06-13 මිල රු. 100.00





# වචන මාත්‍රයෙන් පමණක් සරණාගමනය සිදු නොවේ

**පුද්ගලයෙක් බුද්ධ ශාසනයට ඇතුළත් වන්නා වූ ප්‍රධානතම දොරටුව තිසරණය වෙයි. 'සර්වඥ වූ, දෙව්මිනිසුන්ට ශාස්තෘ වූ ලොවුතුරා බුදු රජාණන් වහන්සේ මම සරණ යමි, බුදු රජාණන් වහන්සේ සරණ යාම මට ආරක්ෂාව පිණිස ද, නිර්භයතාව පිණිස ද වන්නේ ය ' යනාදීන් ත්‍රිවිධ රත්නය සරණ කොට ගැනීමෙන් තිසරණය පිහිටන්නේ ය.**

ලෞකික සරණාගමනය, ලෝකෝත්තර සරණාගමනය යැ'යි ප්‍රධාන වශයෙන් සරණාගමනය දෙවැදෑරුම් වේ. නිර්වාණය ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කොට ගත් සෝවාන් ආදී මාර්ගඵල ලැබූ ආර්ය ශ්‍රාවකයන්ගේ එම මාර්ගය ලබන මොහොතෙහි හෙවත් මාර්ගක්ෂණයෙහි ආර්ය අෂ්ටාංගික මාර්ගය ම එක් සිතක පහළ වේ. එම මොහොතෙහි ඔවුන්ගේ චිත්ත සන්තානයෙහි ඇති වන නිවන අරමුණු කරගත් ස්ථිරභාවය ලෝකෝත්තර සරණාගමනය යි.

මහමෙර මෙන් අචල වූත්, ස්ථිර වූත් ලෝකෝත්තර සම්මාදිට්ඨිය හා එක් ව යෙදෙන බැවින් එම සරණාගමනය ස්ථිර වෙයි. එහි වෙනත් ප්‍රභේදයක් ද නැත. ස්ථිර බැවින් ආර්ය ශ්‍රාවකයකු නැවත නැවත සමාදන් වීමක් හෝ සරණ යාමක් අවශ්‍ය නොවේ.

ආත්ම සන්නිර්යාත සරණාගමනය
තත්පරායණ සරණාගමනය
ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය
ප්‍රණීත සරණාගමනය
යනුවෙන් සතරාකාර වේ.

අද පටන් කොට මාගේ ජීවිතය ත්‍රිවිධ රත්නයට පූජා කරමි. මාගේ ජීවිතය බුදුරජාණන් වහන්සේ, ධර්මයට, සඟුන්ට පූජා වේවා යනුවෙන් කියා තෙරුවන් සරණ යාම ආත්ම සන්නිර්යාන්ත සරණාගමනය යි. බුදුරදුන් දවස සුමන මල්කරු මේ ආත්ම සන්නිර්යාන්ත සරණාගමනයෙන් තෙරුවන් සරණ ගියේ ය.

අද පටන් මම රත්නත්‍රය පිහිට කොට ගනිමි යනුවෙන් සරණ ගැනීම තත්පරායණ සරණාගමනය යි. අපේ රටෙහි ද කලක් ආත්ම සන්නිර්යාන්ත සරණාගමනය පැවතිය ද, දැන් එය අභාවයට ගොස් ඇත. එහෙයින් මෙකල බොහෝ බෞද්ධයන් තෙරුවන් සරණ යන්නේ තත්පරායණ සරණාගමනයෙන් බව පෙනේ.

'අද පටන් මාගේ සියලු වැඳීම් පිදීම් හා ගරු බුහුමන් බුද්ධාදී ත්‍රිවිධ රත්නයට පමණක් ම කරමි'

යනුවෙන් සරණ ගත වීම ප්‍රණිපාත සරණාගමනය යි. උපාලි ගෘහපතිතුමා, බ්‍රහ්මායු බ්‍රාහ්මණයා වැන්නවුන් එසේ ප්‍රණිපාත සරණාගමනයෙන් තෙරුවන් සරණ ගියෝ ය.

අද පටන් මම ලොවුතුරා බුදුරජාණන් වහන්සේ කෙරෙහි ද, ධර්මය කෙරෙහි ද, සංඝයා කෙරෙහි ද ශිෂ්‍යයකු වෙමි. ත්‍රිවිධ රත්නයේ අතවැසියකු වෙමි යනුවෙන් සරණ ගත වීම ශිෂ්‍යභාවෝපගමන සරණාගමනයයි. පිප්ඵලී මානවක උතුමා සරණ ගියේ මේ සරණාගමනයෙනි.

ලොවුතුරා බුදු කෙනෙකුන් වහන්සේගේ පහළ වීමෙන් ම ධර්ම රත්නය ලෝකයට පහළ වේ. එසේ ම ධර්ම රත්නය අවබෝධ නොකළේ නම් ලොවුතුරා බුදු කෙනකුන්ගේ පහළ වීම නොවන්නේ ය. බුදු කෙනෙකුන් පහළ ව. ධර්මය දේශනා කිරීමෙන් පමණක් ම සංඝ රත්නය ද පහළ වේ. බුදුරදුන්ගේ අනුශාසනය වූ ධර්මය ද, සංඝයා වහන්සේ නොමැති ව කල් පවත්නේ නොවේ. එ බැවින් මේ ත්‍රිවිධ රත්නය ම වෙන් නොකළ හැකි සේ ඒකාබද්ධ ව පවතී.

ලොවුතුරා ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේ බුදු බවට පැමිණ පනස් වැනි දින උදෑසන මධ්‍ය මණ්ඩලයට යමින් සිට ලොවුතුරා බුදුන්ට විළඳ හා මී පිඬු පූජා කිරීමෙන් පසු බුදුන් දහම් යන ද්විවිධ රත්නය සරණ ගිය තපුස්සක හා භල්ලික යන දෙදෙනාගෙන් ද්වේවාචික සරණාගමනය ආරම්භ වී ය.

බුදු රජාණන් වහන්සේ බරණැස ඉසිපතනයේ දී ධම්මචක්කප්පවත්තන සූත්‍රය වදාළ ගමනේ දී සෝවාන් ඵලයට පත් වූ අඤ්ඤකොණ්ඩඤ්ඤ තවුසාණන්ට ද ලැබුණේ ද්වේවාචික සරණාගමනය යි. එතුමාණන් ඒහි භික්ෂුභාවයෙන් මහණ උපසම්පදාව ලැබූ කල්හි ප්‍රථම බුද්ධ ශ්‍රාවකයා පහළ වූවා මිස, ඒ වන විටත් සංඝයා පහළ වී තිබුණේ නැත. එයින් පසු පිළිවෙළින් වප්ප, භද්දිය, මහානාම, අස්සජී යන තවුසන්ගේ මහණ වීමෙන් හා රහත් වීමෙන් සංඝ රත්නය ලෝකයෙහි පහළ වූයේ ය. උන් වහන්සේලා උතුම් නිර්වාණය අවබෝධ කළ බැවින් සරණාගමනයක් අවශ්‍ය නොවූයේ ය. මාර්ගයෙන් සරණාගමනය ද සිද්ධ වූ බැවිනි.

ගෞතම බුද්ධ ශාසනයෙහි ප්‍රථමයෙන් තෙරුවන් සරණ ගිය උපාසකයා නම් යස කුලපුත්‍රයාගේ පියාණන් වූ සුජාත සිටුවරයා ය. යස කුලපුත්‍රයා ගිහි ගෙයි කලකිරී නිවසින් පිටත් ව ගමන් කරන අතර බරණැස ඉසිපතනයට පැමිණ බුදුරදුන් මුණ ගැසීමෙන් පසු බණ අසා සෝවාන් ව නිවන් දැක්කේ ය. එසේ ඔහු ද ආර්ය ශ්‍රාවකයකු වූ බැවින් සරණාගමනය අවශ්‍ය නොවී ය.

ඔහුගේ පියා වූ සුජාත සිටුවරයා පුත්‍රයා සොයමින් යන අතරතුර බුදු රජාණන් වහන්සේ දැක, උන් වහන්සේගෙන් බණ අසා බුදුන්, දහම්, සඟුන් සරණ ගොස් සෝවාන් ව උපාසකභාවය ප්‍රතිඥා කෙළේ ය. එබැවින් සුජාත සිටුවරයා ම ගෞතම බුදු සසුනේ ප්‍රථම තෙරුවන් සරණ ගිය නියත බෞද්ධ උපාසකයා වේ.

කලින් සෝවාන් ව සිටි යස කුලපුත්‍රයා භාග්‍යවතුන් වහන්සේ සුජාත සිටුවරයාට වදාළ ධර්මය කෙරෙහි නුවණ මෙහෙයවා උතුම් රහත් ඵලයට පත් වූයේ ය. ඉක්බිත්තෙන් බුදුන් හමුවෙහි මහණ උපසම්පදාව ලදින් තම පියා වූ සුජාත සිටුවරයාගේ ආරාධනාවෙන් පසු දෙවැනි දින බුදුරදුන් සමඟ නිවසට වැඩම කිරීමෙන් පසු උන් වහන්සේ වදාළ බණ අසා යස කුලපුත්‍රයාගේ මෑණියන් වූ සුජාතා සිටු දේවිය ද, පුරාණ භාර්යාව ද තෙරුවන් සරණ ගිය හ. ඒ දෙදෙන ගෞතම බුදු සසුනෙහි තෙරුවන් සරණ ගිය ප්‍රථම උපාසිකාවෝ ය.

තෙරුවන් සරණ යන ක්‍රමය කෙටියෙන් මෙසේ ය.

' නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ' යනුවෙන් සරණාගමනයට පෙර තුන් වරක් කියා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට නමස්කාර කළ යුතු ය. මෙහි දී විශේෂ කරුණක් සිහිපත් කිරීම වටින්නේ යැ'යි සිතමි.

මේ නමස්කාර පාඨය බ්‍රහ්මායු, සෝණදණ්ඩ බ්‍රාහ්මණාදීන් විසින් බුදුරජාණන් වහන්සේට නමස්කාර කිරීම පිණිස භාවිත කරන ලද වාක්‍යයක් මිස, එය බුද්ධ භාෂිතයක් නොවේ. මේ පාඨය පදයෙන් පදයට සාතාගිර, හේමවත ආදී යක්ෂයින් පස් දෙනකු විසින් කියන ලද්දකැ'යි බලි තොවිල් ආදිය කරන්නවුන් අතරෙහි දුර්මතයක් පවතී. එය සම්පූර්ණයෙන් ම වැරැදි මතයකි.

නමස්කාර පාඨය තුන් වරක් කියා බුදු රජාණන් වහන්සේට වැඳීමෙන් පසු තමන්ට හැකි පමණට බුදු ගුණ මෙනෙහි කරමින් සියලු ගුණයන්ගේ කෙළ පැමිණි, දෙව්මිනිසුන්ට ශාස්තෘ වූ ලොවුතුරා බුදු රජාණන් වහන්සේ අවබෝධ කර ගත් චතුරාර්‍ය සත්‍ය ධර්‍මය අවබෝධ කර ගැනීම පිණිස උන්වහන්සේ දිවි හිමියෙන් සරණ යමි, උන්වහන්සේ පිහිට කොට ගනිමි, උන්වහන්සේ හැර වෙනත් සරණක් මට නැත, මෙතැන් පටන් මම ද උන් වහන්සේ අනුගමනය කළ ප්‍රතිපදාව අනුගමනය කරමි, බුදුන් වහන්සේ සරණ යමි ' යනාදීන් බුදුන් සරණ යා යුතු ය.

තව ද ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රතිවේධ කළා වූ, නව ලොවුතුරා ශ්‍රී සද්ධර්‍මය දිවි හිමියෙන් සරණ යමි, ඒ ධර්‍මය හැර අන් සරණක් ප්‍රාර්ථනා නොකරමි. නිර්වාණාවබෝධය කොට මේ අනන්ත දුක් ඇති සංසාරයෙන් එතෙර වීම පිණිස ධර්‍මය පිහිට කොට ගනිමි යනාදීන් දහම් සරණ යා යුතු ය.

තව ද ඒ භාග්‍යවත් ලොවුතුරා බුදු රජාණන් වහන්සේ විසින් අවබෝධ කොට ගෙන ශ්‍රී මුඛයෙන් දේශනා කර වදාළ උතුම් සද්ධර්‍මය අවබෝධ කොට ගෙන ආර්ය පුද්ගල බවට පැමිණියා වූ අෂ්ටාර්ය පුද්ගල මහා සංඝ රත්නය දිවි හිමියෙන් සරණ යමි. උන් වහන්සේලා ගත් මඟ අද පටන් මම ද ගනිමි, උන්වහන්සේලා හැර අන් සරණක් නොපතමි යනාදීන් සඟ සරණ යා යුතු ය.

මේ වූ කලි තෙරුවන් සරණ යන ඉතා ම කෙටි ක්‍රමය යි. මෙහි දී විශේෂයෙන් කිව යුත්තක් නම් අවංක සිතින් ත්‍රිවිධ රත්නයේ ගුණ මෙනෙහි කරමින් මුළු සිතින් ම කරන සරණ යාමෙන් පමණක් තෙරුවන් සරණ යාම සිද්ධ වන බව මුත් මෙකල බොහෝ දෙනෙක් මෙන් බුද්ධාදී ගුණ මෙනෙහි නොකරමින් වටපිට බලමින් අවංක නොවූ සිතින් ' බුද්ධං සරණං ගච්ඡාමි ආදීන් කියන වචන මාත්‍රයෙන් පමණක් සරණාගමනය සිදු නොවන බව ය.



ගෞරව විනයාචාර්ය
ත්‍රිපිටකාචාර්ය
**හඳපාන්ගොඩ ධම්මරංසි හිමි**

# පාණදුර - ගොරකාන ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරස්ථ පුණ්‍ය භූමියේ ඉදිකෙරෙන

ගර්භය තුළට පිවිසිය හැකි චෛතිහාසික

## ගොරකාන "සීවලි මහා සෑයට" ඔබත් දයක වන්න



පින්වත් ඔබගේ පුණ්‍යාධාර "සීවලි මහා සෑය අරමුදල" නමින් දක්වා ඇති බැංකු ගිණුමකට බැර කළ හැකිය. එලෙස බැංකු ගිණුමකට ඔබේ පුණ්‍යාධාරය බැර කොට ඇති බව සනාත කිරීම පිණිස එම බැංකු ලදුපත හෝ එහි පැහැදිළි පිටපතක් සමග, ඔබේ නම, ලිපිනය සහ දුරකථන අංකය පැහැදිළි අකුරින් ලියා පහත ලිපිනයට තැපැල් කරන්න. එහි විනිවිදභාවය සඳහා පුණ්‍යානුමෝදනා පතක් තැපැල් මගින් ඔබ වෙත එවනු ලැබේ. විහාරස්ථානයට පැමිණෙන පින්වතුන් හට "සීවලි මහා සෑය අරමුදල - කායභාලයය" ට පුණ්‍යාධාර ලබාදිය හැක.

*තෙරුවන් සරණයි !*

| ගිණුමේ නම : සීවලි මහා සෑය අරමුදල | |
|---|---|
| සම්පත් බැංකුව ගිණුම<br>1151 6100 4890 | ලංකා බැංකුව ගිණුම<br>8 5 5 7 7 4 3 9 |
| මහජන බැංකුව ගිණුම<br>148-2-001-6-0038551 | සෙලාන් බැංකුව ගිණුම<br>0400-13126762-101 |

සැදැහැති දායකත්වය

සීවලි මහා සෑය අරමුදල

ආරම්භය : ශ්‍රී බු.ව. 2563 / ව්‍ය.ව. 2020

**මෙම උතුම් පුණ්‍ය ක්‍රියාවට දයකවී පින්කැමැත්තෝ කුසල් රැස්කර ගනිත්වා !!!**


### ගොරකාන - සීවලි මහා සෑයේ පාදමේ මූලික බිම් සැකසීමට දායකත්වයට ශ්‍රද්ධාවන්ත ඔබටත් ආරාධනා !

ගොරකාන - සීවලි මහා සෑයේ පාදමේ මූලික බිම් සැකසීමේ වැඩ සඳහා පමණක් වැය වන, මේ වන විට පවතින මිල ගණන් මත ඇස්තමේන්තු කළ **රු.8,000,000/- (ලක්‍ෂ අසූව)** ක මුදල වෙනුවෙන් තනි හෝ සමූහ වශයෙන් දායකත්වයක් දැරීමට කැමති සැදැහැති දනපතියන්ට, ධනපතියන්ට, ව්‍යාපාරිකයන්ට සීවලි මහා සෑය අරමුදල මෙහෙයුම් කමිටුව මෙසේ ගෞරවයෙන් ආරාධනා කරමු...

විහාරස්ථානය : **038 22 97 914**

සභාපති හිමි : **071 250 44 46**

ස්වාමින්වහන්සේ පමණක් (බොහෝවිට) පන්සලේ වැඩවසන බැවින් බැහැරට වැඩසිටින අවස්ථාවලදී දුරකථන ඇමතුම් ලබාදීමේ දී සැලකිලිමත් වීමට කාරුණික වන්න.




**විහාරස්ථානයට පැමිණෙන ගමන් මාර්ගය.**

පාණදුර පරණ පාර (මාර්ග අංක 100 හෝ 183) බස් මාර්ගයේ පැමිණ "ගොරකාන" බස් නැවතුමෙන් බැස, ගොරකාන - 'කීල්ස්' ආයතනය අසල ඇති ශ්‍රී ධම්මානන්ද මාවතෙන් හැරී විහාරස්ථානයට පැමිණෙන්න. (පැමිණමට පෙර දුරකථන මගින් ස්වාමින්වහන්සේ වැඩසිටින වෙලාවක් ලබාගන්නේ නම් ස්තූතිවන්ත වෙමු.)

**සියලු විමසීම් :** ගරු සභාපති, පූජ්‍ය ලියන්ගහවත්තේ නන්ද ස්ථවිර, සීවලි මහා සෑය අරමුදල, ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරය, ශ්‍රී ධම්මානන්ද මාවත, ගොරකාන, කෙහෙල්වත්ත 12550.





## දින 11 / 12 අසිරිමත් දඹදිව වන්දනා 230,000/-

**(අගෝස්තු සිට දෙසැම්බර් දක්වා)**

කොළඹ / දිල්ලි ගුවනින්, දුම්රියේ ගමන් නොමැත. වන්දනාව සුඛෝපභෝගී AC බසයෙනි. නවාතැන් උණු වතුර ස්නානය කිරීමට හැකි යාබද නාන කාමර සහිත සුවපහසු හෝටල් කාමරවල ශ්‍රී ලාංකීය ආහාර හා බීමට බෝතල් වතුර හා සාප්පු සවාරි.

බුද්ධගයාවේදී කිරිපිඩු පූජාව, සිල්සමාදන් වීම, සාංඝික දනය, අසිරිමත් මල් පූජාව, බෝධි පූජාව හා ජේතවනාරාමයේදී සිල්සමාදන් වීම සාංඝික දනය, ආනන්ද බෝධිය අභියස බෝධි පූජාවන්, සර්වඥ ධාතු ප්‍රදර්ශනය හා දිල්ලි කපිල වස්තු සර්වඥ ධාතු වන්දනාව.

දින 11 කින් කෙරෙන මෙම වන්දනාවට කිසිදු දුම්රිය ගමනක් නොමැතිව සංවිධානය කර ඇත. ඔබගේ බඩුබාහිරාදිය ඔබේ කාමරයේ දොරටුවටම ගෙනවිත් දෙයි. අවශ්‍ය විටෙක වෛද්‍ය පහසුකම්ද සැපයේ. පයින් ගමන් කිරීමක් නොමැත.

ඔබ වෙනුවෙන්ම කැපවූ ලෝටස් කාර්යය මණ්ඩලය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඔබව වන්දනාවක රැගෙන යයි.

වන්දනාවයි, සුවපහසුවයි, විශ්වාසයයි සමගින් ලෝටස් ආයතනය සමග වන්දනාවේ යෙදෙන්න ආසන සීමිත බැවින් නොපමාව ඔබගේ ආසනය වෙන්කර ගන්න.




**සියලුම රටවල් සඳහා ගුවන් ටිකට්පත් සහ කුඩා කණ්ඩායම් සඳහා සංචාර සංවිධානය කරදීම**



**සිංගප්පූරු / මැලේසියා සංචාරය**
**දින 07 ජූනි 06**
**360,000/-**



**තායිලන්ත / බැංකොක් සංචාරය**
**දින 05 ජූලි**
**280,000/-**



**ඩුබායි සංචාරය**
**දින 05**
**මැයි 05**
**295,000/-**

## නුගේගොඩ ලෝටස් සංචාරකයෝ (පුද්.) සමාගම

**16, දේවාල පාර, පාගොඩ, නුගේගොඩ.**

දුර : 0112822076 / 0112818250 / 0714870757 / 0713366250 ෆැක්ස් : 0112818250

E-mail : lotustourssrilanka@gmail.com web : www.lotustourssrilanka.com

**ආදරය,ප්‍රේමය, ක්‍රෝධය, වෛරය වැනි හැඟීම් මිනිසාට මෙන්ම තිරිසනාටත් ඇත. නමුත් මිනිසාගේ හැඟීම් ආත්ම දමනය, ආත්ම ගෞරවය, ශීලාචාරකම, භය හා ලජ්ජාව වැනි උතුම් ගුණධර්මයන් තුළින් කිසියම් පාලනයකට යටත්ව ඇත.**

මිනිසා ආලයෙන් අන්ධව ,ක්‍රෝධයෙන්, වියරු වැටී හොඳ - නරක පිළිබඳ හැඟීමකින් තොරව කටයුතු කළහොත් මිනිසාත් තිරිසනාත් අතර වෙනසක් දැක ගත නොහැකි ය.

# තරග කළ යුතු අනුන් සමඟ නොව තමන් සමඟ යි

නිමල් ඉගෙන ගන්නේ පස්වන පන්තියේ ය. නිමල්ගේ අම්මයි - තාත්තයි දෙදෙනා ම රැකියාවට යනවා. පාන්දරින් ම පිටත්වන ඔවුන් ගෙදර එන්නේ රෑ බෝවුනාට පසුවයි. නිමල් පාසලෙන් පසුව අමතර පන්තිවලටත් සහභාගි වී ගෙදර ඇවිත් නින්දට වැටෙනවා. මේ තුන් දෙනාම කතාබහට එක්වන්නේ රාත්‍රි කෑම වෙලාවටයි. මේ අය මොනවද කතා කරන්නෙ, ගෙදර අඩුපාඩු ගැන ද? පවුලේ දියුණුව ගැන ද? නිමල්ගේ අධ්‍යාපන කටයුතු ගැනද? නැහැ. මේව ගැන නොවෙයි කතා කරන්නේ, අහල පහළ අයගේ ගෙවල් දොරවල්, ඉඩකඩම්, යානවාහන, අනුන්ගේ ඇඳුම්, පැළඳුම් , අසල්වැසි දරුවන් ඉගෙන ගන්න හැටි මේවා ගැනමයි ඔවුන් කතා බහ කළේ.

මේ අයගේ නිවෙස අසලම ඉඩමක් මිලදී ගත් අය අලුතෙන් නිවෙසක් ඉදිකරන්නට පටන් අරගෙන. නිමල්ගෙ අම්මට හරිම ගැටලුවක්. අල්ලපු ගෙදර අයටත් මේ ගැන කියනවා.

බලන්නකෝ අර ඉඩමේ හදන්නට යන්නෙ තට්ටු තුනේ ගෙයක්ලු. ඔය තරම් විශාල ගෙවල් මොනවට ද?. මම හිතුවේ මේ පළාතෙ තියෙන විශාලම ගෙදර අපේ කියලයි. දැන් ඉතින් ඒ අයගේ ආඩම්බරකම් බලන්න තමයි අපට වෙන්නේ. ඇය ඊර්ෂ්‍යා සහගත සිතින් කියවනවා.

මේ ප්‍රකාශ දෙස බලන්න. තමන්ගේ නිවෙසට වඩා විශාල ගෙයක් අහල පහළ අය හදනවට සමහරු අකැමැතියි. ගෙයක් පමණක් නොවෙයි. ළඟපාත කෙනෙක් තමන්ගේ වාහනයට වඩා වටිනා වාහනයක් ගන්නවා නම් එයටත් අකැමැතියි. වටිනා ඇඳුම් පැළඳුම් පරිහරණය කරනවා නම්, එයත් ප්‍රශ්නයක්. අසල්වැසි නිවෙසේ ළමයා තමන්ගේ දරුවා යන පාසලට වඩා උසස් පාසලකට යනවා නම් තරහ සිත් ඇතිකර ගන්නවා. හොඳින් ඉගෙන ගන්නවා නම් වපර ඇහින් බලනවා. මොනවා හෝ ඇදක් පලුද්දක් හොයනවා.

මේ අයුරින් අනුන් දෙස බලා ඊර්ෂ්‍යා කිරීම, ක්‍රෝධ කිරීම, දොස් කීම, අඩුපාඩු පෙන්වීම යහපත් දෙයක් ද? එහි ප්‍රතිඵලය කුමක් වේ ද? මෙවැනි පුද්ගලයින් කායික හා මානසික රෝගීන් වනු ඇත. මානසික වේදනාවට අසහනයට පත්වනු ඇත. තමන්ගේ විවේචනයට, ඊර්ෂ්‍යාවට ලක් වන පුද්ගලයාට කිසිදු ප්‍රශ්නයක් ඇති නොවනු ඇත.

ඔහු තම කාර්යයන් හොඳින් කරගෙන යයි. කොපමණ ඊර්ෂ්‍යා කළත් අසල්වැසි නිවෙසේ ළමයා ඉගෙන ගනියි. එම හැකියාව අඩුවන්නේ නැත. වැරැදි චින්තනයේ ප්‍රතිඵලය භුක්ති විඳින්නට සිදු වන්නේ ඊර්ෂ්‍යා කළ පුද්ගලයාට ම ය.

වර්තමාන සමාජයේ අපගේ බොහෝ කාර්යයන් මහා තරගකාරි ස්වභාවයක් ගෙන ඇත. හරියට යුද්ධයක් වගෙයි. බොහෝ දෙනා උත්සාහ ගන්නේ අනිත් අයට වඩා ඉහළින් සිටීමට යි. මේ තරගය තුළ වර්ධනය වන්නේ ඊර්ෂ්‍යාව, ක්‍රෝධය වෛරය පළිගැනීම බව ඉතා පැහැදිලියි. තරගයක් නැතිව අපට අවශ්‍ය දෑ ඉටුකර ගත නොහැකි ද? සිතා බලන්න. අනෙක් අයගේ නිවෙස්වලට වඩා පෙනුම ඇති ගෙයක් හදනවාට වඩා අප කළ යුතු වන්නේ පවුලට ප්‍රමාණවත් පහසුකම් ඇති කරදරයක් නැතිව ජීවත් විය හැකි, පහසුවෙන් නඩත්තු කළ හැකි නිවෙසක් සාදා ගැනීමයි. එය ලස්සන නිර්මාණයක් වීම වරදක් නොවේ. අනෙක් අය පරදවන්නට රටට ණය වී ගෙයක් සෑදීම නිසා පසුවට මොනතරම් ප්‍රශ්න, කරදර ගොඩකට මැදිවෙන්නට වනවා දැයි සිතා බලන්න. මේ තරගය නැති කරන්නේ අපගේ සැනසීමයි.

ජීවිතයේ මූලිකම පරමාර්ථය විය යුත්තේ සතුටින් ජීවත්වීමයි. ඒ සතුට තුළ සාධාරණය, අවංක බව තිබිය යුතු ය. සමහර අය සතුටින් සිටින බව පෙන්නුම් කළත් හදවතින් හඬා වැළපෙයි. අනුන්ට වඩා ඉහළින් ඉන්නට උත්සාහ කළත් ඒ පසුපස ඇත්තේ මහා ණය බරකි.

ප්‍රමාණවත් ආදායමක් නොමැති ව ගත් ණය ගෙවීමේ දී අප මොනතරම් ප්‍රශ්නවලට මුහුණ දිය යුතු ද? එදිනෙදා අත්‍යවශ්‍ය දෑ සපුරා ගැනීමට නොහැකිව මොනතරම් පීඩනයකට පත් වෙනවා ද? වාහනයක් අවශ්‍ය වන්නට පුළුවන. එය තම අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් වනු මිස ප්‍රදර්ශන භාණ්ඩයක් නොවිය යුතු ය.

අප මේ යන්නේ අතෘප්තිකර ගමනකි. බලාපොරොත්තු ඉටු කර ගැනීමෙන් සතුටක් ලැබීම අරමුණයි. එය ඉටු වුව ද ටික දවසකින් ඒ සතුට පලා යයි. අනුන් පරයා යන තරගය තුළින් කිසිදාක බලාපොරොත්තු වන සතුට නොලැබෙයි. එය හරියට ජලය සොයා ගෙන මිරිඟුව පසුපස යන මුවාට සිදු වන ඉරණම හා සමාන ය.

අද ලෝකය කටයුතු කරන්නේ අනුසෝතගාමී ක්‍රමයටයි. ගඟ ගලා බසින්නේ පහළට. එය උඩු අතට ගලා යන්නේ නැහැ. අප සිතන්නේත්, ලෝකයා කටයුතු කරන්නේත් ස්වභාවිකව පහළට ගලා යන වතුර මෙනි. මෙය සිතේ සාමාන්‍ය ස්වභාවයයි. ලස්සන රූපයක් දුටුවොත් ඒ දෙස නැවත බලන්නට අප බොහෝ කැමැතියි. මිහිරි හඬට කැමැතියි. ආකර්ෂණීය සුවඳට කැමැතියි. ශරීරයට සුව දෙන වින්දනයට කැමැතියි. ඒවාගේම එකිනෙකාගේ ඕපාදූප අහන්නට කැමැතියි.

මේ සෑම දෙයකින් ම අප යම් තෘප්තියක්, සතුටක් ලබනවා. එය අනුසෝතගාමී ක්‍රමයයි. පටිසෝතගාමී යනු මේ සතුට ලබන ක්‍රමයට විරුද්ධව ක්‍රියාත්මක වීමයි. අනුසෝතගාමී ක්‍රමයෙන් ආශාව, රාගය, තරහ, ක්‍රෝධය, වෛරය, ඊර්ෂ්‍යාව වර්ධනය වෙනවා. අනුසෝතගාමී ක්‍රමයෙන් නිදහස් වන්නට උත්සාහ කරන්න. සතුරාට වුව ද කරුණාව, දක්වන්න. අන්‍යයන් තමන්ට වෛර කරන්නේ, ඊර්ෂ්‍යා කරන්නේ මෙහි විපාකය පිළිබඳ ඔවුන් තුළ ඇති අනවබෝධය නිසා ය. එනම් අවිද්‍යාව නිසා ය. නින්දා අපහාස ගැන සිත සිතා ඔවුන් විවේචනය කරන්නට සූදානම් වන්න එපා. ඒ තුළින් සිත තුළ ද වෛරය වැඩෙනු ඇත. එය දුක්ඛදායක බව,වේදනාත්මක බව තේරුම් ගන්න.

වෛර කරන්නා රෝගියකු ලෙස සිතන්න. රෝගියකු සුවපත් කිරීමේ අදහසින් ඔහු දෙස බලන්න පුරුදුවන්න. කාරුණික සිතින් සුවතාවකට මඟ පෙන්විය හැකි නම් තමන් ගුණවන්තයෙකි.


තමන්ගේත් අනුන්ගේත් සතුට, සොම්නස සුරැකීම සමාජයට සැනසිල්ලකි. ජීවිතයේ සතුටට හා දුකට මුල් වන්නේ සිතයි. හිමිදිරි උදයේත්,රාත්‍රි නින්දට යන්නට පෙරත් තමන්ගේ සිත දෙස බලන්නට මොහොතක් වෙන් කර ගන්න.

ගෙවුණු දිනයේ නරක සිතිවිලි, වෛරී අදහස් මතුවූ අවස්ථා විමසන්න. පාලනයකින් තොරව වචනයෙන්, හැසිරීමෙන් ඒවා ක්‍රියාවට නැඟුණු සැටි දකින්නට උත්සාහ ගන්න.

ඉන් ඇතිවූ අවැඩදායක ප්‍රතිඵල ගැන සිතන්න. උදාවූ දවස, හෙට දවස මෙබඳු දුක්ඛදායක සිතිවිලිවලින් ඉවත් ව කටයුතු කරන්නට අධිෂ්ඨාන කර ගන්න.



> “වෛර කරන්නා රෝගියකු ලෙස සිතන්න. රෝගියකු සුවපත් කිරීමේ අදහසින් ඔහු දෙස බලන්න පුරුදුවන්න. කාරුණික සිතින් සුවතාවකට මඟ පෙන්විය හැකි නම් තමන් ගුණවන්තයෙකි.”



බළංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහ නා හිමි**

## අනුකම්පාවෙන් දයාවෙන් හා මෛත්‍රී සිතින් ලෝකය දෙස බලන්න

# දිවියෙන් වසරක් අඩුවන දවසේ දුක සැප සම කොට විඳගමු එක සේ

**දින සති මාස නික්ම ගොස් නව අලුත් අවුරුද්දක් උදවන විට සියලු දෙනාගේ හදවත් තුළ ඇති වන්නේ නැවුම් සුවඳින් සුවඳවත් වූ අලුත් සිතිවිලි ය.**

පරණ අවුරුද්ද ගෙවී අලුත් අවුරුද්ද උදාවීමේ දී ජන සමාජයේ සියලු දෙනාම කාර්යශීලීව හා හැඟීම්බරව කටයුතු කිරීම සිරිතකි. එහෙත් මෙහිදී ජීවිතය දෙස දෙනෙත් යොමු කළ යුත්තේ, යථාවබෝධයෙන් යුතුවයි. අලුත් අවුරුද්දක් උදා වී යැයි කියන්නේ වසරකින් මරණයට සමීප වූ බවයි.

ලොව වසන දුප්පත්, පොහොසත්, ලස්සන, අවලස්සන, උගත්, නූගත් සියලු දෙනාම දිරාපත් වී අබලන් වී අවලස්සන වී විනාශ වී යන බව "සබ්බේ සත්තා මරිස්සන්ති" යන බුදු වදනින් වැඩිදුරටත් සනාථ කරයි.

එහෙත් ධන කාමයෙන්, බල කාමයෙන්, යස කාමයෙන් වියරු වැටුණු මිනිස්සු මේ බව අවබෝධ කර නොගෙන රට රාජ්‍ය අල්ලන්නට තව තවත් ග්‍රහලෝක සියතට ගන්නට තැත් දරන්නේත්, ඒ සඳහා ගිනි අවි නිෂ්පාදනය කරන්නේත් දිනකට දහස් ගණන් කෝටි ගණන් මිනිසුන් හාමතේ මිය යනවා දැක දැක නොවේ ද? මේ ගැන මොහොතකට සිතන්නට සිත් පිත් නැතත්, අසන්නට කන් නැත්තේ, දැනෙන්නට හදවත් නැත්තේ හද කුටි තුළින් ධර්මය දුරස් වූ බැවිනි. ඈත් වූ බැවිනි. එම නිසා වසරක් ගෙවී අලුත් වසරක් උදාවන මේ අනගි මොහොතේ නිර්මල පවිත්‍ර පහන් සිතිවිලි හදවතට නඟා ගත යුතු ය.

මේ මොහොතේ කාමයෙන්, රාගයෙන් මත්ව, ක්‍රෝධයෙන්, වෛරයෙන්, ද්වේශයෙන් දූෂිතව, මානයෙන්, උඩඟුකමින්, මෝඩකමින් මුළා වූ සියලු දෙනාගේ ම හදවත් දහම් අමා වැස්සෙන් සිසිල් කොට මුළු මහත් සමාජයට ම සාමයත්, සැනසිල්ලත් සතුටත් උදාකර ගැනීමට ක්‍රියා කරන්නේ නම් මිනිසාට සේවය කරන්නට උපන් මිනිසාගෙන් මේ බිහිසුණු සමයේ මිනිසාට ම සිදුවූ අති උදාරතර සේවය වනවාට සැක නැත.

තණ්හාවෙන්, ආශාවෙන්, ඇලී ගැලී පැටලී වාසය කරන ලෝකයා නිරතුරුවම ඇවිළෙමින්, දැවෙමින් සිටින්නේ ය. ගෙයක් ගිනිගෙන ගිනි දැල් බුර බුරා නඟිද්දීත් මොන සිනාද? මොන කෙළිකවටකම්ද? උත්සව ද? මොන ප්‍රීතියක් ද? ලෝකයේ නන් දෙසින් ඇසෙන්නේ දුකෙහි, අසහනයෙහි, වේදනාවෙහි කනස්සල්ලෙහි භීතියේ ගිනිදැල් පිළිබඳ ශෝකයේ කතාන්දරයයි. ලෝ වැස්සා නිරතුරුව ම දැවෙන රාගාදී එකළොස් ගින්නක් පිළිබඳ බුදු දහමේ සඳහන්ව ඇත.

"පාණාතිපාතා පටිවරතො හොති - ලජ්ජ දයාපනෙනා සබ්බ භූතානු කම්පි" සෑම සත්වයකුට ම ජීවත්වීමේ අයිතිය ඇත. සියලු සතුන් කෙරෙහි අනුකම්පාවෙන්, දයාවෙන්, පරපණ නැසීමෙන් වැළකුණේ වෙයි යනු එහි අදහසයි. අද ලොව උපන් සතුන්ට හෙට ජීවත්වීමේ අයිතිය නැති කරන තරමටම මිනිසා මිනිසාට කෲර වී ඇත. එයට හේතුව මිනිසා අද ආධ්‍යාත්මික ගුණ වගාවෙන් පුරන් වී ගොස් ඇති බැවිනි. ප්‍රාණියකුට හිංසා පීඩා කිරීම අයුක්තියක්, අසාධාරණයක් කිරීම බලවත් වූ පාප කර්මයකි. එබැවින් හිංසාවත්, ඝාතනයත් වහා වහා නතර කොට මුළු මහත් ලොවම සාමයෙන් සමාදානයෙන් බැඳී දයා, කරුණා පරවශව ජීවත් වන්නට අදිටන් කරගත යුතු ය.

විශේෂයෙන් මව්පිය, සහෝදර සහෝදරියන්, වැඩිහිටි සෑම දෙනා අතර, අන්‍යෝන්‍ය සම්බන්ධතාව, දයාව වෙනදාට වඩා ගොඩනඟා ගත යුතු ය. ගේදොර වතුපිටි ඉඩකඩම් පවිත්‍ර කරන්නා සේ තම තමන්ගේ සිත්සතන් පිරිසුදු කරගෙන පිදිය යුත්තාට පිදීමට, ගරු කළ යුත්තාට ගරු කිරීමට උත්සාහවත් විය යුතු ය. බුලත් අතක් දී වැඩිහිටියන් නැමඳ කමා කරවා ගත යුතු අතර, තම තමන්ගේ ආගම ධර්මය අනුව සංවරව, එකමුතුව, සතුටින් ක්‍රියා කරන්නට ද දැඩි අදිටන් තබා ගත යුතු ය. එසේම මත්පැන්, සුරාව, දුරාචාරය වහාම නතර කොට ගෙදර අඹු සැමි දූ දරු මව්පිය හා සෙසු අය අතර සෙනෙහස සතුට ප්‍රීතිය ඇතිවන අයුරින් දිවි පැවැත්ම සකසා ගන්නේ නම් මේ නර ලොව දිව්‍ය පුරයක් වනවාට සැකයක් නැත.

එමෙන්ම මේ සිංහල දේශයේ පෙර සිට අලුත් අවුරුදු සමයේ පවත්වන පංච දැමීම, වළ කජු ගැසීම, ඔංචිලි පැදීම, කඹ ඇදීම, රබන් ගැසීම ආදී වශයෙන් ඇති නොයෙක් ක්‍රීඩාවන්ට පණ දී ඒ තුළින් අවකංවම සතුටු විය යුතු ය. ගම්පුරා, දනව්පුරා උත්සව ක්‍රීඩා ආගමික ස්වරූපයෙන් පවත්වන්නේ නම් කාටත් සතුටු විය හැකි අතර, ගම්බිම් තුළත් ජාතීන් අතර ආදරය, කරුණාව, සෙනෙහස, බැඳීම ද වැඩිදියුණු වනවාට සැක නැත. එම නිසා මේ අලුත් අවුරුදු සමයේ පැරැණි චාරිත්‍ර විධි අනුගමනය කරමින් සියලු දෙනාට ම සතුටු විය හැකි පරිදි ඉසිකෝ මද මානාදියෙන් තොරව, හැදෙන වැඩෙන බාල පරපුරටත් ආදර්ශයක් වන ලෙස ක්‍රියා කරන්නට සියල්ලෝ ම උත්සාහ ගනිත්වා.

තෙල්ලඹුර ශ්‍රී පුෂ්පාරාම විහාරාධිපති
උඩුමලගල ශ්‍රී ආදිච්චවංස පරිවේණාධිපති
යක්කලමුල්ල ශාසනාරක්ෂක බලමණ්ඩලයේ
ලේඛකාධිකාරී කීර්ති ශ්‍රී ශාස්ත්‍රපති
**පලල්ලේ සරණජෝති හිමි**



# දාසියකගේ මෙත් සිත

උරුවෙල් දනව්වෙහි ගයා ප්‍රදේශයේ බමුණු නිවසක එක්තරා දාසියක් වාසය කළා ය. බමුණාගේ ලේලිය එම දාසිය කෙරෙහි කිසිදු අනුකම්පාවක් නො දැක්වුවා ය. නැති වරද පවා ඇති කරගෙන එම දාසියගේ කෙස් වැටියෙන් අල්ලාගෙන නිතර පහර දුන්නා ය. එම තාඩන පීඩන ඉවසිය නොහැකි වූ දාසිය සිය කෙස් වැටිය කප්පවා දැමුවා ය. එයින් එම කාන්තාව දාසිය කෙරෙහි තවත් කිපුණා ය. එතැන් පටන් දාසියගේ ගෙලෙහි රැහැන් පටක් බැඳ එයින් අල්ලාගෙන පහර දෙන්නට පටන් ගත්තා ය. දාසියගේ ගෙලෙහි මාලයක් මෙන් රජ්ජුවක් බැඳ තිබුණ නිසා ඕ එතැන් පටන් රජ්ජුමාලා නමින් ප්‍රසිද්ධ විය. මෙම හේතුව නිසා ඇය මානසිකව ද දැඩිව පීඩා වින්ඳා ය.

ජීවිතය පවා එපා විය. දිනක් දිය ගෙන එන්නට යන්නා සේ ලණුවක් ද රැගෙන නිවසින් නික්ම, අසල වූ වන රොදට ගියා ය. ලණුව ගසක අත්තක බැඳ ගෙල වැළලාගෙන සියදිවි නසා ගැනීමට සූදානම් වූවා ය.

"රජ්ජුමාලා දුවණියනි, දිවි හානි කර නොගන්න මාවෙතට එන්නැ" යි, කියනු ඇසිණි.

පුදුමයකි, මේ තරම් මිහිරි වදනින් කථා කරන්නේ කවුදැයි රජ්ජුමාලා වටපිට බැලුවා ය. අමුත්තකු ඒ අසල ගසක් මුල හිඳිනු ඕ දුටුවා ය. එම අමුත්තා නම් ඇය කෙරෙහි අනුකම්පාවෙන් එහි වැඩම කොට සිටි බුදුරජාණන් වහන්සේ ය. ඕ ගෞරවාදර පෙර දැරිව උන්වහන්සේ වෙත එළැඹ වැඳ එකත් පසෙක හිඳ ගත්තා ය. බුදුන් දෙසූ දහම් අසා ඕ සෝවාන් වූවා ය.

රජ්ජුමාලාව තුළ මෛත්‍රී සහගත අදහස් පහළ වී ගියේ ය. තමාට තැළුම් පෙළුම් කළ ස්වාමි දුවට ද ඕ මෛත්‍රී කරන්නට වූවා ය. රජ්ජුමාලා කළයට පැන් පුරවා ගෙන නිවස බලා පිටත් වූවා ය. නිවසට පැමිණි ඇයගේ මුහුණ වෙනදා මෙන් නොව ඉතා ප්‍රසන්න ය. නිවසෙහි වැඩ පළ ද කඩිසරව කැමැත්තෙන් ම කරන්නට පටන් ගත්තා ය. ගෙදර ප්‍රධාන බමුණා එය දැක එබඳු වෙනසක් ඇති වීමට හේතුව ඇයගෙන් විචාළේ ය.

ස්වාමීනි, මම බුදුපියාණන් සරණ ගියෙමි. මින්පසු මට තැළුවත්, මා මැරුවත් මාගේ හිතේ කිසිදු අමනාපයක් උපදවා නො ගනිමි. මෛත්‍රී කරමි. මගෙන් සිදුවූ වරදක් ඇතොත් සමාව දෙනු මැනවැයි රජ්ජුමාලා කියා සිටියා ය. බමුණා ඇය කෙරෙහි පැහැදී ඉන් පසුව රජ්ජුමාලාට තලා පෙළා වැඩ නොගන්නා ලෙස තම බිරිඳට දැන්වීය. බමුණා රජ්ජුමාලාගෙන් බුදුරදුන්ගේ ගුණ අසා උන්වහන්සේ සිය නිවසට වැඩම කරවාගෙන දන් පිරිනැමීය. බුදුරජාණන් වහන්සේ දන් වළඳා දෙසූ දහම් අසා රජ්ජුමාලා ගැන සිතින්වත් අමනාපයක් උපදවා නො ගත්තා ය. බමුණා රජ්ජුමාලාව දාසි භාවයෙන් මුදවා දූ තනතුරෙහි තබා ගත්තා ය.



දොරණුව ශ්‍රී රේවත සෝමානන්ද මූලික
පිරිවෙනේ කෘත්‍යාධිකාරී ශාස්ත්‍රවේදී
**පොත්තෙකන්දේ ඤාණාවාස හිමි**

**කලණ මිතුරා කිසි විටෙක අයහපතට සහය නොවේ**

# දඬබ්බර ගතිය බොදු පිළිවෙත නොවේ



මහනුවර අස්ගිරි මහා විහාරයේ කාරක සංඝසභික හා උපාධ්‍යාය ධුරන්ධර වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක මහාචාර්ය
**තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**

**අද අප ජීවත්වන සමාජය දෙස පුළුල් ලෙස බලනවිට පැහැදිලි වන කරුණක් වන්නේ සමාජයේ සෑම තරාතිරමකම ජන කොටස් අතිශය අසංවර වී ඇති බව. මෙය වඩාත් පැහැදිලි වන්නේ දැනට වසර 40කට පමණ පෙර මේ මිනිස් සමාජය පිළිබඳ අත්දැකීම් ඇති වැඩිහිටි වයසේ ජීවත්වන උදවියට යි.**

අද සමාජයේ මිනිසුන් භාවිත කරන වචන, ඔවුන් විසින් ශාරීරික වශයෙන් පවත්වන ක්‍රියාකාරකම් පමණක් නොව ඒ සඳහා කය, වචනය යොමු කරවන මානසික තත්වයන් දෙස බලනවිට මෙය කැපී පෙනෙන ස්වභාවයක් පෙන්වනවා. මෙහි දී ජනතාව එක්රැස්වන උත්සව, සම්භාෂණ, සංග්‍රහ පමණක් නොව ආගමික වශයෙන් යෙදෙන චාරිකාවල දී පවා කායික. වාචසික හා මානසික වශයෙන් බොහෝ අසංවර තත්වයන් අපට අත්විඳින්නට හැකියාව තිබෙනවා.

මෙයට ධර්මානුකූලව යෙදෙන වචනය ලෙස දක්වා ඇත්තේ ප්‍රගල්භ යන්න හෙවත් ප්‍රගල්භභාවය යි. මේ ප්‍රගල්භ්‍ය බව හරිම අහිතකර තත්වයක්. එහෙම නම් ප්‍රගල්භ බවෙන් මිදීමේ වටිනාකම කරණීයමෙත්ත සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේට පෙන්වා දෙනවා. සසර දුක් කෙළවර කොට ඉක්මන් නිවන් සුවය අරමුණු කොට පිළිවෙත් පිරීමේ නිරත භික්ෂුව තුළ වඩා වර්ධනය කර ගතයුතු ගුණයන් අතර තවත් එක් ගුණයක් ලෙස බුදුරජාණන් වහන්සේ මේ අප්‍රගල්භ බවෙහි වටිනාකම පෙන්වා දී තිබෙනවා. භික්ෂූන් වහන්සේ අරමුණු කොට මේ දේශනාව පැවැත්වුවත් ගිහි සමාජයේ මනා පැවැත්මට ද මෙම අප්‍රගල්භභාවය හේතු වන බව අමුතුවෙන් කිව යුත්තක් නොවේ.

විශේෂයෙන් ප්‍රගල්භ බව යන්නේ සරල අරුත ගත්තොත් එයින් කියැවෙන්නේ කායික, වාචසික හා මානසික යන තුන් දොරෙහිම ඇති කර ගන්නා දඬබ්බර හෙවත් නොහික්මුණු බවයි. එනයින් පැවැත්විය යුතු සංවරය කියා අප්පගබ්බ යන්නෙන් අදහස් වෙනවා. ඒ කියන තිදොරින් අසංවර වී අයෝග්‍ය අශීලාචාර ගති පැවතුම් බහුලව, ක්‍රියා කරන යම් අයෙක් වේ නම් ඔහු ප්‍රගල්භ බවෙන් යුක්තයි.

භික්ෂූන් වහන්සේ සම්බන්ධයෙන් මේ ප්‍රගල්භ බව පිළිබඳ සලකා බැලීමේ දී භික්ෂූන් වහන්සේ එක්රැස්වන ස්ථානවල එනම් දානශාලාව, ගිනිහල්ගෙය, නාන ස්ථනය, පිඬු පිණිස සැරිසරන මාර්ගය, ගම තුළ යන මෙවැනි පොදු ස්ථානවල නොසරුප් ලෙස, නොහොබිනා ලෙස හැසිරීම කාය වශයෙන් සිදු වන ප්‍රගල්භ බවයි.

ඒ කියන සියලු ස්ථානවල නොසරුප්, නොහොබිනා වදන් භාවිත කරමින් අමනෝඥ ලෙස කරන අල්ලාප සල්ලාප වචී හෙවත් වාග් ප්‍රගල්භභාවය යි. ඒ වගේම තමා ඒ කියන තැන්වලදීත් නිරන්තරයෙනුත් කාම සිතිවිලි උද්දීපනය වන අයුරිනුත් සමහර විට යම් යම් පුද්ගලයන් සමාජ කණ්ඩායම් හෝ භික්ෂූන් වහන්සේ වෙත තරහ වෛරය කෝපය කුළු ගැන්වෙන ආකාරයෙන් සිතිවිලි ජනිතවන තත්වයෙන් ක්‍රියා කිරීමත් මේ කියන මනෝ ප්‍රගල්භභාවයෙන් අදහස් කෙරෙනවා.

මේ කියන සියලු තත්වයන් ගිහි පැවිදි වෙනසක් නොදැක සලකා බැලීමේ වැදගත්කමක් තිබෙනවා.

අද අප සමාජයේ ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේ වෙතින් මේ කියන තෙවැදෑරුම් ප්‍රාගල්භ්‍යභාවය මේ රටේ ජනතාව විසින් නිරන්තරයෙන් ජනමාධ්‍ය තුළින් අත්විඳින තත්වයක් ලෙස දක්වන්නට හැකියි.ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේ කිසිදු ප්‍රමිතියක් නැති වෛවර්ණ සිවුරු දරාගෙන, මනා පෙරවීමේ ක්‍රමයක් ද නොමැතිව, නොදැමුණු නොහික්මුණු බව හුවා දක්වමින් ස්වකීය අවිනීත පැවතුම් මුළු මහත් ලෝකය හමුවේ කියා පාමින් දරා ගත් සිවුර පවා ගිලිහී ගොස් වැටෙන තුරු සිහියෙන් තොරව එම අරහත් ධජය ලෙස බුහුමන් ලබන චීවරයට නිගා කරමින් මහමඟ දමා, රුදුරු ගති පෙන්වමින් ක්‍රියා කළ අයුරු මෑත අතීතයෙන් අපට නිදසුන් දෙනවා.

> **“ අල්පමාත්‍ර දැනුම හුවා දක්වමින් ශ්‍රැත මදයෙන් මෙන් ම යෞවන මදයෙන්, පරිවාර මදයෙන් උන්මත්තකව අයුතු අසාධාරණ ලාභ ප්‍රයෝජන කීර්ති ප්‍රසංශාවන්ගෙන් මත් වී, තමන් උසස් කොට, අනුන් පහත් කොට වහසි බස් දෙඩමින්, අත්පා වනමින්, දික් කරවමින් තමා විසින් මවාගත් ගාම්භීර බවක් පෙන්වමින්, මහහඬින් දෙස් දෙවොල් තියමින්, නිගරු ලෙස මහ මඟ දුවන දසුන් දෙස බලා සිටින කවරකුගේ වුවත් මනස සසල කරවන්නේ නොවේ ද? ”**

එපමණක් නොව මනා බණදහම් දැනුමෙන් හා නිසි ආචාර්ය උපාධ්‍යාය ඇසුරකින් තොරව ඔහේ මසින් පෙනුමෙන් හැදෙමින් වැඩෙමින් කය සරුව පෙනුණත් ගුණධර්මවලින් හීනව විශ්වවිද්‍යාල වැනි උසස් අධ්‍යාපන ආයතනයකට වුව ද ඇතුළත් වී ලද අල්පමාත්‍ර දැනුම හුවා දක්වමින් ශ්‍රැත මදයෙන් මෙන් ම යෞවන මදයෙන්, පරිවාර මදයෙන් උන්මත්තකව අයුතු අසාධාරණ ලාභ ප්‍රයෝජන කීර්ති ප්‍රසංශාවන්ගෙන් මත් වී, තමන් උසස් කොට, අනුන් පහත් කොට වහසි බස් දොඩමින්, අත්පා වනමින්, දික් කරවමින් තමා විසින් මවාගත් ගාම්භීර බවක් පෙන්වමින්, මහහඬින් දෙස් දෙවොල් තියමින්, නිගරු ලෙස මහ මඟ දුවමින්, තෙරපෙමින් ක්‍රියා කරන දසුන් දෙස බලා සිටින කවරකුගේ වුවත් මනස සසල කරවන්නේ නොවේ ද?

මේ පිරිස් කායික, වාචසික හා මානසික වශයෙන් ප්‍රගල්භ වූවන් ලෙසයි සැලකෙන්නේ.

මෙවැනි භික්ෂූන් විවිධ මතවාද ඔස්සේ සිත් මෙහෙයවා ක්‍රියා කිරීමෙන් මානසික වශයෙනුත් දැඩි ලෙස ප්‍රගල්භ වී උමතු වූවන් මෙන් හිරි ඔතප් බිඳ හෙළමින් ප්‍රසිද්ධ මංමාවත්, පිට්ටනි ගානේ දුවන්නේ ඒ නිසයි. මේ කියවුණු ත්‍රිවිධාකාර ප්‍රගල්භයන්ගෙන් තොර වූ භික්ෂුව අප්පගබ්භ ලෙස සැලකෙනවා.

විශේෂයෙන් භික්ෂු ජීවිතය ගත්විට උන්වහන්සේ අයත් වන්නේ විශේෂ සමාජ සංස්ථාවකට යි. උන්වහන්සේ විසින් පවත්වනු ලබන සියලු ඉරියව් සම්බන්ධයෙන් වුවත් ඇත්තේ විශේෂ වූ ව්‍යවහාර රටාවකි.

උන්වහන්සේ දන් වළඳනවා කියන කොට ගිහි උදවිය සම්බන්ධයෙන් ව්‍යවහාර වන්නේ ආහාර ගන්නවා/කෑම කනවා කියලයි. මෙම ව්‍යවහාරයේ වගේ ඊට අදාළ චර්යාවේ ද ගිහි පැවිදි වශයෙන් පැහැදිලි වෙනසක් තිබෙනවා.පැවිදි භික්ෂුව ආහාර වළඳන්නේ ඊට අනුගත විධිමත් විනයානුකූල රාමුවක් තුළයි. ගිහි පක්ෂ යට වුවත් එවැනි ආචාර ධර්ම තිබුණත් එය එතරම් මහජනතාවට ගැටලුවක් වන්නේ නැහැ, මේ ආකාරයෙන් පිළිවෙළින් නිදනවා- සැතපෙනවා, කියනවා- දේශනා කරනවා, යනවා,- වඩිනවා, හිඳිනවා- වැඩඉන්නවා ආදි යෙදුම් කීපයක් වුවත් ගෙන බලනවිට එහි වෙනස අපූරුවට වැටහෙනවා.

මෙයින් ප්‍රකාශ වන්නේ භික්ෂූන් වහන්සේගේ සෑම ඉරියව්වක් ම ගිහි සමාජයට වඩා වෙනස් ආකාරයකින් උසස් ගරුබුහුමන් ලැබිය යුතු ආකාරයෙන් පවත්වා ගතයුතු වන බවයි.

එහෙම නම් භික්ෂූන් වහන්සේ තම සංඝ සංවිධානය තුළ ක්‍රියා කළ යුතු වන්නේ ඊට වෙන් වූ රාමුවක් තුළ යි. එසේ නොමැතිව උන්වහන්සේ ස්ව මතයට ඉරියව් පවත්වනවා නම් එය ශාසනවිරෝධි වුවක් වෙනවා මෙන් ම එම විධිමත්ව පෙළ ගැසුණු සංඝ සංවිධානයට තමා නො ගැලපෙන, නුසුදුසු අයකු බවට පත් වන බවයි.

මේ නිසා භික්ෂුව තමන් අයත් සංවිධාන රාමුව තුළ ක්‍රියා කරනවා නම් පමණක් උන්වහන්සේ ප්‍රගල්භ වූ අයෙක් වන්නේ නැහැ. එයින් පිට පැන්නොත් උන්වහන්සේ අප්පගබ්බෝ යන මේ ශ්‍රේෂ්ඨ පැවැත්මට පිටුපා ක්‍රියා කරන හුදු භික්ෂු ප්‍රතිරූපක තත්වයට පත් වූවෙක් බවට යි ගැනෙන්නේ.

ගිහි සමාජය සම්බන්ධයෙන් වුවත් මේ කරුණ ඒ ආකාරයෙන්ම විග්‍රහ කර දැක්විමට හැකියාව තිබෙනවා.

***ඒ පිළිබඳ විස්තර බක් අමාවක පෝද (19) අන්තර්ජාල කලාපයේ පළවේ.***



2023 - සංකස්ස නුවර කඨින චීවර පූජාවට ඔබටත් ආරාධනා

2023 වර්ෂයේ නොවැම්බර් මස 04,05 දෙදින තුළ සංකස්ස නුවර පවත්වනු ලබන ඔබගේ ජීවිතයේ එක් වරක් හෝ සහභාගි විය හැකි මෙවැනි දුර්ලභ කඨින චීවර පූජෝත්සවයකට සහභාගි වීමත් සමගම දඹදිව් තලයේ සියලුම සිද්ධස්ථාන වන්දනාමාන කර දෙලොව සැප ප්‍රාර්ථනා කර ගන්නා මෙන් සැදැහැති ඔබගෙන් ඉල්ලා සිටිමි.

අගෝස්තු දඹදිව වන්දනාව සමගින් සංකස්ස නුවර වස් සමාදන් පිංකම සඳහා පිටත් වීම. 2023 ජුලි 27

- කඨින පූජෝත්සවය සමගින් දින 14 ක දඹදිව චාරිකාව පිටත් වීම නොවැම්බර් 02
- කඨින පූජෝත්සවය සමගින් දින 16 ක දඹදිව චාරිකාව පිටත් වීම ඔක්තෝම්බර් 30
- කඨින පූජෝත්සවය සමගින් දින 20 ක දඹදිව චාරිකාව පිටත් වීම ඔක්තෝම්බර් 29
- කඨින පූජෝත්සවය සඳහා පමණක් පිටත් වීම නොවැම්බර් 02 ආපසු පැමිණීම නොවැම්බර් 06

වැඩි විස්තර සඳහා ප්‍රධාන සංවිධායක තුමා අමතන්න




සියලු විමසීම්: ප්‍රධාන සංවිධායක, සාමවිනිසුරු, දේශශක්ති කේ. කේ. එල්. සිසිර කුමාර

ශ්‍රීලක් දඹදිව/තායි සංචාරකයෝ

(බුද්ධශාසන අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයකි. රජයේ ලි.ප. 46/0426)

0777 216486 / 037 2247059 070-4010300

Email: srilakdambadiwa@gmail.com

# අවිද්‍යාව හා තණ්හාව

ඇස, කන, නාසය, දිව, කය, මනස යන කායික ඉන්ද්‍රිය හය මගින් ගනු ලබන අරමුණු අනුව ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, මනසිකාර යන චෛතසික පහ සම්පූර්ණ වීම නිසා අවිද්‍යාව ඇතිවේ. අවිද්‍යාවේදී චේතනා චෛතසිකයට භාර කාර්යය වන්නේ කර්මයක් කිරීමට අවශ්‍ය ශක්තිය නිපදවීම පමණි.

උපාදානයේදී ඵස්ස, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ චෛතසික පහ සම්පූර්ණ වීමෙන් තෘෂ්ණාව හටගනී. තෘෂ්ණාවේදී සංඛාර චෛතසිකයට භාර කාර්යය වන්නේ අවිද්‍යාවේදී චේතනාව මගින් කර්මයක් කිරීමට අවශ්‍ය ශක්තිය ලබාදුන් කර්මය සංස්කාර චෛතසිකයේ දී ඇතිවන තණ්හාව මගින් කායික ඉන්ද්‍රිය මෙහෙයවා කර්මයක් සිදු කිරීමය. එමගින් පසුව විපාක උරුම වන කර්මයක් සිදුකෙරේ.

චේතනාහං භික්ඛවේ-කම්මං වදාමි. චේතනාව කර්මයයි. කර්මයක් කිරීමට කර්ම ශක්තිය නිපදවන්නේ චේතනාවයි. එහෙත් සිතින් සිතා කරන ක්‍රියාව කර්මයක් වූවත් එම කර්මය සිතට කිරීමට නොහැක. එය ක්‍රියාත්මක කළ හැක්කේ තණ්හාවේදී සංඛාර චෛතසිකය මගින් ඇතිවන එයට අයිති කාර්යභාරය මගිනි. තණ්හාවේදී ඇති වූ කාර්යභාරයේදී කායික ඉන්ද්‍රිය මෙහෙයවා චේතනාවෙන් නිපදවූ කර්ම ශක්තිය කය හෝ වචනය මගින් චේතනාවෙන් නිපදවූ කර්ම ශක්තිය ක්‍රියාත්මක කළ යුතුය. එවිට චේතනාවෙන් විපාක දෙන කර්මයක් සිදුවේ.

මීට පෙර භවවල රැස්කළ චේතනා කර්ම අපට සිහිකළ නොහැකි වන්නේ අපේ සියලු කල්පනා සඳහා උපයෝගී වන්නේ මේ භවයේ ඇස, කන, නාසය, දිව, කය, මනස යන ඉන්ද්‍රිය මගින් රැස් කළ චේතනා කර්ම පමණක් මොළයේ මතක ගබඩාවේ තැන්පත් වී ඇති බැවිනි.

පෙර භවවල කරන ලද කර්මවල කර්ම ශක්ති ඇත්තේ සාංසාරික මහා විඤ්ඤාණයේය.

ත්‍රිපිටකය හැදෑරීමට ඒ. පී. ද. සොයිසා මහතා සරල බසට නැගූ ත්‍රිපිටකය කියවන්න.

- පින් සහ පව් කුසල් සහ අකුසල් - 120/-
- පින සහ කුසලය දෙකක්ද? එකක්ද? - 200/-
- බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය - 350/-
- සිල්වතෙකු වී දහම අවබෝධ කරගන්න - 300/-
- චිත්ත නියාම ධර්ම - 125/-
- සිතිවිලි සහ සිතින් සිතීම - 150/-
- සිත සහ මනසින් කුසල් අකුසල් - කය සහ වචනින් පින් පව් - 100/-
- සිතෙහි සතුට ඇතිකර ගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න - 125/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම - 125/-
- කය වචන දෙකින් පින් - පව්, සිතින් කුසල් - අකුසල් 250/-
- පංච උපාදානස්කන්ධය 250/-
- සිත ගැන දැනගන්න - 125/-
- සිත මනස සහ ආගම් 80/-

මෙම පොත් වෙසක් සමය තුළ 25% වට්ටමකට ලබාගත හැකිය.

සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම

661, 665, 675 පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10. දුරකථන: (011) 2685369, 2686925 ෆැක්ස්: 2674187

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
දුරකථන - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## බක් පුර පසළොස්වක 2023-04-05

## සැබෑ දිනුම

උතුම් බක් පුන් පෝ දිනය අද යි. බක් මාසයේ සිදු වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ දෙවැනි ලංකා ගමනය හා සබැඳි ශ්‍රේෂ්ඨතම සිදුවීමක් ගැන සාකච්ඡාවට බඳුන්වන දිනය යි. තෘෂ්ණාව නිසා ඇති වූ ක්‍රෝධයේ කෝපයේ ගිනි දැල්වලින් දැවි දැවී මහා යුද්ධයකට සූදානම් වූ චූලෝදර මහෝදර නා රජවරුන් අතර ඇති වූ ගැටුම සමනය කොට ඔවුන්ට ශ්‍රී සද්ධර්මාවබෝධය ලබා දීම එම සම්බුද්ධ චාරිකාවේ අරමුණ විය.

දිවා රෑ නොබලා ජීවිතයේ ලෞකික සැප පසුපසම හඹා යන, ලෝභයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් මුලා වී සිටින සමාජය මේ මහාර්ඝ සිදුවීම සිහිපත් කරමින් ජීවිතයේ යථාර්ථය අවබෝධ කර ගැනීමට වෙහෙසිය යුතු වන්නේ අඳුරු පටලයකින් වෙළී පවතින ජීවිතයට ආලෝකය උදාකර ගැනීම සඳහා ය.

ශ්‍රී සද්ධර්මය සෑම කල්හි ම නො පවතී. අබුද්ධෝත්පාද කාලයක මිනිසත් බව ලැබුව ද දහම් පදයක් හෝ අසන්නට අපට අවස්ථාව ලැබෙන්නේ නැත. බුද්ධෝත්පාද කාලයක, උසස් මනසක් සහිතව උපත ලබන්නට අපි වාසනාවන්ත වී සිටිමු. බෞද්ධ රටක, බෞද්ධයන් ලෙස උපදින්නට ද භාග්‍යවන්ත වී සිටිමු. මැණික් ගලේ පය හැපුණත් කණාට එහි වටිනාකමක් නො දැනෙන්නා සේ ශ්‍රී සද්ධර්මය නිරන්තරයෙන් ශ්‍රවණය වුණත්, ඒ දහම ජීවිතයට බද්ධ කර ගන්නට නොහැකි ලෙස අන්ධ වූවෝ, නමට පමණක් බෞද්ධකම උරුම කර ගත්තෝ මේ සමාජයේ අපමණ වෙසෙති.

ධම්මං විනා නත්ථි පිතාච මාතා

ධර්මය හා සමාන මව් කෙනෙක් නැත. ධර්මය හා සමාන පිය කෙනෙක් ද නැත. මවුපියන් දරුවන්ට මොනතරම් සෙනෙහෙබර වුවද ඔවුන්ගේ රැකවරණය මෙලොවට පමණි. පරලොව ගිය කල නොලැබේ. එහෙත් ධර්මයේ පිහිට, ආරක්ෂාව සංසාර ගමනට ම ය. එහෙයින් බුද්ධෝත්පාද කාලයේ මේ ජීවිතයට වටිනාකමක් දෙන්නට, දෙලොවම රැකවරණය සලසා ගන්නට 'සුනාථ ධාරෙථ චරාථ ධම්මේ' මැනවින් ධර්මය ශ්‍රවණය කළ යුතුව ඇත. ඇසූ දහම මනාව ග්‍රහණය කරගත යුතුව ඇත. ග්‍රහණය කරගත් දහම දැනුමට සීමා නොකොට ජීවිතයට පුරුදු පුහුණු කළ යුතුව ඇත.

බොහෝ දෙනෙක් ජීවිතය දිනුවා යැයි සිතන්නේ අඹුදරුවන්, දැසි දස්සන්, ධන ධාන්‍ය පිරිවරා ගැනීමට ය. නිලතල ලැබීමට ය. ලෝභ, ද්වේෂ, මෝහ යන අකුසල් මුල් කර ගනිමින් කෝපය, ක්‍රෝධය වැඩිදියුණුකර ගනිමින් ගැටුම් ඇති කර ගන්නේ ඒ සම්පත් තව තවත් තර කර ගන්නට ය. එවැනි තත්ත්වයක් දහම හා කෙසේ නම් එකඟ වන්න ද? එවැන්නෝ අද සේ ම බුද්ධ කාලයේ ද වූහ.

ඛුද්ධක නිකායේ සුත්ත නිපාතයේ ධනිය සූත්‍රයේ එන ධනිය ගෝපාලගේ චරිතය සෑම බෞද්ධයකුම කියවිය යුතු ය. ධනිය ගෝපාල ධනවතෙකි. වස්සාන සමයේ මහී ගං තෙර උස්බිමක අලංකාර නිවෙසක තනා ගත් ඔහු ඒ නිවස තුළට වී සතුටු වන්නේ මහා මේඝ ගර්ජනාවන්ට ආමන්ත්‍රණය කරමිනි.

'පිසින ලද බත් ඇත. දොවාගත් කිරි ද ඇත. අඹු දරුවන් පිරිවරා සිටිමි. මහ ගං තෙර මගේ නිවහන හොඳින් සෙවිළිකර ඇත. මහා මේඝය, කැමැති නම් වසින්න' යනුවෙනි.

මේ සිතිවිලි නුවණින් දුටු බුදුරජාණන් වහන්සේ ධනිය ගෝපාලට ඇසෙන සේ දේශනා කොට වදාළේ

“මම ක්‍රෝධය, කෝපය දුරුකර සිටිමි. කෙලෙස් නැමැති මුල් උදුරා දැමුවෙමි. මගේ කුටිය විවෘත යි.

ඔබ කැමැති නම් වසින්න” යනුවෙනි.

මේ සම්බුදු වදන් නුවණින් විමසනවා නම් ජීවිතයේ සැබෑව දකින්නට අපහසු වන්නේ නැත. ආශාවන් පසුපස දුවමින් කෝපයේ ක්‍රෝධයේ ගිනි දැල්වලින් වෙළී අනුන් හා ගැටෙනවා වෙනුවට නො ගැටීමේ, නො ඇලීමේ සුවය සදාකාලික බව වටහා ගැන්ම අපහසු වන්නේ නැත. මේ පෝ දා ඒ උතුම් අරමුණට එන්නට අදිටන් කර ගනිමු.



# මෙවර රාජ්‍ය වෙසක් උත්සවය

## කැබැල්ලාවල ශ්‍රී රතනසිරි මහ පිරිවෙන් විහාරස්ථානයේ දී

ශ්‍රී බුද්ධ වර්ෂ 2567 (2023)රාජ්‍ය වෙසක් උත්සවය 2023-05-04 වෙනි දින හලාවත කැබැල්ලාවල ශ්‍රී රතනසිරි මහ පිරිවෙන් විහාරස්ථානයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. සමස්ත ලංකා සාශනාරක්ෂක මණ්ඩලය ,බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ හලාවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන් මෙම පුණ්‍ය මහෝත්සවය පැවැත්වේ.

2023 මැයි මස 02 සිට 08 දක්වා වෙසක් සතිය ක්‍රියාත්මක කෙරේ .“අත්තදීපා විහරථ අත්ත සරණා”තමා තමාට ම සරණක් වන්න.මෙවර වෙසක් උත්සවයේ තේමාවයි.

පුත්තලම දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් රට පුරා බෞද්ධ ප්‍රබෝධය ඇති කිරීමේ අරමුණින් මෙවර වෙසක් උත්සවය සැමරීමට සැලසුම් කර ඇත.

2023-05-02 වැනි දා පරිසර සංරක්ෂණ වැඩසටහන්, 03 වැනි දා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක්, 04 වැනි දා සාර ධර්ම ප්‍රවර්ධන වැඩසටහන්, 05 වැනි දා ශීල භාවනා පින්කම්, 06 වැනි දා සංස්කෘතික වැඩසටහන්, 07 වැනි දා භික්ෂු සහ සිල්මාතා පුහුණු වැඩසටහන්,08 වැනි දා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් වෙසක් සතිය තුළ දිවයින පුරා විහාරස්ථානවල පැවැත්වීමට කටයුතු යොදා ඇත.

*මාදම්පේ සමූහ - ඒ.පී.ගුණරත්න*

## අලුත් අවුරුද්ද සිල්වත් ව සමරමු

බක් මාසය යනු දරුවන්ට මෙන් ම වැඩිහිටියන්ටත් සුවිශේෂී මාසයකි. සිංහල බෞද්ධයන්ට පමණක් නොව දමිළ හින්දු භක්තිකයන්ටත් සුවිශේෂී මාසයකි. සිංහල ජාතියත්, හින්දු ආගමත් එක් කොට “සිංහල හින්දු” අලුත් අවුරුද්ද යනුවෙන් අපි ව්‍යවහාර කරමු. ඒ අනුව සිංහල, දමිළ ජාතිභේදයකින්, ආගම් භේදයකින් තොරව සමරන එක ම උත්සවයත් මෙයයි.

අලුත් අවුරුදු චාරිත්‍ර අනුව කටයුතු කිරීමට ලංකාවාසීහු පුරුදුව සිටිති. දරුවෝ අලුත් අවුරුද්ද උදාවන තුරු බලා සිටින්නේ විනෝද වීමටයි. කොතරම් කම්කටොලු තිබුණත්, කොතරම් අසරණකම් තිබුණත් දරුවකුට අලුත් ඇඳුමක් අරන් දීමට මවුපියෝ අමතක නොකරති.

දරුවෝ අවුරුදු උත්සවවලට සහභාගී වීමට, නෑදැයින් බැලීමට, සෙල්ලම් කිරීමට මෙන් ම අලුත් අවුරුද්දේ රස කැවිලි කෑමට ආසාවෙන් බලා සිටිති.

පාසල් නිවාඩුවේ දරුවන්ගේ එක ම බලාපොරොත්තුව සතුටින් විනෝදයෙන් සිටීමයි. එහෙත් අද මවුපියෝ දරුවන්ට විනෝදවීමට ඉඩදෙනවා ද යන්න ගැටලුවකි. මවුපියෝ දරුවන් උපකාරක පන්තිවලට යවමින් හෝ අන්තර් ජාලය ඔස්සේ පන්ති කරමින් දරුවන්ගේ ළමා කාලයේ සතුට අහිමි කරන බව පෙනේ.

අලුත් අවුරුද්දේ පුණ්‍ය කාලය යනු ආගමික වතාවත්වලට මුල්තැනක් දී කටයුතු කරන වේලාවයි. නැකතට ලිප ගිනි මොළ වා ආහාර අනුභවයට ප්‍රථම තෙරුවන් වන්දනා කිරීම, ආගම සිහිකර හිසතෙල් ගෑම වැනි චාරිත්‍ර ඉටු කිරීම මෙන් ම තාමගේ ආදරණීය මවුපියන් වැඩිහිටියන් බැලීමට තෑගිබෝග රැගෙන යාම මෙන් ම පරණ අමනාපකම් ආදිය අමතක කිරීමත් අලුත් අවුරුද්දේ කරන කොතරම් වටිනා කටයුතු ද යන්න අමුතුවෙන් සිහිකළ යුතු නොවේ. එහෙත් සමහරු මේ වටිනා අවුරුද්ද මත්වතුරෙන්, සූදුවෙන් විනාශ කර ගන්නා බවක් ද පෙනෙන්නට ඇත. එසේ නොකර සිල්වත්ව මේ සිංහල හින්දු අලුත් අවුරුද්ද ගත කිරීමට අපි අදිටන් කර ගනිමු.



අධ්‍යාපන අමාත්‍යාංශයේ, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

**කොටනෙළුවේ පුඤ්ඤදනන්ද හිමි**



# නිවන් මඟ පහසු කරවන ඉරියව් පැවැත්මේ භාවනාව පුහුණු කරමු

**සුළු වශයෙන් හෝ භාවනාවකට වාඩි වූ පුද්ගලයකුට ඇතිවන පොදු ගැටලුවක් පවතිනවා. භාවනාවක් පුහුණු කිරීමේදී ඇතිවන කායික මානසික අලසකමයි. එනම් ථීනමිද්ධයයි.**

බුදුරජාණන් වහන්සේ මේ ථීනමිද්ධය ප්‍රහාණය කරන ආකාරය පිළිබඳ මහා සතිපට්ඨාන සූත්‍රයේ ධම්මානුපස්සනාවේ පංච නීවරණ ප්‍රහාන අභ්‍යාසය තුළ දේශනා කොට තිබෙනවා. එය ටිකක් ගැඹුරු කොටසක් වන බැවින්, සාමාන්‍ය භාවනාවක් දියුණු කර ගැනීම සඳහා නිරන්තරයෙන් පවත්වාගෙන යායුතු පුරුදු පුහුණු කළ යුතු ඉතා වටිනා භාවනා කණ්ඩයකට අද අවධානය යොමු කරමු.

මේ භාවනා කොටස හඳුන්වා දෙන්නේ මහා සතිපට්ඨාන සූත්‍රයේ කායානුපස්සනාවේ දෙවැනි භාවනා කාණ්ඩය හැටියටයි. ඒ භාවනාව නම් ඉරියාපථ භාවනාවයි. ඉරියව් පැවැත්මේ භාවනාවයි.

බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා "පුන ච පරං භික්ඛවේ භික්ඛු ගච්ඡන්තෝ වා ගච්ඡාමිති පජානාති, මහණෙනි, භික්ෂුව යන්නේ "යන්නෙමි'යි, නුවණින් යුතුවම දනියි.

"ඨිතෝ වා ඨිතෝම්හීති පජානාති" සිටින්නේ "සිටින්නෙමි" යි නුවණින් යුතුව ම දනියි.

"නිසින්නෝ වා නිසින්නෝම්හීති පජානාති" හිඳින්නේ "හිඳින්නෙමි" යි, නුවණින් යුතුවම දනියි. සයානෝ වා සයානෝම්හීති පජානාති, නිඳන්නේ "නිදන්නෙමි"යි නුවණින් යුතුවම දනියි. යථා යථාවා පනස්ස කායෝ පණිහිතෝ හෝති, තථා තථා නං පජානාති යම් යම් අයුරින් ඔහුගේ කය පවත්නේ වේ ද, එය ඒ ඒ අයුරින් සිහි නුවණින් යුතුවම දනියි.

සාමාන්‍ය ජීවිතයේ දී අප මෙය පුහුණු කරන්නේ, කෙසේද?

අප විසින් පවත්වනු ලබන ප්‍රධාන ඉරියව් හතරක් පවතිනවා. ඒ ගමන් කිරීම, හිටගෙන සිටීම, ඉඳගෙන සිටීම සහ නිදා ගැනීම යන ප්‍රධාන ඉරියව් හතරයි. මේ ප්‍රධාන ඉරියව් හතරේ දී පළමු වැන්න ගමන් කිරීමයි. අප යම් ගමනක යෙදෙනවා නම් ඉතාම සිහිනුවණින් යුතුව ගමන් කරනවාය යන සිහියෙන් යුතුව ගමනේ නිරතවිය යුතුයි. පෘථග්ජන පුද්ගලයා බොහෝවිට ගමනක් බිමනක් යන්නේ පුරුද්දට මිස සිහියෙන් නොවේ. ඔබම කල්පනා කර බලන්න.

ඔබත් මෙවැනි අත්දැකීම් බොහෝ විට ලබා ඇති, සමහර විටක "ගෘහණියක් ආහාර පිසින විට ව්‍යංජනයකට දැමීම සඳහා දෙහි ගෙඩියක් අවශ්‍ය වනවා. ඒ අවස්ථාවේ කුස්සියෙන් එළියට බැස දෙහි ගස ළඟට යනවා. දෙහි ගස ළඟට ගොස් කල්පනා කරනවා මම මෙතනට ආවේ ඇයි ? කියා" කල්පනා කළාට මතක් වෙන්නේ නැහැ. ඇයි? ඇය පැමිණි ගමන පිළිබඳ සිහිය පිහිටුවා නැහැ. සමහර විටක ආපසු කුස්සියට ගිය විට එහි ඉන්නා කෙනෙක් අහනවා කෝ දෙහි ගෙඩිය කියා." 'අනේ මට අමතක වුණා කියමින් ඇය නැවත දෙහි ගස යටට යනවා. දෙවැනි වතාවටයි දෙහි ගෙඩිය කඩාගෙන එන්නේ.

කෙනෙක් ගමනක් යන විටදී ඒ යන ගමන පිළිබඳ සිහිය පිහිටුවා ගත්තා නම් එසේත් නැතිනම් සිහියෙන් ගමන් කළා නම්, තමන් යන කාරණය අමතක වෙන්නේ නැහැ. එදිනෙදා ජීවිතය පවත්වන විට රැකියාවට, කඩයට, පාසලට ආදී මේ හැම ගමනක දී ම ගමන් කිරීමේ ඉරියව්ව ක්‍රමානුකූලව පැවැත්වීම භාවනාවක් ලෙසින් වඩන්නට පුළුවන්.

භාවනාව පුහුණු කිරීමේ දී, ගමන් කිරීමේ ඉරියව්ව තුළ ස්වභාවික නොවන කායික චලනයන් පැවැත්විය යුතු නැහැ. එනම් ඔබේ ස්වභාවික ගමන වෙනස් නොකළ යුතුයි. උදාහරණයක් ලෙස සෑ මළු, බෝ මළු වටා සමහරු ගමන් කරමින් ඉරියාපථ භාවනාවේ යෙදෙනු අපට දක්නට ලැබෙනවා. මෙහි දී ඇතැමුන් මළුව කෝදුවකින් මනින්නා සේ, තම පියවරෙන් පියවර එකිනෙකට ගැටෙමින් තබමින්, සම්පූර්ණයෙන් ම හිස බිමට නමාගෙන භාවනා කරන අයුරින් ගමන් කරනු දක්නට ලැබෙනවා. එය සාමාන්‍ය මනුෂ්‍යයෙක් ගමන් කරන ඉරියව්වක් නොවෙයි. මේ අස්වාභාවික ඇවතුම්, පැවතුම් පැවැත්වීම භාවනාව නොවේ.

හිස සම්පූර්ණයෙන් ම බිමට නමාගෙනයි ගමන් කරන්නේ නම් එය සාමාන්‍යයෙන් මනුෂ්‍යයෙක් ස්වභාවිකව ගමන් කරන ඉරියව්ව නොවේ. මෙසේ අස්වාභාවික ඇවතුම් – පැවතුම් පැවැත්වීම නිවැරැදි ඉරියාපථ භාවනාව නොවේ. අවශ්‍ය වන්නේ සාමාන්‍ය අපගේ ස්වභාවික ගමනයි. ඉතා වේගවත් ගමනක් හෝ ඉතා සෙමින් ගමනක් ද නොවිය යුතුයි. ඇත්තට ම ඔබට ඔබේ සිහිය පිහිටුවා ගැනීමේ හැකියාව පවතින ඔබේ ස්වභාවික ගමන විය යුතුයි.

විශේෂයෙන් ම පුරාණ කර්මස්ථානාචාරීන් වහන්සේලා මෙහි දී සිහිය පිහිටුවා ගැනීම සඳහා උපදේශයක් දී තිබෙනවා, එනම් ඉරියාපථ භාවනාවේ දී වම – දකුණ කියා හෝ තමන් පිහිටුවන තමන් තබන පියවරෙහි සිහිය පිහිටුවා ගැනීම පුහුණු වන ලෙසයි. එනම් වම් පාදය තබනවා නම් ඒ වම් පාදය තබන බවත්, දකුණු පාදය තබනවා නම් ඒ දකුණු පාදය තබන බවත්, සිහියෙන් දැනගත යුතුයි.

මේ ආකාරයෙන් ඉතා සිහියෙන් යුතුව ඔබට හැකි සෑම විටකම එනම් පාසලට, රැකියාවට, බසයට වෙළඳපොළට හෝ යනවා නම් හෝ, නොඑසේ නම් අඩි විස්සක්, තිහක් හෝ ඉතාම සිහියෙන් ගමන් කළ හැකියි. මෙසේ ගමන් කිරීමේ ඉරියව්ව තුළ සිහිය පිහිටුවාගෙන ගමන් කිරීමේ පුහුණුව ආරම්භ කළොත් ඔබට භාවනාවෙන් බොහෝ ඉදිරියට ගිය කෙනෙක් බවට පත්වෙන්නට පුළුවනි. එමෙන්ම භාවනාවේ ප්‍රතිඵල ලබන්නට සුදුසු බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් බවට පත්වෙන්නට පුළුවනි.

භාවනාවට සූදානම් වන සෑම කෙනකුට ම පොදුවේ ඇතිවන ගැටලුවක් තිබෙනවා. ඒ භාවනාව සඳහා වාඩි වී ඉන්න බැහැ. කොන්ද රිදෙනවා. ශරීරයට හරි අපහසුයි. මෙවැනි අයට භාවනාව සඳහා ඉතාම හොඳ ක්‍රමය නම් "ගමන් කරනවිට ගමන් කරනවා යැයි" සිහිය පිහිටුවා ගන්නා වූ ඉරියාපථ භාවනාවේ පළමු භාවනා කාණ්ඩය අනුගමනය කිරීමයි.

මෙහි දී සිහිය පිහිටුවා ගත යුත්තේ ගමන් කරන අවස්ථාවේ දී මුළු කය කෙරෙහිම, ගමන් කිරීමේ ඉරියව්ව කෙරෙහි ය. මෙසේ ඒ බව හොඳින් අවබෝධ කර ගත යුතුයි. ගමන් කරන ඉරියව්ව කෙරෙහි සිහිය පිහිටුවිය යුතුයි. මෙය පහසු කාර්යයක් නොවේ. එබැවින් පුරාණ කර්මස්ථානාචාර්යයන්, වහන්සේගේ අනුශාසනා අපට වැදගත් වන්නේ, සමථ වශයෙන් අප පුහුණු කරන බුදුගුණ භාවනාව ධම්මානුස්සති භාවනාව, සීලානුස්සති භාවනාව, ධම්මානුපස්සනා භාවනාව, මෛත්‍රී භාවනාව ආදී වශයෙන් කුමන භාවනාවක් වඩන්නකුට වුව ද, එම භාවනාව දියුණු කර ගැනීම සඳහාත් ඒ භාවනාවේ ආධ්‍යාත්මික දියුණුව නොපිරිහී පවත්වා ගෙන යෑම සඳහාත්, ඉරියාපථ භාවනාව මහෝපකාරී වේ.

ඊළඟ පියවර නම් සිටගෙන සිටීමේ ඉරියව්වයි. ඒ ඉරියව්ව කෙරෙහි සිහිය පිහිටුවන විට හිසේ සිට පාදාන්තය දක්වා ම සිහියෙන් ම දැන ගත යුතුයි. යම් තැනක දී සිටගන්නා විට ම "ඨිතෝ වා ඨිතෝම්හීති පජානාති" මම දැන් සිටගෙන ඉන්නවා යැයි සිහිය පිහිටුවිය යුතු ය. මේ ආකාරයෙන් සිහිය පිහිටුවීම තුළින් කාලයත් සමඟ ඔහුට හෝ ඇයට සිතේ බලවත් එකඟතාවක් හට ගනු ලබයි. මෙම භාවනා ක්‍රමය සුළුකොට තැකිය යුතු නොවන අතර, නිවැරැදිව පුහුණු කරන්නේ නම් එය ඒකායන නිවන් මඟට හේතුවන විදර්ශනා භාවනාවකි.

ඔබ නිදහසේ යම් තැනක වාඩි වී සිටිනවා ද? එය පරියංකයෙන් වාඩිවීම අත්‍යවශ්‍ය නැහැ. පුටුවක, ගලක් උඩ, දුම්රියක, බස් රථයක හෝ වෙනයම් තැනක හෝ විය හැකියි. අවශ්‍ය වන්නේ "නිසින්නෝ වා නිසින්නෝම්හීති පජානාති" ඉඳගෙන ඉන්නවිට ඉඳගෙන ඉන්නවා යන ඉරියව්වට සිහිය පිහිටුවීමයි.

ඒ වගේ ම නිදා ගැනීමේ ඉරියව්වේ දී ද ඉරියාපථ භාවනා ක්‍රමය අනුගමනය කළ හැකියි.

බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළේ, භාවනා යෝගියෙක්, භික්ෂුවක් සයනය කිරීමේ දී සිංහසෙය්‍යාව අනුගමනය කළ යුතු බවයි. මෙසේ දකුණු ඇලයට හැරී සයනය කරන විට හිසේ සිට පාදාන්තය දක්වාම මෙම සැතපීමේ ඉරියව්ව සිහියෙන් දැක බලවත්ව සිහිය පිහිටුවා ගත යුතුයි. මේ ඉරියාපථ භාවනා ක්‍රමය තුළිනුත් කාලයත් සමඟ සිතේ බලවත් එකඟතාවක් හට ගනු ලබයි.

මෙසේ කායානුපස්සනා, භාවනාවන් පුරුදු පුහුණු කිරීමේ දී එහි මූලික ක්‍රමවේදය අනුගමනය කළ යුතුයි. එනම් කායානුපස්සනාවට අයත් මේ ඉරියාපථ භාවනාවට අවශ්‍ය වන්නේ "කෙලෙස් තවන වීර්යයෙන් යුතු බලවත් නුවණින් යුතු, බලවත් සිහිය (සතිමා) ඇලීම හා ගැටීම දුරු කරමින් පැවැත්විය යුත්තේ ය."

මේ ඉරියාපථ භාවනාව නිවසේ දී හොඳින් පුහුණු කළ හැකි භාවනා ක්‍රමයක් මෙසේ නිවැරැදි පිළිවෙලින් යුක්තව පුරුදු – පුහුණු කරන විට කාලයත් සමඟ ඔබට ම වැටහේවි. පුදුමාකාර සංසිඳීමක්, සංයමයක් ජීවිතයට ලැබෙන බවයි. එය ජීවිතයට ලැබෙන මහඟු සැනසීමක් බව තමන්ට ආධ්‍යාත්මිකව සුවයක් අත්විඳිනවා ය කියන සතුට දැනෙන්නට පටන් ගන්නවා.

ඉරියාපථ භාවනාවේ දී ඉරියව් කෙරෙහි සිහිය පිහිටුවන විට වාඩි වී කරන භාවනාවක් වුව ද හොඳින් සිදු කළ හැකියි. මෙසේ කොයි භාවනාවකින් වුවත් ඒ ආධ්‍යාත්මික දියුණුව ඒ ආකාරයෙන් පවත්වාගෙන යෑම සඳහා මේ ඉරියාපථ භාවනාව මහෝපකාරී වෙනවා. උතුම් ඒකායන නිවන් මඟ වන සතිපට්ඨාන ධර්මය පුරුදු පුහුණු කර ජීවිතයේ උතුම් ආධ්‍යාත්මික සුවපත් භාවයට පමුණුවා ගන්නට ඔබත් උත්සාහ කරන්නේ නම් ඉතා අගනේ ය.



පේරාදෙණිය හිඳගල මහකන්දේ ධම්මචේතිය ශ්‍රී සමාධි භාවනා පුහුණු මධ්‍යස්ථානයේ අනුශාසක කම්මට්ඨානාචාර්ය
**මහමෙවුනාවේ මංගල හිමි**

සමාජයක් ලෙස එකට යන ගමනේ දී අපට හුදකලා විය නොහැකි යි. විවිධ විදියේ ගනුදෙනු කළයුතු වෙනවා. එවැනි අවස්ථාවක ඇතැම් විට අපට අකැමැති වචන, සිත රිදෙන වචන, පරුෂ වචන අහන්න ලැබෙනවා . මේ වගේ අවස්ථාවක සිතට ඇතිවන්නේ දුකක්. එතැනින් නවතින්නේ නෑ. අපට හිතෙනවා ඇයි මේ අය මට මෙහෙම සලකන්නේ? මම මොන වරදක් කළාට ද? කියලා. එනිසා විටෙක යහපත වගේම තවත් විටෙක අයහපත ළඟා කරන වචනය නිවැරැදිව පරිහරණය කළ යුත්තේ කෙසේද කියා කළ සාකච්ඡාවකි මේ.



මහමෙව්නා භාවනා අසපුවාසී
පොතුහැර මහින්දසිරි හිමි

# පුංචි දේටත් හිත රිදවා ගන්නේ හිතේ හයිය නැති අය යි

***පින්වත් ස්වාමීන් වහන්ස, බුදුදහම පුරාම විහිදී යන්නේ සත්‍ය වචනය යි. සත්‍ය වචනය අපගේ ජීවිතයට ආලෝකයක් වන්නේ කොහොම ද?***

භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදාළේ අපේ ජීවිතයේ තිබෙන සැබෑ තත්ත්වය යි. සැබෑ ස්වභාවය යි. සැබෑ කතාව යි. බුදුදහමේ අන්තර්ගත වන්නේ මේ ලෝකයේ තිබෙන පරම සත්‍යය යි. එය වෙනස්වන්නේ නැහැ. උන්වහන්සේ වදාළා ඉපදුණ සත්ත්වයාට දුක උරුම වූ දෙයක්. ඉපදුන සත්වයා ලෙඩ වෙනවා. වයසට යනවා. මරණයට පත්වෙනවා. අප්‍රිය අය හා එක් වෙනවා. ප්‍රියයන්ගෙන් වෙන්වෙනවා. ඒ අතර, කාලයේ දී බොහෝ දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දෙන්නට වෙනවා. එය ලෝක ස්වභාවය යි. හැම දෙනාට ම එය පොදුයි. මේ පොදු ධර්මතාව තමා භාග්‍යවතුන් වහන්සේ අපට පෙන්වා වදාළේ.

ඇතැම් අය මේ සත්‍යයට මුහුණ දෙන්න කැමැති නෑ. ඇත්ත මඟ හැරලා පැනලා යන්නයි බලන්නේ. එහෙත් බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රාවකයනට දේශනා කොට වදාළේ මේ සත්‍ය කියන දේට මුහුණ දෙන්න කියල යි. එය මේ ලෝකයේ වෙනස්වන්නේ නැති දෙයක්. වෙනස් කිරීමට බැරි දෙයක්. මම මේ සත්‍ය ඉක්මවා ගියේ නැති කෙනෙක් කියලා හොඳින් නුවණින් විමසන්න ඕනෑ. එවිටයි අපට සත්‍යයට මුහුණ දෙමින් ජීවිතයේ සැබෑ ස්වභාවය හඳුනාගෙන අවබෝධයෙන් ජීවත්වෙන්න පුළුවන් සිතක් හදාගන්න ශක්තිය ලැබෙන්නේ. ඒ නිසයි භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදාළේ මම වයසට යන කෙනෙක්, මම වයසට යාම ඉක්මවා ගිය කෙනකු නොවේ. මම වයසට යාමෙන් නිදහස් වූ කෙනෙක් නොවේ. මේක තමා ලෝකයේ ස්වභාවය ලෙස නිතර නිතර සිතන්න කියලා.

ඒ වගේම භාග්‍යවතුන් වහන්සේ වදාළා ශ්‍රාවකයා නිතර සිහි කළ යුතුයි, තමා ලෙඩ වෙන කෙනෙක් බව, ලෙඩ වෙන ස්වභාවය ඉක්මවා ගොස් නැති බව, තමා මරණයට පත්වෙන කෙනෙක්, ප්‍රියයන්ගෙන් වෙන්වෙන්නට සිදු වෙන කෙනෙක්. තමන් කර්මය දායාද කරගෙන ඉන්නේ කියා නිතරම සිහි කරන විට අපේ සිත සූදානම් වෙනවා සත්‍යයට මුහුණ දෙන්න. ඇත්ත තේරුම් ගන්න. අවබෝධ කර ගන්න. කෙනකු ජීවිතයේ සැබෑ ස්වභාවය තේරුම්ගත් විට ඒ සත්‍යයට මුහුණ දෙන්න ඔහුගේ සිත ශක්තිමත් වෙනවා. හඬා වැළපීමෙන් තොරව, ශෝක කරන්නේ නැතිව ජීවිතයට මුහුණ දෙනවා . එවිටයි කෙනකුගේ ජීවිතය වගේම සිතත් ශක්තිමත් වෙන්නේ.

අද සමාජයේ බොහෝ දෙනාගේ සිත ශක්තිමත් නැහැ. පොඩි දෙයටත් කඩා වැටෙනවා. හැම දේටම මුල් වන්නේ මේ ලෝකයේ සත්‍ය කියන දෙය පිළිගන්නට බැරිකමයි. ඒ නිසයි භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදාළේ සත්‍ය කියන දේ පිළිගෙන එයට මුහුණ දෙන්න උත්සාහ කරන්න කියලා .ඒ උපදේශය කෙනෙක් පිළිපැද්දොත් ඔහුගේ ජීවිතය ආලෝකවත් වෙනවා. අඳුර ජීවිතයෙන් පලා යනවා.

අප අතර ඇතැම් අය සිටිනවා, ප්‍රශ්නවලින් මිරිකිලා, ඒ තුළම කිඳා බැසගෙන සිතිනුත් දුක් විඳිමින් මානසික ප්‍රශ්න ඇති කරගෙන, තමාගේ ගුණ ධර්ම තිබුණා නම් ඒවාත් නසාගෙන ජීවත් වෙනවා. එවිට ඔහුගේ ජීවිතය අඳුරු ස්වභාවයක් ගන්නවා. අඳුරු දෙයට එකතු වෙන්නේ අඳුරු දෙයක් ම යි. තමා ජීවත්වන රටාව අඳුරු කර ගත්තාට පස්සේ තමා වටේට එකතු වෙන්නෙත් අඳුරු දේ ම යි. තරහා යන දේ ම යි. අයහපත් දේ ම යි. එහෙත් භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දුන්නේ ප්‍රශ්න කියන දේ අපට නවත්වන්නට බැහැ. සත්‍ය කියන දේ පිළිනොගෙන ඉන්නත් බැහැ. හැබැයි අපට ඒ සියල්ලම පාලනය කරන්නට පුළුවන්. ඒ අපි ඒවාට මුහුණ දෙන ආකාරය, අවබෝධ කරගෙන තේරුම් ගන්නා ආකාරය අනුව යි. එය තමා සතු දෙයක්.

***බාහිර ලෝකයා කතා කරන වචනයෙන් අපේ සිතට සතුටක් ඉපදෙනවා. දුකත් ඉපදෙනවා. මේ අවස්ථාවට අපි මුහුණ දෙන ආකාරය පහදා දෙන්න ස්වාමීන් වහන්ස***

මේ වගේ ප්‍රශ්නයක දී අපි තේරුම් ගත යුතු පළමු දේ නම් ලෝකයේ මිනිසුන් අපට කියන දේ හෝ අපි ගැන හිතන දේ අපට පාලනය කරන්නට බැහැ. මිනිසුන් හිතන්නේ ඔවුන්ට වුවමනා දේ යි. අපට ඕන දේ මිනිසුන් හිතන්නේ නැහැ. මිනිසුන් කතා කරන්නේ ඔවුන්ට කතා කරන්න වුවමනා වචන. එහෙම නැතුව අපි අහන්න කැමැති වචන හැමවෙලාවක ම ලෝකයාගෙන් අහන්න ලැබෙන්නේ නැහැ.

එහෙමනම් බාහිර පුද්ගලයන් කතා කරන වචන අපේ පාලනයෙන් තොරයි. බුදුරජාණන් වහන්සේ එය තේරුම් ගැනීමට මෙසේ වදාළා. ඔබට අන් අය කියන වචන ක්‍රම කීපයකට හඳුන්වා දෙනවා. ඒ සුදුසු කාලයෙත් ලෝකයාගෙන් වචන අහන්න සිදුවෙනවා. නුසුදුසු කාලයේදීත් වචන අහන්න සිදු වෙනවා. ඒ වගේම මෘදු වචනත්, රළු වචනත් අහන්නට ලැබෙනවා. යහපත වගේම අයහපත ඇතිකරන වචනත් අහන්න ලැබෙනවා. සිත නිවෙන වචන වගේම සිත ඇවිස්සී යන වචනත් අහන්න ලැබෙනවා. බුදුරජාණන් වහන්සේ මේ හැම පර්යායට ම දේශනා කරන්නේ ලෝකයා අපට කියන දේ, කතා කරන දේ අපට පාලනය කරන්න බැහැ කියන්න යි. අපි කැමැතිම වචන මේ ලෝකයේ අහන්න ලැබෙන්නේ නැහැ. ඒක තමා මේ ලෝකයේ තිබෙන ස්වභාවය. ඒක තමා සත්‍ය ය. ඒක තේරුම් ගත් දවසට අපට හිත හදාගන්න පුළුවන්. මට මේ වචන පාලනය කරන්න බැහැ. මට පාලනය කරන්න බැරි මේ වචන ඉදිරියේ මම ක්‍රියා කරන්නේ කොහොමද කියන දේ යි. කෙනෙක් කියන මිහිරි වචනය තුළින් අපි ඒ වචනයට බැඳිලා ඒ සමඟ එකතු වෙලා යනවා. ඒ වගේම තරහෙන් කෙනෙක් කතා කළොත් ඒ සමඟ ගැටී ඒ පිරිස සමඟ තරහ ගෙන කටයුතු කරනවා. මේ දෙ ආකාරය ම සුදුසු නැහැ.

භාග්‍යවතුන් වහ්නසේ පෙන්වා දුන්නේ සතුටක් හිතෙන වචන කතා කළොත් ඒ සමඟ අනවශ්‍ය ලෙස බැඳෙන්නට එපා. රළු වචන කතා කළොත් ඒ වචන සමඟ අනවශ්‍ය ලෙස ගැටෙන්නත් එපා. මේ හැම දෙයක් ම අපේ කනට ඇසුන සැණින් වෙනස් වෙනවා. එහෙත් අපේ සිත නැවත නැවත ඒ වචන සිහිපත් කරමින් මට බැන්නා, මට නින්දා කළා, මගේ හිත රිද්දුවා කියා වෛර බැඳ ගන්නවා. ඇත්තටම වචන කියන්නේ ඒ මොහොතේ ඇසී ඒ මොහොතේ ම නැතිවෙන දෙයක්. එනිසා කිසිදු වචනයකට අපි කලබල විය යුතු නැහැ.

***ස්වාමීන් වහන්ස, ඇතැම් අය සුළු කරුණකදීත් හිත් රිදවා ගන්නවා. එවැනි තත්ත්වයක් පාලනය කර ගන්නේ කොහොම ද?***

අපේ සිතේ ස්වභාවය අනුවයි පොඩි පොඩි දේට අපේ සිත රිදෙන්නේ. අපි කැමැතියි යහපත් ව, සතුටින් ඉන්න. අපි හිතනවා අපට ලැබිලා තිබෙන සතුට, සැනසුම හැමදාම තියෙන්න ඕන කියලා. එහෙත් සතුට කියන දේ වෙනස්වන ස්වභාවයට අයිතියි. හේතූන්ගෙන් හට ගෙන හේතු නැතිවීම නිසා නැතිවෙන දෙයක්. ඒක තේරුම් ගත්තොත් අපේ ජීවිතයට දුකක්, කරදරයක් එනකොට අපට කල්පනා කරන්න පුළුවන් මේක හටගත්තේ හේතුවක් නිසා. මට දැන් සතුටක් ඇතිවෙලා තිබෙන්නේ. නමුත් මේ හේතු නැතිවූ විට මේ සතුට නැතිවෙනවා කියා. දුකක් ආවොත්? ඒත් කල්පනා කරන්න තිබෙන්නේ මේ දුක කියන දේ හට ගන්නේ හේතුවක් නිසා. හේතුව නැතිවන විට මේ දුකත් නැතිවෙලා යනවා. එහෙම තේරුම් ගත්තොත් අපේ සිත රිදෙන වෙලාවට මේ හට ගත් දේ වෙනස් වෙලා යනවා කියලා. අපේ හිත හදාගන්න, හිත රැක ගන්න ලෙහෙසියි. නැත්නම් පොඩි දෙයටත් අපට දුකක් ඇති වුණොත් ඊළඟට එන අකුසලය ද්වේෂය, ගැටීම, පටිඝය කියන දේ යි. ද්වේෂය ආවම අපි ඒ සමඟ ක්‍රියාත්මක වෙනවා. ඒ තුළින් බොහෝ අකුසල් වෙන්න පුළුවන්. අපි තේරුම් ගන්න ඕන පොඩි දෙයටත් ගැටෙනවා නම් අපේ සිත ශක්තිමත් නැහැ. ඒ හිත ගොඩාක් දුර්වල යි. ශක්තිමත් සිතක් ඇති කෙනා ඉවසනවා.



✍ නයනා නිල්මිණී

# දයාභාරත දඹදිව චාරිකා - මොරටුව

ඉන්දියාව, නේපාලය, තායිලන්තය, බුරුම, සිංගප්පූරුව, මැලේසියාව, වියට්නාමය, ඩුබායි

## දඹදිව චාරිකා පිටත්වීම

2023 පෙබරවාරි, මාර්තු, අගෝස්තු, ඔක්තෝම්බර්, නොවැම්බර්

බුද්ධගයාව, බරණැස, රජගහනුවර, විශාලාමහනුවර, කුසිනාරානුවර, ලුම්බිණිය
කපිලවස්තු, කොසඹෑ නුවර, සැවැත්නුවර, සංකස්ස, දිල්ලි ඇතුළු
අනු ස්ථාන 100 වැඩි ප්‍රමාණයක් වන්දනා කෙරේ.

- ➔ දින 13 චාරිකාව රු. 235000.00 (දුම්රියේ ගමන් නැත)
- ➔ දින 16 චාරිකාව රු. 210000.00 (දුම්රියේ ගමන් වාර 2ක් සහ සාංචි ඇතුලත්ව)
- ➔ දින 15 චාරිකාව රු. 235000.00 (කොළඹ-චෙන්නයි , දිල්ලි-කොළඹ සාංචි ඇතුලත්ව)
- ➔ තායිලන්ත චාරිකාව පිටත්වීම 2023 රු. 300000.00
- ➔ බුරුම චාරිකාව පිටත්වීම 2023 ජුනි
- ➔ මැලේසියා/සිංගප්පූරු චාරිකාව 2023 අප්‍රේල් 16 රු. 400000.00
- ➔ තිරුපති චාරිකාව දින 03 පිටත්වීම 2023 රු. 140000.00

## නැගෙනහිර ඉන්දියාව සහ එයින් එහා බුද්ධ භූමි වන්දනාව

පිටත්වීම 2023 ජුනි (දින 11) සම්පූර්ණ ගාස්තුව රු. 220000.00

සාම්ප්‍රදායික දඹදිව වන්දනා ක්‍රම වලින් බැහැරව මහා භාරතයේ නැගෙනහිර ඉන්දියාව,
මධ්‍ය ඉන්දියාව සහ බටහිර ඉන්දියාවේ සුප්‍රකට ඓතිහාසික බෞද්ධ වන්දනා භූමි දැකබලා ගැනීම සඳහා
අජන්තා, එල්ලෝරා බෞද්ධ ලෙන් විහාර, අමරාවතී බුද්ධ ප්‍රතිමා හා කලා නිර්මාණ,
නාගර්ජුන කොණ්ඩා, සච්චබද්ධ(තිරුපති), සාංචි සහ චෙන්නායි සාප්පු සවාරි ඇතුලත්ව

## වෙසක් මස දඹදිව චාරිකාව

සියළු බුදුවරුන් වහන්සේලා අත්නොහැර වඩිනා අවිජහිත පින්බිම බුද්ධගයාවේදී දාන, සීල, භාවනා
ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන් ඇතුළු පින්කම් රැසක් සමග සුඛෝපභෝගී දින 12 චාරිකාව
පිටත්වීම 2023 මැයි මස 01 දින සම්පූර්ණ ගාස්තුව රු. 250000.00

## දකුණු ඉන්දියානු චාරිකාව

පිටත්වීම 2023 (දින 07/රාත්‍රී 06) සම්පූර්ණ ගාස්තුව රු. 200000.00
තිරුපති, බැංගලූර්, මයිසූර්, ඌටි සහ චෙන්නායි සාප්පු සවාරි ඇතුලත්ව

ප්‍රධාන සංවිධායිකා : එම්. චන්දිමාලි ප්‍රනාන්දු
072 2803454 / 075 6343377 / 071 0632025
011 2657222 /077 7425726 / 077 7307851

නො. 14/4A, මෝසස් පටුමග, කටුකුරුන්ද, මොරටුව



නිර්මල බුද්ධ ධර්මය බැබලේවා..!

# විදර්ශනා භාවනා

කම්මට්ඨානාචාර්ය ගරු මැද්දේගම

## අරියවංශ ලොකු ස්වාමීන් වහන්සේගේ 27 වෙනි ගුණානුස්මරණ පිංකම

නාරම්පොල ශ්‍රී විශුද්ධාරාමාධිපති අතිගරු පූජ්‍යපාද

## මැද්දේගම චන්ද්‍රජෝති

ලොකු ස්වාමීන් වහන්සේගේ 16 වෙනි ගුණානුස්මරණ පිංකම අතිගරු
හැගව රතනසාර ලොකු ස්වාමීන් වහන්සේගේ පළමු වෙනි ගුණානුස්මරණ
පිංකම ගරු රණාවත්තේ අරියසෝම හිමි විසින් සිදුකරනු ලබන

## නාරම්මල රණාවත්තේ අරියවංශාරාම විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ

සතියක් පමණ දැඩි වීරියෙන් විදර්ශනා භාවනා පුහුණු වැඩසටහනක් ආරම්භ කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත. එම මහඟු අවස්ථාවෙන් ප්‍රයෝජනය ගැනීමට ඔබ සියලු දෙනාට අප සමිතිය මඟින් කරුණාවෙන් ආරාධනා කරන්නෙමු.

මේ ගෞතම බුද්ධ ශාසනයයි. අප කෙරෙහි අනුකම්පාවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ උතුම් නිර්වාන මාර්ගය දාන, සීල, භාවනා - සීල, සමාධි, ප්‍රඥා ශාසනයට බැස සියලු දුක්ගිණි නිවා ගැනීමට හැකිවනු ඇත. තෘෂ්ණාවට වහලෙක් වී කටයුතු කිරීමෙන් හරි කියා රවටන දෘෂ්ටියට මුල්තැන දීම සහ කැහි, කෙල, සෙම සමග තෘෂ්ණාවෙන් ගිල දමන ආහාරය පණුවන් සහිත අසූචි සෝදමින් සැප සොයමින් දිව යන ශරීරය නැමැති ජරාගොඩ උතුම් කොට සලකමින් දුක් ගොඩ සැප ලෙස සලකමින් කර්මයට අනුව විපාක විඳින ස්කන්ධය ගැන සත්‍ය අවබෝධ කර ගැනීම සඳහා විදර්ශනා භාවනා කිරීමට ඔබ සැමට අප සමිතිය ගෞරවයෙන් ආරාධනා කරන්නෙමු.

පැමිණීමට නොහැකි නම් ඒ සඳහා වෙනත් කෙනෙකු යොමු කරන මෙන් ඉල්ලා සිටිමු.

සියලු පිංවතුන් සැලකිය යුතුයි.

බුදු සරණයි...!

01.සිල් ඇඳුම් කට්ටල 02ක් රැගෙන ඒමට.
02.පිඟානක් සහ කෝප්පයක් රැගෙන ඒමට.
03.වාඩිවීම සඳහා ඇතිරිල්ලක් (ඉටි රෙදි රැගෙන ඒමෙන් වලකින්න.)
04.සියලුම පහසුකම් සමඟ ආහාර පාන නොමිලේ සපයනු ලැබේ.

ආරම්භක දිනය 2023.05.06
අවසාන දිනය 2023.05.11

අනුශාසක : එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර සමරතුංග මහතා
ගරු සභාපති : ආර්.එම්. ඉන්ද්‍රසෝම මහතා - 037 5687052
ගරු ලේකම් : පී. ජයරත්න මහතා - 077 4626053
ගරු භාණ්ඩාගාරික : සෙනරත් ශ්‍රී නන්දන මහතා - 077 6622390



ශ්‍රී ලාංකික බොදු බැති හදවත් සඳහම් සිසිලෙන් නැහැවූ - පුරා වර්ෂ 33ක අත්දැකීම් සම්භාරයක් ලද

# කෑගල්ලේ සාම චාරිකා

සමග විදේශ චාරිකාවක නිරත වෙමු

No : 142A/3, රෝයල් ගොඩනැගිල්ල කෙලින් වීදිය, කෑගල්ල
035 222 2041 | 071 042 3343 | 077 322 7188 | 071 181 3113

## අපගේ ඉදිරි චාරිකා

★ දඹදිව චාරිකාව
2023 අගෝ 08 - කොලඹ / දිල්ලි / චෙන්නායි / කොලඹ ගුවනින් - සාංචි කොසඹෑනුවර ඇතුලත්ය
සාංචි වැඳගෙන A/C දුම්රියේ චෙන්නායි වලට
සම්පූර්ණ අය කිරීම - රු 225,000/= (දින 16) A/C ප්‍රවාහන පහසුකම්

★ කඨිණ චාරිකාව - 2023 නොවැම්බර් (දින 17)
කොලඹ / චෙන්නායි / කොලඹ ගුවනින් - සාංචි කොසඹෑනුවර ඇතුලත්ය
බුද්ධගයාවේ / බරණැස කඨිණ පිංකම් සඳහා සහභාගී වීම
සම්පූර්ණ අය කිරීම - රු 210,000/= (දින 16) A/C ප්‍රවාහන පහසුකම්

★ **Super Luxury Dhambadiva Special Tour**
Colombo / Dellhi / Colombo by Air
A/C Transfers & Tours
Entry tickets to all buddhist monuments
3/4 Star Luxury deluxe hotels
All meals included
Departure - 2023 October
Rs. 390,000 only (negotiable)




විශේෂ චාරිකාව - පිටත්වීම 2023 දෙසැම්බර් 13 වන දින 17 රු. 435,000/= (අවම පිරිස 20කි)
දිල්ලි, කුල්ලු, මනාලි (හිම බැලීම), රාජස්ථාන් (ඇම්බර් පැලස් + සිටි පැලස් + හවා මහල් + ජල් මහල්), චන්දිගාර් (Rock Garrden + Suckna Lake නැරඹීම), Agra (Taj Mahal + Red Fort), ජායිපූර්, සමග දඹදිව චාරිකාව බරණැස සිට නවතම Super Fast Vande Bharat දුම්රියෙන් ආපසු නවදිල්ලියට

★ **Thai Tours - 6 Days / 5 Nights**

| | |
|---|---|
| ½ Day Temple Tour | A/C Transfers & Transport |
| Buddha Monthong | 3 Star Hotel |
| Nakhon Pathom | All meals included |
| Safari / Marine World | |
| Wat Dhammakai (භාවනා මධ්‍යස්ථානය) | |
| Dream World (Optional) | |
| Departure - 26th of December, 2023 | |
| Rs. 295,000 (All inclusive) | |

★ **Vietnam Tours - 7/8 Days**
Colombo / Hanoi / HoChi Minh / Colombo අභ්‍යන්තර ගුවන් ගමන් සහිතයි (Hanoi / Danang)
Hanoi (Presidential Palace / Ho Chi Minh Mausoleum - Outside / One Pillar Pagoda West Lake / Then Quoc / Old Quarter . Hoan Kiem Lake
Danang (Beach / Linh Ung Pagoda / Dragon Bridge Tran Thi / Han Market / Ba Na Hills / French Villas - කේබල් කාර් ගමන - ලෝ ප්‍රකට Golden Bridge
Halong Bay (පැය 5ක බෝට්ටු ගමන + දහවල් ආහාරය / ලෝක පූජිත ගුහා නැරඹීම)
Cu Chi Tunnel (වියට්කොං ගරිල්ලා සටන් තිබූ ප්‍රදේශය හා උමං මාර්ග)
Ho Chi Minh (Ben Thanh Market / Reunification Palace / Notre Dam Church Old Post Office + War Remnant Museum)
Departure - 23rd of September, 2023
Rs. 465,000 (All inclusive)

facebook.com/sama.charika/
ලි.ප අංකය : ආ.ක/සේ02/වන්දනා/35
(රජයේ හා බුද්ධ ශාසන අමාත්‍යංශයේ ලියාපදිංචි කර ඇත)

samacharik@yahoo.com
සිත්සේ - සුවසේ
නිදහසේ සාම චාරිකා සමග ලොව වටා ඇවිදිමු

# නිරෝගිමත් සඟ පරපුරක් සඳහා සෞඛ්‍යහිතකාමී දනයක් දෙන්න



වාරියපොල, කොළඹගම ශ්‍රී මියුගුණාරාම රාජමහා විහාරාධිකාරි, නේපාලයේ ලුම්බිණි නුවර ශ්‍රී ලංකා මහා විහාරයේ විහාරාධිපති, විචිත්‍රභාණී

## ආචාර්ය ගල්ලෑහැපිටියේ පේමරතන හිමි

**බෞද්ධයන් ලෙස අපි දන්දීමට කැමැතියි. මරණයක් සිදු වූ විට හත් දවසේ, තුන්මාසේ දනය දෙන්නට කිසිවකු අතපසු කරන්නේ නැහැ. ඒ වගේම ඇතැමුන් අවුරුදු පතා දන් දෙනවා.මාසිකව ගමේ පන්සලේ වැඩ සිටින ස්වාමින් වහන්සේට දනය පූජා කරනවා.**

වැඩිදෙනෙක් කරන්නන් වාලේ කළත් දානයක් පිරිනැමීමේ නියම අරුත සහ කුසල් සිදුවන අයුරින් දානයක් දෙන්නේ කෙසේද? ඒ සඳහා ආධ්‍යාත්මිකව සූදානම් වෙන්නේ කෙසේද? සෞඛ්‍යාරක්ෂිත දානයක් පිළියෙළ කරන්නේ කෙසේද? යන්න ගැන වර්තමානයේ බොහෝ දෙනකුට අවබෝධයක් නැහැ. ඒ පිළිබඳ කළ සාකච්ඡාවකි මේ.

### ස්වාමීන් වහන්ස, කුසල් සිදුවන අයුරින් දනයක් පූජා කිරීමේ දී ඒ සඳහා ආධ්‍යාත්මිකව සූදනම් වීම අවශ්‍යයි නේද?

දානය යනු දීමයි. බෝධිසත්වවරුන් බුදුවීම සඳහා පාරමීදම් පිරීමේ දී පළමුව සම්පූර්ණ කරන්නේ දාන පාරමිතාවයි.

මෙයට ආහාරපාන, ඇඳුම් පැළඳුම්, පොත්පත්, ගෙවල් දොරවල් ආදී ඕනෑම දෙයක් අයත් වෙනවා. මෙවැනි දන්දීම් බුදුදහමේ දැක්වෙන්නේ ආමිස දානය ලෙසයි. මේ හැරුණු විට ධර්ම දානය, අභය දානය ලෙසින් ද දානයේ තවත් ප්‍රභේද දැක්වෙනවා. නමුත් අපි මෙහිදී සාංඝික දානය පිළිබඳ විමසා බලමු.

සාංඝික දානයක් කරන්නන් වාලේ කිරීමෙන් ඵලක් නැහැ. ඒ සඳහා කරුණු තුනක් සම්පූර්ණ කරන්නට අවශ්‍යයි. ඒ ශ්‍රද්ධා සම්පත්තිය, චිත්ත සම්පත්තිය සහ දෙය්‍ය ධර්ම සම්පත්තියයි.

ශ්‍රද්ධා සම්පත්තිය – තෙරුවන් කෙරෙහි අතිශය පැහැදීමෙන් දානය පිරිනැමීම

චිත්ත සම්පත්තිය – සිත පහදාගෙන දන් දීමයි. එනම් ලෝභ,ද්වේෂ, මෝහ යන කරුණු දුරු කරගෙන දන් පිරිනැමීමයි.

දෙය්‍ය ධර්ම සම්පත්තිය – තමන් විසින් අනුන්ගේ දෙයක් කඩා වඩාගෙන හෝ පැහැර ගැනීමකින් තොරව දැහැමින් දහඩිය මහන්සියෙන් උපයාගත් දෙයකින් දන් දීමයි.

මේ අනුව අප දානයක් දෙනවා නම් ඒ සඳහා යම් ආධ්‍යාත්මික සූදානම්වීමක් අවශ්‍ය බව පැහැදිලි වෙනවා. එහෙම නම් දානය පිරිනැමීම කළ යුතු බවට නිවසේ සාමාජිකයන් සමඟ එක්ව තීරණය කළ අවස්ථාවේ සිට අඩුමගානේ පන්සිල් පද පහවත් ආරක්ෂා කර ගන්නට උත්සාහ ගන්නට ඕනේ.

### දනයට ආරාධනා කිරීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් තිබෙනවා ද ?

සාංඝික දානයක් පිරිනැමීමේ දී දානය පිළිගැන්වීමට බලාපොරොත්තුවන පන්සලේ නායක හාමුදුරුවෝ, පණ්ඩිත හාමුදුරුවෝ මුණගැහිලා දැහැත් වට්ටියක් පූජාකර ආරාධනා කරන්නට ඕනෑ. එහිදී අපි ආරාධනා කරන්නේ අතීතයේ වැඩි සිටි, වර්තමානයේ වැඩ වෙසෙන, අනාගතයේ වැඩ සිටින තුන් කාලයට ම අයත් සංඝයාට වහන්සේටයි. එහෙම නොකර දුවගේ පන්තියේ හාමුදුරුවෝ, පුතාගේ පාසලේ හාමුදුරුවෝ, බබා ලැබෙන්න කලින් පිරිත් කියපු හාමුදුරුවෝ ආදී වශයෙන් පුද්ගලික අභිමතාර්ථයන් අනුව දානයට ආරාධනා කිරීම සුදුසු නැහැ.

මේ හැරුණු විට ප්‍රතිග්‍රාහක සම්පත්තිය එනම් දානය පිළිගන්නා සංඝරත්නය පිළිබඳ සැලකීමේ දී හත් නමකට හෝ දහ නමකට ආරාධනා කිරීම සාමාන්‍ය සම්ප්‍රදායයි.

අද ඇතැම් පිරිස් දානයට වැඩම කරන හාමුදුරුවරු පෙරහරකින් කිලෝමීටර් භාගයක් පමණ ගිනි අව්වේ පයින් වඩමවනවා. එහෙම අවශ්‍ය නැහැ. ගෙදර මිදුලට වැඩම කළ පසුව බොහොම ශ්‍රද්ධාවෙන් පිළිගන්න. ගෞරවයෙන් දෙපා සෝදන්න. ඒක ගෙදර අය කරන්න. මහන්සියෙන් වඩින හාමුදුරුවන්ගේ පා තෙමෙන්නට අත්දෙකෙන් වතුර දාල පිහදාලා හැකි නම් පාවඩයක් මත වඩමවන්න. ඉන්පසුව ආසනවල වඩා හිඳුවන්න. පුරාණ කාලයේ නම් බිම කොට්ටදාලා ඉඳගත්තේ. නමුත් දණහිස් අමාරු තියෙන වයසක ස්වාමීන් වහන්සේට ඉඳගත්තොත් නැඟිටින්න බැහැ. ඒ නිසා උස් ආසනයක වඩා හිඳුවන්න. එයයි උත්තරීතර පිළිගැනීම

### දනය පිළිගැන්වීමේ දී භික්ෂූන් වහන්සේට ගෞරවය පිරිනැමෙන ලෙස එය සිදුකරන්නේ කෙසේ ද ?

දන්දීමේ දී සැලකිලිමත් විය යුතු තවත් කරුණු කිහිපයක් බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබෙනවා. මනා ලෙස සකස් කර දානය පූජා කිරීම, ගෞරව සම්ප්‍රයුක්තව දානය පූජා කිරීම, අහක නොදමන දෙයක් දන්දීම, කර්ම කර්මඵල විශ්වාසයෙන් යුතුව දන් දීම.

අද සිදුකෙරෙන දානමය පින්කම්වල මේ කරුණු සම්පූර්ණ ද කියන එක ගැටලුවක්. අද සමාජයේ දානය ප්‍රදර්ශනාත්මක දෙයක් බවට පත් වෙලා. එදා විශාඛා උපාසිකාව සේවිකාවන් සමඟ කරටකර වෙහෙසෙමින් දානය පිළියෙළ කළා. ලස්සනට, පිළිවෙලට, පිරිසුදුව සකසා දුන්නා. තමන්ගේ අතින්ම දානය පූජා කළා. නමුත් අද කරඬුව වැඩමවන්නේ දන් ගෙදරට පිටින් ආව කෙනෙක්. පා සෝදන්නේ පිට නිවසක ළමයි දෙන්නෙක්. දන් පිළිගන්වන්නේ දානය උයපු අය නොවෙයි. දානය උයපු අම්මලා පිලිකන්නට යවලා දන් පිළිගන්වන්නේ කවුද? එදා දන් ගෙදරට ආව අමුත්තෝ. නියපොතු පාට කරල, ඇහිබැම ඇඳල, බෝරිච්චි හැට්ට ඇඳල ආව නෝනලා සහ එයාලගේ මහත්වරු, "මොනවද මේ බෙදන්නේ කියලා ඇහුවම "ස්වාමීන් වහන්ස මේව හරි ගුණයි, බිම්මල් කියනවා. වළඳනකොට කරවිල බැදුම. මේ උදවිය දන්නේ නැහැ දානයට මොනවද පිළියෙල කළේ කියලවත්

### ස්වාමීන් වහන්සේ සඳහා සෞඛ්‍ය සුරැකෙන දන්වේලක් පිරිනැමීමත් අත්‍යවශ්‍යයි නේ ද?

මහා සංඝරත්නයේ සෞඛ්‍ය ගැන හිතලා දන් පිරිනැමීම ඉතාම හොඳයි. ඒ මොකද ස්වාමීන් වහන්සේලා බහුතරයක් දැන් රෝගීන් බවට පත් වෙලා ඉන්නේ.

තෙල්, ලුණු, සීනි අධික ආහාර මෙන්ම පිටි සහිත ආහාර සීමාව ඉක්මවා ගැනීම වගේම ක්‍රියාශීලි නොවන ජීවන රටාවක් ගත කිරීම නිසා බෝ නොවන රෝග වැළඳීමේ ප්‍රවනතාව වැඩි බව වෛද්‍යවරු පවසනවා. අපේ ස්වාමින් වහන්සේ හීල් දානය සහ දහවල් දානය පමණයි වළඳන්නේ. අපේ දායකයෝ බොහොම රසවත්ව විවිධ කෑම වර්ග හදල පිළිගන්වනවා. ඒක බොහොම ශ්‍රද්ධාවෙන් කරන්නේ. ඒත් තෙල්, සීනි, සහ ලුණු වැඩිපුර යොදා රසගන්වන ලද ආහාර වැඩිපුර අනුභවය උන්වහන්සේගේ නීරෝගී භාවයට තර්ජනයක්. වැඩිහිටි මෙන්ම තරුණ භික්ෂූන් වහන්සේ දියවැඩියාව, හෘද රෝග, අධිරුධිර පීඩනයට ගොදුරු වෙමින් පැවතීම මේ තත්ත්වයට හොඳම සාධකයක්.

මේ නිසා බුදුසරණ පුවත්පත මඟින් වටිනාම සංකල්පයක් හදන්න නිරෝගිමත් සඟ පරපුරක් වෙනුවෙන් දානය පිරිනැමීමට කාබනික පොහොර යෙදූ ගෙවත්තක් සාදා ගැනීමට. ගම් පළාත්වල මේ ක්‍රමය දැනටමත් ක්‍රියාත්මකයි. ස්වාමීන් වහන්සේට ගුණ අල වර්ග, බතල, මඤ්ඤොක්කා , පලා වර්ග, පලතුරු වර්ග මේ ගෙවත්තේ හදාගන්න පුළුවන්. මේ ආහාර ඉතාම ගුණදායකයි. නමුත් දැන් මේවා පූජා කිරීම මදිකමක් කියලා සිතනවා. ඒ වගේම පලතුරු පිළිගන්වන විට කැබලිවලට කපලා ඒ වෙලාවේ වළඳන්න පුළුවන් විදියට පූජා කරන්න. ප්ලාස්ටික් වට්ටියට දාල ඉටි කොළයෙන් වැසූ පලතුරු කූඩ පූජා කරන්න එපා. ඒක තායිලන්ත ක්‍රමය . අපට ඒවා ගැලපෙන්නේ නෑ. ඒ වගේම නිර්මාංශ දන්වේලක් යන සංකල්පයෙන් බැහැර වෙන්න. ස්වාමින් වහන්සේලා කැමති අය නිර්මාංශ වෙයි. අකැමැති අය මස් මාංශ වළඳයි.

වර්තමානයේ සාංඝික දානයේ මුවාවෙන් සිදුකෙරෙන ආහාර නාස්තිය ගැනත් කතා කළ යුතුමයි. බත් ඇටයක්වත් විසිකිරීම අවාසනාවක්, සාපයක්. ස්වාමින් වහන්සේගෙන් මම නමස්කාර පෙරටුව ඉල්ලන්නේ වළඳන්න පුළුවන් ප්‍රමාණය පිළිගන්න. ඒ වගේම දායක පින්වතුනුත් ස්වාමින් වහන්සේ අත වැහුවොත් පිළිගන්වන්න එපා.

### පිරිකර පූජා කිරීමේ දී ඊට වටිනාකමක් දිය යුතුයි නේද?

අද ඇතැම් අටපිරිකරවල ප්‍රමිතියක් නැහැ. ඒ නිසා මම දායක පින්වතුන්ගෙන් ඉල්ලීමක් කරනවා, දානයට පෙර පන්සලට ගිහින් ස්වාමීන් වහන්සේගෙන් අහන්න පිරිකරවලට මේ වෙලාවේ ලොකු මුදලක් වියදම් කරන්න අමාරුයි. මේ වගේ මුදලක් නම් වියදම් කරන්න පුළුවන්. ඒ සඳහා සුදුසු මොනවාද? කියලා. එහෙම නැතිනම් කියන්න ස්වාමීන් වහන්ස, මම මුදල් දෙන්නම් ගැළපෙන පිරිකරක් ගෙනත් දෙන්න කියලා. මේ ආකාරයට සාම්ප්‍රදායිකව පුංචි පිරිකරක් පූජා කරලා උන්වහන්සේගේ එදිනෙදා අවශ්‍යතා වෙනුවෙන් මුදල් කවරයක් පූජා කරන්න.

පිරිසුදු චේතනා ඇතිව සංඝයා වහන්සේ උදෙසා ඉහතින් සඳහන් කළ ආකාරයෙන් දානය දුන්නොත් කල්ප සිය දහස් ගණනක් සැප විපාක ලැබෙනවා. දෙවියන් අතර, ශ්‍රේෂ්ඨ දෙවියකු වීමට, මිනිසුන් අතර, ශ්‍රේෂ්ඨ මිනිසකු වීමට, සමාජ සම්භාවනාවට ලක්වීමට, නිරෝගිමත් පූර්ණ ආයුෂයක් වින්දනය කිරීමට හැකි වෙනවා. ශ්‍රද්ධාවෙන් දන් දීපු අය කවදාවත් සතර අපායට වැටෙන්නේ නැහැ. සශ්‍රීක දිව්‍ය තලයක ම උප්පත්තිය ලබනවා.

අයන්ති විතාන
ඡායාරූපය - සුදත් නිශාන්ත

සිතින් අතහැර සතුටින් දන් දෙන්න

## ආරාධනය

කතරගම වන්දනාවේ පැමිණියාම පෙරගිරිගම, රුමස්සල පන්සල නවාතැනට හොඳයි. කල්තියා දන්වන්න.

0772774056

## කෙටි තාප්පයක්

කතරගම රුමස්සල පන්සලට අඩි හැටක් පමණ දිග තාප්පයක් සාදවා දිය හැකි නම් හරිම වටිනවා. මියගිය අයටත් පිං.

0772774056

## උපස්ථායකයෙකු සහ පැවිදිවීමට අය අවශ්‍යයි.

ගාල්ල දිස්ත්‍රික්කයේ විවේකී ආරණ්‍ය සෙනසුනකට 60 ට අඩු

077 - 0244515

**ස්වාමීන් වහන්සේලා දෙනමකට වසර 3 ක් පමණ වැඩ සිටීමට ස්ථානයක් දකුණු බස්නාහිර පළාත් වලින් සොයයි.**

0767827342

කාන්තාවක් සමග සිටීමට නිරෝගී කාරුණික පිතට කැමති පවුල් බරින් තොර 60 අඩු, වැටුපක් බලාපොරොත්තු නොවන කාන්තාවක් සොයමි. පවුලේ කෙනෙකු මෙන් සලකමි.

Tel : 071- 5767512

මාතරට නොදුරු විහාරාංග සම්පූර්ණ, සියලු පහසුකම් සහිත විහාරස්ථානයකි.
ආගමික වැඩ හොඳින් කළ හැකි සියම් නිකායේ උපසපන් හිමිනමකට ස්ථිරව පවරා දෙනු ලැබේ.
උපසම්පදා සහතිකයේ පිටපතක් ඇතුලු සියලු විස්තර එවන්න.

**10002, බුදුසරණ බාරේ**
**ලේක්හවුස්, කොළඹ.**

ගල්ගමුව පිහිටි ආරණ්‍ය සේනාසනය හා ආරාමය සඳහා මනා ගති පැවතුම් ඇති කැපකරු මහතෙකු හා මහත්මියක් අවශ්‍යයි.

උතුම් පැවිදි භාවය ලබන්න කැමති ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයටම ද මෙහි අවකාශ ඇත.

078 - 5462586

## පෝය දින විශේෂ භාවනා වැඩ සටහනක්

ප්‍රයෝගික භාවනා සහ බුද්ධ ධර්ම ඩිප්ලෝමා භාවනා පෝය දින පැවැත්වේ.

(පෙ.ව. 8.30 – 3.30 දක්වා)

**මනෝදය භාවනා අසපුව**

**සිරිවර්ධනාරාමය, පන්සල පටුමග, කොල්ලුපිටිය.**

**විමසීම් : 0779260912**

## දැන්වීමයි

වසර 30 පටන් පූජා කටයුතු කරන අටවිසි බුදු මැදුර දහම් පොත් රාශියක් සහ වෙළද පොත්, ජ්‍යොතිෂ පොත් 100 ට ආසන්න ප්‍රමාණයක් බුදු සසුනට පූජා කිරීමට බලාපොරොත්තුවෙමි. වඩාම සුදුසුකම් ඇති භික්ෂූන් වහන්සේ නමක්, සිල් මාතාවක් හෝ වගකිවයුතු ආයතනයක් විමසන්න. දැනට මෙය පාලනය කරන අය වයස්ගත තත්ත්වයට පත්වීම හේතුවයි. බලාපොරොත්තුව රැකවරණය සහ සෞඛ්‍ය පහසුකම්. (මේ අතර අංගසම්පූර්ණ නිවස සහ ඉඩමද ඇත).

ටෙලි : 0773295474 / 077-9853618

**(මුළු දිවයිනටම සාම විනිසුරු - ජ්‍යොතිෂවේදී)**
**ලි.ප. අංක - ගා/10/1171, සේවය ආරම්භක දිනය - 1975/07/19**
**(මෙහි රැඳී සිට අප සමග සේවය කිරීමට කැමති අයෙකු අමතන්න.)**

## පැවිදි වත පතයි....!

**කාරුඤ්ඤං කත්වා**
**මයං කාසාවං දත්වා**

පඤ්ඤ බුද්ධිය උසුලන මනා ශක්‍යතා පිරි හතලිස් පස්වියෙහි පසුවන කුඩාකල උපැවිදි වූ අවිවාහක ඉතාම නිරෝගී තුරුණු මා, මාපියන් වියෝවූ මාගේ දිවියට අත්වැලක් ලෙස ආර්යය මාර්ගයට නිදහසේ යොමුවිය හැකි පහසුකම් සැලසිය හැකි විවේකී ස්ථානයක කල්‍යාණ මිත්‍ර වූ තනි ගුරුපිය සෙවණක් සොයමි.

ඉක්මන් පැවිද්දක් පතමි.

**දු. අ. 077-6507492**

## අපගේ සංගමය මගින් පාලනය වන ගාස්තු අය නොකරන කාන්තා වැඩිහිටි නිවාසයට නේවාසික මව්වරුන් බඳවා ගනු ලැබේ.

භාරකරුවකු සිටින තමාගේ කටයුතු තනිවම සිදුකර ගැනීමට හැකි ආබාධ නොමැති නිරෝගී මනසක් ඇති මාතාවන් තමාගේ විස්තර සහිතව නම, ලිපිනය, දුරකථන අංකය සහිතව ලිපියක් එවන්න.

**ගරු ලේකම්, කඩවත තරුණ බෞද්ධ සමිතිය,**
**176 බෞද්ධ සමිති මාවත,**
**රාගම පාර, කඩවත.**

## රත්නදීප සංචාරකයෝ

**ලාඕස් – සිංගප්පූරු**
දින 10 – රු.554,000

**කාම්බෝජියා – වියට්නාම්**
දින 10 – රු.527,000

**තායිලන්ත – සිංගප්පූරු**
දින 08 – රු.482,000

**ඩුබායි – සාජා – අබුඩාබි**
දින 07 – රු.482,000

විමසීම් : 077 245 9637 / 011 280 7374
327/1, 1/1, නාවල පාර, නාවල

රජයේ ලියාපදිංචි අංකය : W/202063

**සිත පිරිසිදු බෞද්ධයා අනවින ප්‍රේත භූත බහිරව ග්‍රහ අපලවලට බිය විය යුතු නැත බුදුසරණින් සියලු ගැටලුවලට විසඳුම්**

**දයාබර හිතවත,**

ඉහත සඳහන් කරුණු නිසා හෝ විවාහය ඉටු නොවීම ඇතුළු නිවසේ පවතින සියලු දෙස් දුරු කර ගැනීම සඳහා කේන්දර පිටපත සමග දිනයක් ලබාගෙන මා හමුවන්න. පිරිත් සූත්‍ර 10 කින් දස දහස් වාරයක් පිරිත් කළ හඳුන් තෙල්ද, සූරද ඇත. අය කිරීම මෙම කටයුතු ඉටුකරන අටවිසි බුදු මැදුරේ විදුලි ආලෝකපූජාවට පමණි.

පී.ජී.සී.ද සිල්වා
මුළු දිවයිනටම සාම විනිසුරු
ලි.ප. ගා/10/1171 සේවය ආරම්භය 75/7/19

දිනකට තිදෙනෙකුට පමණයි...
අසරණ අයට නොමිලේ ඉටුකරගත හැකිය.

**0779 85 36 18 / 0773 29 54 74**

## අනුරාධපුර පූජා නගරයේ පිහිටි යෝගාශ්‍රමයේ

**දැනට නේවාසිකව නතරවී බණ භාවනා ආගමික කටයුතු කරන වැඩිහිටි මාතාවක් සමග**

**ආගමික කටයුතු කිරීමට කැමති වැඩිහිටි මාතාවකට ආරාධනා.**

**කෑම බීම ඉඳුම් හිටුම් සියල්ල සැපයේ.**

071-6811135, 0777-698158, 025-2223427

## දඹදිව වන්දනා චාරිකා

## "බුද්ධ දේශය දැකීම - බුදුන් දුටුවා වැනිය"

සනාථ කරමින් ගෞරව සම්මාන රැසකින් පිදුම්ලත් රාජ්‍ය සේවා විශ්‍රමික ඉංජිනේරු විජයසිංහ වත්තේවැව මහතා 143 වන වතාවට සංවිධානය කර මෙහෙයවන **"බුද්ධ භූමි"** වන්දනා චාරිකාවට සම්බන්ධවී සිදුහත් උපතේ සිට බුද්ධ පරිනිර්වාණය දක්වා සම්මා සම්බුදු රජාණන් වහන්සේ වැඩවිසූ, දම්දෙසූ සැරිසැරූ පාදස්පර්ශය ලැබූ සියලුම සිද්ධස්ථාන බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව දැකබලා, වැඳපුද දානමාන ශීල, බණ, භාවනා බෝධිපූජා, ආලෝක පූජා ආදී පුණ්‍ය වතාවත් නිසිසේ සහ රිසිසේ ඉටුකර දුඃ ඛිත මිනිස් භාවයෙන් මිදී නිවන් අවබෝධ කර ගන්න.

**දැකපුදා දඹදිව – මෙනෙහි කර අප බුදු රුව**
**ලැබ කුසල් නොඅඩුව – අරිමු නිවනෙහි රුවන් දොරටුව**

**චාරිකා අංක 143** - 08-09-2023 දින ආරම්භ කෙරේ (සාංචි සමග) කාලය දින 16 චාරිකා ගාස්තුව රු. 230,000/-(සියලුම වියදම් සඳහා) කොළඹ - චෙන්නායි, නවදිල්ලිය - කොළඹ ගුවනින්

**චාරිකා අංක 144** - 20-10-2023 දින ආරම්භ කෙරේ (සාංචි සමග) කාලය දින 15 චාරිකා ගාස්තුව රු. 245,000/- (සියලුම වියදම් සඳහා) කොළඹ - නවදිල්ලිය - කොළඹ ගුවනින්

**සැලකිය යුතුයි : ඩොලරයේ අගය මත චාරිකා ගාස්තු සංශෝධනය විය හැකි බව කරුණාවෙන් සලකන්න.**



**විජයසිංහ වත්තේවැව,**

**ශ්‍රී ලංකා භාරත සංචාරකයෝ**

**තෙල්වත්ත හන්දිය, මීගමුව / 53ඒ, 4වන පටුමග, ගොඩගේ මාවත, අනුරාධපුර.**

**ටෙලි : 0777 - 876241 / 070 - 3829009 / 025-2222392**

කුරු/ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 41 ග්‍රාම නිලධාරී වසමේ

## කපුහේනේගම ශ්‍රී ශාක්‍ය සිංහාරාම විහාරස්ථානයේ

**අභිනවයෙන් ඉදිකෙරෙමින් පවතින නව ධර්මශාලාව හා දහම් පාසල් ගොඩනැගිල්ලෙහි වැඩ කටයුතු නිමකර ගැනීම සඳහා**

සුපින්වත් ඔබ සැමගේ බැතිබර දායකත්වය ගෞරවයෙන් අපේක්ෂා කර සිටින්නෙමු.

**තවද 2023 වර්ෂයේ කඨින චීවර පිංකම භාරගෙන**

වැඩකටයුතු සිදු කිරීමට කැමති සුපින්වතකු සිටීනම් පහත සඳහන් දුරකථන අංකයට විමසන්න.

මෙයට,
විහාරස්ථ දායක සභාව.

071- 6660234
විහාරස්ථාන හිමි.



# සැප කැමැති නම් නැවත නැවත පින් කරන්න

**සියලු ජීවීන්ගේ මූලික අපේක්ෂාව සැපවත් ජීවිත ගත කිරීම වන අතර නිරන්තරයෙන් ම දුක ප්‍රතික්ෂේප කරන බව, එය පිළිකුල් කරන බව බුදුදහම අවධාරණය කරන්නේ ය.**

තථාගතයන් වහන්සේ ලොව පහළ වන විට තත්කාලීන සමාජය සැප ලබා ගැනීම සඳහා අනුගමනය කරන ලද ක්‍රම දෙකක් පිළිබඳ සඳහන් වන අතර අත්තකිලමථානු යෝගය හා කාමසුඛල්ලිකානු යෝගය වශයෙන් ඒවා නම් කොට තිබිණි. භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනයේම මෙම ඉගැන්වීම් බැහැර කරන ලද්දේ මතු නොව උපරිම සැපය ලැබීම සඳහා නම් එම අන්තගාමීත්වයෙන් බැහැර විය යුතු බව ද දේශනා කළහ.

බුදුදහමින් ඇගයුම් කරනුයේ සදේවක ලෝකයා ම සැපවත් ජීවිත ගත කිරීමයි. ඊට අදාළ වන දේශනාවන් මුළු ත්‍රිපිටක ධර්මය පුරාම දක්නට ලැබේ. සැප යනු විඳීමක් වන අතර එය කායික හා මානසික වශයෙන් ආකාර දෙකකි. එහිදී ඇස කන නාසය ආදී පසිඳුරන් රූප ශබ්ද ආදි අරමුණුවලින් ලබන සුවය සැපයක් ලෙස සැලකේ.

එසේම සන්තානගත සිතුම් පැතුම් සිතූ පැතූ අයුරින් ඉටු කර ගැනීම ද සැපයක් කොට ගැනේ. කෙසේ නමුත් මෙම වින්දනීය ස්වභාවය පිළිබඳ පටිච්චසමුප්පාදයෙහි අවස්ථා තුනක් පිළිබඳ සඳහන් කොට තිබේ. සුඛ වේදනා, දුක්ඛ වේදනා, උපේක්ඛා වේදනා ලෙස ඒවා සංඛ්‍යාත්මකව සාකච්ඡා කොට තිබේ. වින්දනීය ස්වභාවය අනුව පරම සැපය ලෙස නිවන් සැපය පිළිබඳ සඳහන් කරනුයේ "නිබ්බානං පරමං සුඛං" යනුවෙනි.

සැපය පිළිබඳ බුදුදහමෙහි ඉගැන්වීම් රාශියකි. සැපයෙහි අගය විවිධ කෝණයන් ඔස්සේ ශ්‍රාවක ශ්‍රාවිකාවන්ට සමීප කොට ඇති අයුරු ද දක්නට ලැබේ. ඒ අනුව සමස්තයක් ලෙස සැපය මූලික වර්ග කිරීමකට ලක් කරමින් එහි ප්‍රභේද දෙකක් දක්වා ඇත්තේ මෙලොව සැප ලෙසත් , පරලොව සැප ලෙසත් ය. සැපය පිළිබඳ බුදුදහම කෙතරම් ප්‍රබලව විමර්ශනය කොට ඇත්තේ ද යන්න මින් ඉතාමත් පැහැදිලි වේ. එපමණක් නොව සැපය පිළිබඳ තම ශ්‍රාවක ශ්‍රාවිකා පිරිස් දැනුවත් කිරීමේ දී සමාජීයමය ඉගැන්වීමක් ද ධර්මයෙහි පෙන්නුම් කොට ඇත.

ගිහි සුඛ හෙවත් ගිහි සැප ලෙසත්, පබ්බජ්ජ සුඛ, පැවිදි සැප ලෙසත් දක්වා ඇත.

ගිහි සමාජයෙහි ගෘහස්ථ පුද්ගලයකු වශයෙන් පසිඳුරන් පිනවමින්, මිල මුදල් පරිහරණය කරමින් පෞද්ගලිකව භෞතිකමය අවශ්‍යතා සපුරා ගනිමින් සමාජගත පුද්ගලයකු ලෙස විඳිනු ලබන සැපය කෙසේවත් දහමින් ප්‍රතික්ෂේප කරනු නොලබයි.

පැවිදි සැපය වඩාත් අගය කෙරේ. "බ්‍රහ්ම චර්යක" හෙවත් පිළිවෙත්වලට එළැඹෙමින් ගත කරනු ලබන ආකාරයත් උතුම් වූ තම පැවිදි ජීවිතය පිළිබඳ සිතා බලමින් අත්විඳින වින්දනීය සුවය පැවිදි සුවය ලෙස විස්තර කොට තිබේ.

මෙසේ සැප පිළිබඳ, ඉතා පුළුල් විග්‍රහයක යෙදෙන ත්‍රිපිටක සාහිත්‍යය විවිධ මානයන් පාදක කොට ගනිමින් එහි ඇති අගය විස්තර කොට ඇති අයුරු දැකගත හැකි වේ. ඒ අනුව පුද්ගලයකුට සැප වින්දනය කළ හැකි තවත් සිව් ආකාරයක් පිළිබඳව ද තොරතුරු දැක්වේ එම සැප මෙලොව දී ලැබිය හැකි සැප ලෙස දක්වා ඇත.

ඒවා "අත්ථි සුඛ, භෝග සුඛ, අනන සුඛ හා අනවජ්ජ සුඛ" වශයෙන් ද දක්වා තිබේ. තම ජීවිතය තුළ යමක් උපයා සපයා ගෙන ඇතැයි සිතා සතුටු වීම සැපයක් වශයෙන් දැක්වේ. එම උපයාගත් ධනය නිවැරැදි වූ ත් දැහැමි වූ ත් ක්‍රමෝපායන් මගින් උපයා ගත්තේ යැයි සිතීමෙන් ලබන සතුට දෙවැනි සැපය ලෙස සඳහන් වේ. එපමණක් නොව එම නිවැරැදි වූ ධන ධාන්‍ය පරිභෝජනයෙන් ලබන සාතිශය සොම්නස පිළිබඳ ද එම සැපයෙහි කරුණු ප්‍රකාශිත ය. එය තවත් ලුහුඬින් දැක්විය හැකි වන්නේ ලබන ලද සම්පත් තම අවශ්‍යතා සඳහා භාවිත කිරීම හෙවත් සම්පත් සුව සේ පරිහරණය කිරීමෙන් ලබන සැපයයි.

පුද්ගලයකුට හෝ මූල්‍ය ආයතනයකට ණයක් නැති නම් එය අසීමිත සැපයක් ලෙස දහමින් ප්‍රකාශ කෙරේ. මෙහි තෙවන සැපය ලෙස දක්වා ඇත්තේ එසේ ණය නොවී ජීවත්වීමේ සුවදායක ජීවිත පිළිබඳව ය.

එසේම ඕනෑම පුද්ගලයකුට තම ජීවිතය පිළිබඳ ආපසු හැරී බැලීමේ දී තමා විසින් ගෙවන ජීවන මාර්ගය හෙවත් ජීවනෝපාය ක්‍රමය, උපයන ලද ධන ධාන්‍යවල නිවැරැදිතාව ය පිළිබඳ සිතා සතුටු වීම සාමාන්‍යයෙන් සැපයක් නොවේ. සාවද්‍ය වූ ක්‍රියාවන්ගෙන් බැහැරව ක්‍රියාත්මක තම දිවිමඟ නිවැරැදි වූවක් යැයි සිතා බැලීමෙන් ලබන සුවය සිව් වැනිව සඳහන් කොට ඇත.

මේ හැරෙන්නට සාමිස පමණක් නොව නිරාමිස ලෙසින් ද සැපය පිළිබඳ ධර්මයෙහි විස්තර කෙරේ. මෙම සියලු සැප සඳහා පින් රැස්කර ගැනීම කළ යුතු බව ධර්මයෙන් අවධාරණය කෙරේ.

සැපය සඳහා මූල සාධකය වන පුණ්‍ය ධර්මයන් සිදු කිරීමේ දී එය නැවත නැවතත් සිදු කළ යුතු ආකාරය ධම්මපද පාළියෙහි පාප වග්ගයෙහි දක්වා ඇත්තේ

**පුඤ්ඤං චේ පුරිසෝ කයිරා -**
**කයිරාථෙ තං පුනප්පුනං**
**තම්හි ඡන්දං කයිරාථ -**
**සුඛෝ පුඤ්ඤස්ස උච්චයෝ**

යනුවෙනි.

කිසියම් පුද්ගලයකු ත්‍රිවිධ පුණ්‍ය ධර්මයන් හෝ දස මහා කුසල ධර්මයන් ආදී වශයෙන් සඳහන් මහත් පින්කම් කිරීමේ දී එය එක වරකට පමණක් සීමා කොට නොගෙන යළි යළිත් එහි නිරත වීමේ අගය හා ඉන් ලැබෙන ස්වර්ග මෝක්ෂ සම්පත් පිළිබඳ මින් අනාවරණය කරනු ලැබේ.

මෙහි "පුඤ්ඤං" යනුවෙන් සඳහන් කොට ඇත්තේ දාන සීල භාවනා දී ත්‍රිවිධ පුණ්‍ය ධර්මයන් දාන, සීල, භාවනා මෙන්ම පින් දීම පින් අනුමෝදන් වීම පමණක් නොව බුහුමන් දැක්වීම, වතාවත් කිරීම ධර්ම දේශනය, ධර්ම ශ්‍රවණය කිරීම සහ දිට්ඨිජු බව යනුවෙන් සඳහන් වේ. මේ හැරෙන්නට ප්‍රාණඝාත, අදත්තාදාන කාමමිථ්‍යාචාර, මුසාවාද, පරුසාවාච, සම්පප්‍රලාප, අභිධ්‍යා ව්‍යාපාද මිත්‍යා දිට්ඨි යන දස අකුසල ධර්මයන්ගෙන් තොර වී දස කුසල ධර්මයන් සපුරා ගැනීම ද කළ යුතු ය. "පුඤ්ඤස්ස උච්චයෝ සුඛෝ" යන්නෙන් අර්ථවත් කෙරෙනුයේ සිදුකරනු ලබන කුසලයෙන් ලැබෙන අසීමිත සැප සිහිපත් කරමින් නැවත නැවතත් පුණ්‍ය ධර්මයන්හි යෙදිය යුතු ය යන්නයි.

දෙලොවදීම අප්‍රමාණ සැප ලබා නිවන් සුව සාධනය තුළින් පරම සැපය සාධනය කර ගන්නා ආකාරය පිළිබඳව ය.


මෙම තථාගත දේශනය සඳහා පාදක වී ඇති සිදුවීම ද කුඩා වූ පුණ්‍ය ධර්මයන්හි පවා දැකිය හැකි බල මහිමය ප්‍රකට කරන්නකි. සමවතින් නැඟී සිටි මහා කාශ්‍යප මහ තෙරුන් කවරකු සඳහා යහපත සලසන්නේ දැයි ලොව දෙස බලන ලද දිනයක ඉතා දිළිඳු ස්ත්‍රියක නෙත ගැටුණි. ඇය ඇල් හේනක පැල් රකින්නියකි. එදින හේනේ සිට ගෙන එන ලද ඇල් වී කරල් මිටියකින් විළඳ සකසමින් සිටි සැදැහැති උපාසිකාවකි. මහකසුප් මහ තෙරුන් එකෙණෙහි ම එම දිළිඳු උපාසිකාවගේ පැල්පත ඉදිරියට වැඩම කරන ලදී. කිසිදා උදා නොවූ සැපතක් උදා වී යැයි මහත් සතුටට පත් දිළිඳු උපාසිකාව පිරිසුදු සැදැහැයෙන් හා මහත් සොම්නසින් යුතුව තමා සඳහා පිළියෙළ කරන ලද විළඳ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට පූජා කරන ලද්දී ය.

සිදුකළ පින්කම පිළිබඳ නැවත නැවතත් මහත් සේ සතුටට පත් වූවා ය. සොම්නස් සිතින් සිදු කළ පින්කම සිහි කරමින් නැවතත් පැල් රැකීම සඳහා ගමන් කරන අවස්ථාවේ අතරමග දී සර්පයකු දෂ්ට කිරීමෙන් මියගියේ එකෙනෙහිම දෙව් ලොව උපත ලැබුවා ය.

තමන් ලද මහත් දෙව් සැප පිළිබඳ විමසා බැලීමේ දී තමා සිදුකළ විළඳ පූජා පින්කම දකින ලද්දේ ඊට මහත් කරුණාවෙන් මග සැලසූ මහා කාශ්‍යප මහ තෙරුන් පිළිබඳ අසීමිත ශ්‍රද්ධා භක්තියෙන් යුතුව මහ කසුප් මහ තෙරුන් වැඩ විසූ පුලිල ලෙනට පැමිණ විහාරයෙහි වත් පිළිවෙත් සිදු කිරීම සිරිතක් කොට ගත් ගන්නා ලදී.

දිනක් අලුයම් කාලයෙහි තමන් වහන්සේගේ කුටියට වැටෙන එළියක් දැක විමසන්නේ එහි රැඳී සිටි දෙවඟන පෙරදා උපාසිකාවක් ව සිට පුදන ලද විළඳ පූජාවෙහි පිනෙන් දෙව් සැපතට පැමිණි ලාජා දෙව්දුව යැයි පිළිතුරු ලැබීමෙන් පසු තම ආරාමයෙහි වත් පිළිවෙත් සඳහා නොපැමිණෙන ලෙස වාරණයක් පනවන ලදී.

මෙම නියමයෙන් ඉතා දොම්නසට පත්ව සොවින් තැවෙන ලාජා දෙව්දුව දුටු භාග්‍යවතුන් වහන්සේ දෙව්දුව ඉදිරියේ දර්ශනය වූයේ මතු නොව පින්කම් කිරීම යළි යළිත් කළ යුතු බවත්, ඒ සඳහා කැමැත්ත ඇති කර ගත යුතු බවත් එසේ සිදුකර ගන්නා පින සැපයට හේතු වන බවත්, දේශනා කරන ලද්දේ, දෙවඟන සෝවාන් ඵලයෙහි පිහිටියා ය.



කොළඹ 06, හැව්ලොක් සිටි,
සාමවිහාරාධිපති
**අතපත්තුකන්දේ ආනන්ද හිමි**

**මසැස තිබුණ ද නුවණැස නොවේ නම් හේ අන්ධයෙකි**

මෙවර කඨින මහා
පිංකම සඳහා අප දුෂ්කර
විහාරස්ථානයට අනුග්‍රාහක
පිංවතුන් අවශ්‍යයි.
077-8325775

**ධර්මධර භික්ෂුණියට
විවේකීව සිටීමට කුටියක්
පරිත්‍යාගය සඳහා ආරාධනා
පිංවත් ඔබට**
0773369360 / 0112059454

**වාද්දුව, තාවකාලිකව,
නැවතී සිටින තනිවූ,
අසරණවූ මා හට**
නිදහසේ ජීවත්වීමට, කුඩා කාමරයක් හෝ සුදුසු ස්ථානයක් ලබාදෙනමෙන් පින්වත් ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.
**076 3008529**

**කාගේවත් පිහිටක් නොලැබ
තනිවම ජීවත් වෙන
දහමට ලැදි
අවු. 55 - 65 අතර
කාන්තාවක් සොයමි.
අමතන්න**
0767195944

**කුඩා විහාරස්ථානයක්
පවත්වාගෙන යාමට
උපසම්පන්න තරුණ
භික්ෂුන් වහන්සේ නමක්
අවශ්‍යයි.**
T.P. 076-0431570

**75 වියැති මා
උඩරට වැදගත් පවුලක
මතින් දුමින් තොර අයෙකි.
අද වන විට ස්ථිර
නවාතැනක් නොමැත.
ඉදිරි ටික කාලයට නවාතැනක්
දීමෙන් ඔබතුමන්ලාට විශාල
පිංකමක පින් අත්වෙනවා
ඒකාන්තයි.**
071-1523916

**වකුගඩුවක් අවශ්‍යයි**
වකුගඩු රෝගියෙකුට හැකි ඉක්මනින් බද්ධකිරීම සඳහා A+ හෝ O+ වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය වී ඇත. පරිත්‍යාග කිරීමට හෝ ඒ සඳහා උදව් වීමට හැකි අයකු වේ නම් කරුණාකර අමතන්න.
**071 - 8777325**

**තායිලන්තයෙන් ගෙන්වන ලද**
අඩි 3 උස, අඩි 2 පළල, පිත්තල ඉදි පිළිමය හා අඩි 1 1/2 ක් උස අඩියක් පළල පිත්තල ඉදිපිළිම හා අඩි 4 1/2 දිග අඩි 2 1/2 පළල ශ්‍රී පතුල විකිණීමට.
**0718071009**

**පිරිවෙනක සිංහල විෂය
ඉගැන්වීම සඳහා
පැවිදි ගුරුවරයෙක්
අවශ්‍යයි.**
0707247941

**A නෙගටිව් A පොසිටිව්
O නෙගටිව් O පොසිටිව්
වර්ගයේ වකුගඩුවක්
ඉතා ඉක්මණින්
අවශ්‍යයි.**
කාරුණික පින්වතෙක්
අමත්න.
0775657622
**දුමින්ද**

**මවකට O පොසිටිව්
O නෙගටිව්
වර්ගයේ වකුගඩුවක්
ඉක්මණින් අවශ්‍යයි**
දාන පාරමිතා පූර්ණය වනු පිණිස වයස අවුරුදු 60 ට අඩු පරිත්‍යාගශීලී පිංවතකු සිටීනම් අමතන්න.
**0777 339051**
**මේ සඳහා උපකාරයක්
කළ හැක.**

**රාමඤ්ඤ නිකායික
විහාරස්ථානයක්**
විහාරාධිපතිත්වය හා නීත්‍යානුකූලව ලිඛිතව ලබා දීමට. කුලියාපිටියට ආසන්නව ඇත.
**071-0621666**

**මම ගුරුවරයෙක්මි.
වැඩිහිටි නිවාසයක් නිර්මාණය
කිරීමට සහය වීමට කැමති හා
මාගේ මව බලා ගැනීමට කැමති
අයෙක් විමසන්න.
වේතනයක් දෙනු ලැබේ.**
072-2759722

**උපසපන් හිමි නමක්
පන්සලක් සොයයි**
රත්නපුරය, බස්නාහිර
විශේෂයි.
0773281061 / 0715762499

**බෞද්ධායතනයක
ඉංග්‍රීසි භාෂා
උපදේශකයකු ලෙස
සේවයට කැමැත්තෙමි**
සහන / යැපීම් පහසුකම්
මත නතරවීමටද හැකිය.
**0742894095**

**රුවන්වැලි සෑය ළඟට
පාගමනින් විනාඩි 40
බසවක්කුලම - ගල්වලපාරේ
(ප.10.7) පිහිටි නිවස
විකිණීමට ඇත.
ස්වාමීන් වහන්සේ නමකට
ඉතාම සුදුසුයි.**
077-4328134, 071-3002861

**ඉතා දුෂ්කර පිරිවෙන්වල
අධ්‍යාපනය හදාරන**
සාමණේර ස්වාමින්වහන්සේලා සියක් නමක් වෙනුවෙන් පිරිනැමීමට නියමිත දාන පිංකමක් සඳහා පිංවත් ඔබ සැමගේ දායකත්වය ලබා දෙන්න.
**විහාරාධිපති හිමි
0773671680, 0754463779**

**පිංවතුණි**
වෙසක් පොහොයට පෙර අප විහාරස්ථානයේ චෛත්‍ය රාජයාණන් වහන්සේගේ තීන්ත ආලේප කිරීමට දායකත්වයක් ලබා දෙන්න.
**මෙයට, විහාරාධිපති හිමි
0773763779 / 0703161274**

**ගම්පහ මහ
පිරිවෙනකට
ගිහි / පැවිදි**
සංස්කෘත - පාලි - සිංහල විෂය සඳහා ගුරුවරුන් සහ රියදුරන් බඳවාගනු ලැබේ.
**0714467609 / 0332255611**

**අවුරුදු 57
දෙදරු පියෙක්**
පන්සලක් වත්තක් ගිලන් වුවද කම් නැත හිමි නමක් ළඟ රැකියාවක් සොයමි.
**076-0096623**

**පිණ්ඩපාතය පවා හිඟ
බැවින්
දන් පැන් සැපයීමට
හැකි පිංවතුන්
අමතන්න.**
077 - 8325775

**සැමදා නොමිලේ**
ඝාතනය කර ලබාගත් දෙයින් වැළකී 'නිර්මාංශිකව' සදහම් මග වඩන භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා සිව්වනක් පිරිසක් උදවීමෙන් සියලු සතුන්ට අභය දානය ලැබේවා! අවිහිංසා සම්බුදු සසුන චිරකල් යෙහෙන් බැබලේවා!
**සිරිලක මහා අවිහිංසා දහම් පදනම
ශ්‍රී ගුණරතනාරාම මහා විහාරය
අමිතිරිගල**
071- 7679254

**සාමවිනිසුරු ලේඛක,
දහමට ලැදි විශ්‍රාමික
ඉංග්‍රීසි ගුරුවරයෙක් දිගුකල්
නතරවීමට පන්සලක්,
පිරිවෙණක් හෝ සමාජසේවා
ආයතනයක් සොයයි.**
පන්සලේ අඩුපාඩු සඳහා
ආධාර උපකාර කළ හැක.
**0718906338,
0766934341**

**තිදරු පියෙකුට
B+ වර්ගයේ
වකුගඩුවක්
අවශ්‍ය වී ඇත.**
**0714481451**

**ගුණවත් පවුල්වල
මහණ වීමට කැමති
යහපත් දරුවන් සිටීනම් විමසන්න.**
**අධ්‍යාපන කටයුතු සඳහා විශේෂ වැඩපිළිවෙළක්ද සූදානම් කර ඇත.**
**මහින්දාරාමය : 0112-578520**

**1950 සිට
දිනපතා සහ
සතිපතා පත්‍රවල
පළවූ හා පළනොව
ඡායාරූපවල දළ
සේයාපට
පුස්තකාලයේ
තැන්පත් කර ඇත.
ඔබටත් ඡායාරූප
ලබාගැනීමට අවශ්‍ය
නම් පුවත්පතේ නම,
දිනය සහ
ඡායාරූපයේ විස්තර
සඳහන් කොට ලියා
හෝ පැමිණ
විමසන්න.**

**පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491**

LAKE HOUSE

**නිදහස් පරිසරයක පන්සලක් සොයයි
ආරණ්‍යවාසී ස්වාමීන් වහන්සේ නමක්
නිදහස් පරිසරයක පිහිටි පන්සලක්, කුටියක් හෝ
භාවනා මධ්‍යස්ථානයක් අපේක්ෂා කරයි.**
0779264792

**ජීවත් වීමට මිස රජ වීමට නොවේ
ඉතාමත් සාධාරණ මුදලට චෛත්‍ය,
බුදු පිළිම, දේව ප්‍රතිමා, විහාර සිතුවම්
නිම කර දෙනු ලැබේ.**
දුෂ්කර පන්සල් සඳහා මුල් තැන දෙමි.
076 - 3195173

**ජීවිතයක් බේරාගැනීම සඳහායි**
වකුගඩු රෝගියෙකු සඳහා 'O' පොසිටිව් වර්ගයේ
වකුගඩුවක් ඉතා ඉක්මණින් ඕනෑකර තිබේ
*ජීවිතයට ජීවයක් වෙමු !*
පින්වත් පරිත්‍යාගශීලියෙකු වේ නම් අමතන්න.
071-5455710 / 0773990881 / 0715872078

**මෙහෙණි සසුනට
ආරාධනා**
පැවිදි වී සිල් දම් පුරමින් වැඩ වාසය කිරීමට අනුරාධපුරයේ අළුතෙන් ඉදිවෙන මෙහෙණි ආරාමයට සැදැහැවත් පිංවතියන්ට ආරාධනා.
**විමසීම්** - 070 45 22 322
071 97 46 148

**ආරණ්‍යවාසී
උපසම්පදා ස්වාමීන්
වහන්සේ නමකට
විවේක කුටියක්
සාදාගැනීමට
සුදුසු බිම්කඩක්
පූජා කිරීමේ
පිංකමට
සම්බන්ධ වීමට
කැමති පිංවතුන්
කථා කරන්න.**
070-2576757

**කොළඹ
කුඩා පන්සලකට
උපස්ථායකයකු අවශ්‍යයි.
කෑම නවාතැන් තිබේ.
අමතන්න**
0718278764

**කවිබණ, ධර්ම දේශනා
විරිඳු, පිරිත්
අඩුම මිලට** Recordings
**කරනු ලැබේ.
ස්වර්ණ මධුරාගී :**
077-3253010

**විහාරස්ථානයක
පැවිදි කිරීමට අවුරුදු
20 හෝ ඊට අඩු නිරෝගී
කුල දරුවෙක් අවශ්‍යයි.
අමතන්න**
037-5688570
0782008700

**විශ්‍රාමිකයින්ට
නැවතීමේ කාමර
පහසුකම්**
දිනකට රු. 800/=
මසකට රු. 12,000/=
ඇවිදින දුරකි නගරයට,
කඩවත විශ්‍රාමිකයින්ගේ
නිවාසය.
071 - 8448559


**ගම්පහ නාරංවල
වික්‍රමසිංහාරාම
විහාරස්ථානයට**
අඩුවක්ව පවතින
ත්‍රිපිටකය පූජා
කිරීමට කැමති
පින්වතෙක් සිටී නම්
පහත දූරකථනයට
අමතන්න.
033- 2257952

# ගේ දොර සේ ම සිත ද පිවිතුරු කර ගනිමු සරල පැවතුමෙන් අර්බුද ජය ගනිමු

**ගහකොළ හරිත පැහැ සළු පළඳී. මල් පුබුදුවමින් ගවසා ගනී. විහඟුන් කැඳවා ගනී. වසන්තය අසිරියකි. එය මිනිසාට අලුත් පණිවිඩයක් දෙයි. එම පණිවිඩය එක් අතකින් සරල බව ය. අනෙක් අතින් සහජීවනය යි. ප්‍රධාන සහජීවනය මිනිසා හා පරිසරය අතර ගොඩනැඟේ. සමාජයේ සහජීවනය රැකෙන්නේ සංස්කෘතිය, සන්නිවේදනය හා සදාචාරය මත ය. මෙනිසා ම සූර්ය මංගල්ලයත්, ආගමික චාරිත්‍රත් යන දෙකෙන් ම දෙන සන්නිවේදනාර්ථය වටහා ගැනීම වැදගත් ය.**







ඕනෑම සමාජයක පැවැත්ම ඇත්තේ රජය පනවනු ලබන නීතිය මත නොව ඒ සමාජය විසින් පවත්වා ගෙන යනු ලබන සාරධර්ම මත බව සිංහල හා හින්දු අලුත් අවුරුදු චාරිත්‍රවලින් පිළිබිඹු වේ. අපේ සමාජය පරිසරයෙන් ඈත්ව, චාරිත්‍ර වාරිත්‍රවලින් බැහැරව, නෑ සබඳකම්වලින් දුරස්ව ගෙවන ජීවන රටාවේ අන්තයට ම පැමිණ ඇත. අර්බුදය ඇත්තේ ආර්ථිකයේ නොව චින්තනයේ ය.

ජීවිතයක ගත වූ දින තුන්සිය හැටපහක් ගැන පසු විපරම් කර තමාගේ යුතුකම් හා වගකීම් ඉටු කළේ ද යන්න සිතා බලා තවත් දින තුන්සිය හැටපහකට සූදානම් වීමට ආශිර්වාද ලබා ගැනීම ලෙස අපට අලුත් අවුරුද්දේ හරය හඳුන්වන්නට පුළුවන. සාම්ප්‍රදායික සමාජයේ නම් අලුතින් අස්වැන්න ගෙට ගෙනැවිත් ගේ දොර අලුත් වැඩියාකර, අලුතින් රසකැවිලි හදා, අලුත් ඇඳුම් ඇඳ ,මිතුරුකම් අලුත් කරගෙන ආදි වශයෙන් භෞතිකව හැම අතින්ම අලුත් වී අලුත් වසරට සැරසෙනු ඇත. නිර්මාණශීලිව භෞතික දේ අලුත් කරන්නා සේ ම මිනිසාගේ මනස ද අලුත් කිරීම අප මෙහි දී කළ යුතු දේ ය. මිනිසුන් ශරීරය පිරිසුදු කර ගෙන, ගේ දොර පිරිසුදු කර ගෙන කරන්නා වූ වෙනස මෙන් ම මනසත් අලුතින් පිරිසුදු කරන්න මෙම බක්මහ නිමිත්තක් කර ගැනීම අවශ්‍යය.

තමන්ට උපකාර කළ අයට කෘතවේදීත්වය දැක්විය යුතු බව බුදුරදුන් සත් සතිය ගත කිරීමෙන් පෙන්වා දුන් දෙයයි. එනම් අජීවි වස්තූන්ට පවා ජීවි පුද්ගලයින් ගරු කිරීමේ වැදගත්කමයි. ඒ ඇසුරින් අප ද අලුත් අවුරුද්ද ලබන අවස්ථාවේ දී පසුගිය වසරේ තමන් කළ හොඳ නරක ගැන චරිත සහතිකයක් තනාගෙන පෞරුෂය ගොඩනඟා ගැනීම කළ හැකි ය.

මේ අවස්ථාව ආදර්ශවත් පුද්ගලයකුට හැදෙන්න අවස්ථාවකි. නැතහොත් පසු විපරමක් හා පෙර විපරමක් කිරීමට හොඳ අවස්ථාවකි. ගස්වැල් දලු ලා සොබා දහම පවා අලුත් යුගයකට සැරසෙන මොහොතකි මේ. එය දාර්ශනික අදහස් ප්‍රකාශ කරන්නක් වේ. එනම් වෙලාවට වැඩ කිරීම, වෙලාවට අවදිවීම, අකුරුකීම, ආහාර ගැනීම ආදී කාලය හා අවකාශය ජය ගැනීම සඳහා මිනිසා පුරුදු පුහුණු කිරීමට දෙන අවස්ථාවකි.

කාල විපත්වලින් , රෝග බියෙන් හා අගහිඟවලින් හෙම්බත් වූ වර්තමානයේ අලුත් අවුරුදු චාරිත්‍රවලින් පිළිබිඹු කරන ඒ දාර්ශනික අදහසට අප අනුගත විය යුතු ය. අවුරුදු චාරිත්‍ර මාලාව පුරාම ඇත්තේ සොබා දහමට අනුගත ජීවන රටාව හා සොබා දහමේ ශක්තිය ජීවිතයට ළං කර ගැනීම යන කරුණු ය. රාවණා යුගයේ සිට ම මේ රටේ සූර්ය මංගල්ලය සමරා ඇති බව ඉතිහාසය කියයි. බුදු දහම ආසියාවේ ස්ථාපිත වීමත් සමඟ බෞද්ධාගමික නැඹුරුවකින් වඩාත් අර්ථවත් ව බක්මහ උළෙල සමරනු ඇත.

භව භෝග ඇති කලට කා බී විනෝදවීම පමණක් සුදුසු නොවේ. ඒ නිසාම සාගතයකට අත නොවනා, තමන් කරන කර්මාන්තය සිහියේ තබා ගැනීම හා එයට ප්‍රමුඛත්වය දී ම මෙහි අදහස ය. අනෙක් අතට තම වෘත්තියට ගරු කිරීම හා එහි අගය රැක ගැනීම මෙයින් කියයි.

එසේම පරණ අවුරුද්දේ වැඩ නිමා කරන්නේ ද තම වෘත්තියට අදාළ මෙවලම් සියල්ලට විවේකයක් දී ඒවාට පවා ගරු කිරීමෙනි. නැකතක් නොමැති වේලාව නොනගතයයි. නොනගතයේ දී වෙහෙර විහාරස්ථාන වෙත ගොස් ආගමික වතාවත්වල නියැළීමෙන් සිතේ සැනසීමත්, ආධ්‍යාත්මික ශක්තිය ලබා ගැනීමත් සිදුවේ. එමෙන්ම අන්තරායන්ගෙන් මිදීම ද ජ්‍යොතීර්වේදයට අනුව අදහස් වේ.

පරිසරයේ ඇති සියලුම ශක්තීන් සූර්යයාගේ ය. නැකතට ළිප ගිනි මෙළවීම සූර්යයාගේ ශක්තිය නිවසට කැන්දා ගැනීමකි. අතීත සමාජයේ ළිපේ ගින්දර නොනිමා තබා ගැනීම අවශ්‍යම කරුණකි. එය ආහාරවේළ හා බැඳී පවතින්නකි. ඒ පණිවුඩය අවබෝධ කර ගෙන අප අදත් ළිප හා ගින්දර ගැන ගෞරවයෙන් හා තිරසාර පදනමින් කටයුතු කළේ නම් වර්තමානයේ ගෑස්, විදුලිය වැනි අස්ථාවර බලශක්ති ප්‍රභවයන් මත මේ තරම් වද විඳින්නේ ද? ළිපක් තනා ගන්නට බැරි නිවසක්, දර කැබැල්ලක් කඩා ගන්නට බැරි ගෙවත්තක් තනාගෙන දුක් විඳී ද?

කෘෂිකාර්මික සමාජයේ වැඩ ඇල්ලීම යනු සොබාදහමට අනුව වගා කිරීම ය . අනෙක් අතින් ආර්ථික වර්ධනය වෙනුවෙන් කායික මානසික ශක්තීන් වැඩි කර ගැනීම ය. සිය වෘත්තියට ඇති වගකීම හා ගෞරවය ඉන් ප්‍රකාශ කෙරේ. සෑම කෙනකුම කෘෂි උපකරණවලින් කුමක් හෝ වැඩ කරන සමාජයක් නම් එම සමාජය ස්වයංපෝෂිත ය. අනුන් මත නොයැපෙන නිසා ඒ ඒ භෝගවල මිල ඉහළ යන විට පීඩාවට පත්වන තත්ත්වයන් ඇති නොවේ. අප හිරමණය, කැත්ත, උදැල්ල අමතක කළ ජාතියක් බවට පත්වී හමාර ය. ඒ නිසාම නාගරික යටිතල පහසුකම් අඩුවූ විට අප නිරන්තර අහාර හිඟයකට පත්වේ. දෛනික ජීවිතය කඩා වැටී සියල්ල අභියෝග යැයි සිතනු ඇත.

නැකතට ආහාර ගැනීම යනු සෘතුව අනුව ,ඖෂධීය ගුණය අනුව හා සෞඛ්‍ය සම්පන්න භාවය රැක ගැනීම අනුව පෝෂණය වීම ය. අලුත් අවුරුදු මේසයේ ආහාර පිළියෙළ කර ඇත්තේ ඒ සෘතුවට අදාළ ඖෂධීය ගුණ අනුව ය. කිරිබතට තල හෝ මුං ඇට ආදී ධාන්‍යයන් මිශ්‍ර කරන්නේ

> ළිපේ ගින්දර නොනිමා තබා ගැනීම අවශ්‍යම කරුණකි. එය ආහාරවේළ හා බැඳී පවතින්නකි. ඒ පණිවුඩය අවබෝධ කර ගෙන අප අදත් ළිප හා ගින්දර ගැන ගෞරවයෙන් හා තිරසාර පදනමින් කටයුතු කළේ නම් වර්තමානයේ ගෑස්, විදුලිය වැනි අස්ථාවර බලශක්ති ප්‍රභවයන් මත මේ තරම් වද විඳින්නේ ද? ළිපක් තනා ගන්නට බැරි නිවසක්, දර කැබැල්ලක් කඩා ගන්නට බැරි ගෙවත්තක් තනාගෙන දුක් විඳී ද?

එම සමයේ පරිසර උෂ්ණත්වය වැඩි නම් ශරීරය සිසිල් කිරීමට ය. දේශීය සංස්කෘතිය අනුව වේලාවට ආහාර ගැනීමෙන් බොහෝ ලෙඩ රෝගවලින් මිදීමට හැකි ය. වර්තමානයේ මෙවැනි චාරිත්‍ර කඩන නිසාම ආමය, ගැස්ට්‍රයිටීස්, පිළිකා, දියවැඩියාව වැනි රෝගබාධ බහුල බව සිතිය හැක. ජනයාට පරම ලාභය ගැන සිතීමට තැන එය ය.

නැකතට ගමන් බිමන් යාම, අනතුරුවලින් වැළකීම හා සුබ ඵල ලබා ගැනීමේ මඟ ය. ''අවේලාවේ වීදි සංචාරය'' වැනි විපත් කැඳවන අවදානම්වලින් මිදීමේ මඟ පෑදේ. විශ්වයේ ඇති ග්‍රහ තාරකාවන්ගේ බලපෑමෙන් අනතුරු වැළැක්වීම ද එක් අදහසකි.

නැකතට ස්නානය කිරීම, හිසතෙල් ගෑම ආදී අංග සපුරාම සෞඛ්‍ය සම්පන්න වීමේ ව්‍යායාමය යි. හෙළ වෙදකමට අනුව අවේලාවේ ස්නානය යනු තුන්දොස කුපිත කරන්නකි. ඖෂධ ගුණයක් ශරීරයට එක්කර ගැනීමෙන් නීරෝගීභාවය ගෙන දීමේ පාඩම නැකතට ස්නානය කිරීමෙන් කියා දෙයි. එවිට අලුත් අවුරුද්දට පසුවදා වෛද්‍යවරුන් සොයා යෑමට අවශ්‍ය නොවේ.

මේ නැකත් සඳහා සූදානම්ව කටයුතු කරන විට අනෙක් සංස්කෘතික දායාද සියල්ල ඊළඟ පරපුරට නිතැතින් උරුම වේ.

වැඩිහිටි කාන්තාවන් කැවිලි පිළියෙළ කරන විට තරුණියෝ ඉවුම් පිහුම් හා දෑතේ වැඩ උගනිති. සාමකාමීව අන්‍යොන්‍ය සහයෝගයෙන් වැඩකරන හැටි පුරුදු වෙති. සහජීවනය දනිති. අවුරුදු ජන ක්‍රීඩා ආදී සියල්ල තුළ ද කුසලතාවන් ඇති කිරීම මෙන්ම, සාමකාමී බව පුරුදු පුහුණු කෙරේ. නැකතට ගනුදෙනු කිරීම, ළිඳ සමඟ ගනුදෙනු කිරීම ආදිය සහජීවනයේ පදනම වන අන්‍යොන්‍ය ගරුත්වය හා කෘතගුණ සැලකීමයි.

මෙලෙස අවුරුදු සමය සමාජයේ සදාචාරය ප්‍රගුණ කරන පාඩමකි. මේ සියල්ල සංවිධානය වන්නේ පරිසරය රසවිඳින ගමන් ය. ඒ තුළ අර්ථවත් කෙරෙන සරල ජීවන පැවැත්ම අප උගෙනිය යුතු ය.

එහෙත් බහු පාරිභෝජන සමාජ රටාව, නාගරීකරණය හා බටහිරකරණය අපේ මේ සියලු හර පද්ධතීන් ඩැහැගෙන තිබේ. අවුරුදු සැමරුම් මාධ්‍ය ආයතනවල උවමනාවට කෙරෙන වෙළෙඳ සැණකෙළි පමණකි.

ඉවක් බවක් නැති අවශ්‍යතා ගොඩනඟා ගත් අයට මුදල් අර්බුදය අර්බුදයක් ම ය. සියල්ල මුදලින් විසඳා ගැනීමට තවදුරටත් තැත්කරන සමාජයකට මේ වකවානුව සැබෑම අර්බුදයකි.

නැවතත් සරල දෙයට ජීවිතය හුරු කර ගැනීමත්, කාලයට ගැළපෙන නව ජීවන දර්ශනයකට යොමුවීමත් මඟින් මේ අභියෝග ජය ගැන්ම මිස සමාජයට වෛර කිරීමෙන් අලුත් අවුරුද්දේ අරුත පසක් කර ගත නොහැක. අවම වශයෙන් අලුත් අවුරුදු සැමරුම හෝ සරලව අඩු වියදමින් ඉටුකිරීමේ ක්‍රමවේදයක් ගැන සිතන්නට අප සමාජය සූදානය විය යුතු ය.

අවුරුදු චාරිත්‍රවලින් සමාජයට මේ ලබා දෙන මඟ පෙන්වීම අනුගමනය කරන්නේ නම්, නැති අභියෝග අර්බුදවලට මූණපාන්නට සිදු නොවනු ඇත. එලෙසම අප සමාජයේ අඩු වයසින් දිගුකාලීන රෝගාබාධවලට ලක්වූවන්, අකලට හිසකේ හැළුණු හෝ පැසුණු අය මෙන්ම අඩු ආයුෂ පුද්ගලයින් දැකිය හැකි යැයි සිතිය නොහැක. මෙම චාරිත්‍ර තුළ ඇත්තේ ලෝක ධර්මතාවන් ය.

ජීවිතයක් සාර්ථක කර ගැනීමේ ධර්මිෂ්ඨ මාර්ගය ය.

ධර්මය අනුව ජීවත්වීමෙන් ධර්මය විසින් පුද්ගලයා ආරක්ෂා වනු ඇති බව බෞද්ධ ඉගැන්වීමයි.



අනුරාධපුර ලංකාරාමාධිකාරී, උතුරුමැද පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක
**රැළපනාවේ ධම්මජෝති නාහිමි**

ප්‍රතිඵලය දෙස බලා හොඳ නරක තීරණය කරන්න



# උතුම් පුරුෂාර්ථයන්ගෙන් විසිතුරුවන භාග්‍යවන්ත මාසයේ සූර්ය මංගල්ලය

**රක්ත වර්ණ එරබදු මල් විකසිතවැ, කෝකිල කූජනයේ චමත්කාරයෙන් පරිසරය එළිවෙන භාග්‍යවත් මාසය බක් මාසයයි. සිරිලක් සමාජයට බුදු දහමේ ආලෝකය – බුදුන් වහන්සේ සිරිලක් ධරණී තලයට දයාද කළ හර පද්ධතිය හා මුසුවී හෙළ සිරිත් විරිත් වඩාත් ඔපවත් විය.**

මිස්සක පව්වෙන් දේශය සිසාරා ගලා ගිය ආමාදම් මාරුතය හෙළ බොදු දිවි පෙවෙත හැඩ කළේ ය. සරල, චාම් වුව සුන්දර ජීවන රටාව, සෞභාග්‍ය සම්පන්න – සිරිදෙව් දුව දිවැස් හෙළන, කොයි කාටත් සැනසිල්ල දානය කරන අපේ ඇත්තන්ගේ ඇවැතුම් පැවැතුම් ක්‍රමය – කල්ක්‍රියාව ලොව කාගේත් නෙත සිත යොමු වීමට හේතුවිය.

මිස්සකපව්ව අබියස දී එදා දේවානම් පියතිස්ස මහ නිරිඳු ප්‍රමුඛ හතළිස් පන්දාහක ජනයා මිහිඳු මහ රහතන් වහන්සේ වෙතින් පන්සිල් සමාදන් වූහ. පන්සිල් මත පදනම් වූ ජීවන ධාරාවකින් එදා අපේ ඇත්තෝ මෙලොව එලොව සුබසෙත උදාකර ගත්හ. කෙතින් බඩ වියත ද, දාගැබින් ආධ්‍යාත්මික දියුණුව ද ඔවුහු ළඟා කර ගත්හ.

සිංහල හින්දු අලුත් අවුරුද්ද – සූර්ය මංගල්‍යය සිරිලක් සමාජයේ හැඩරුව මනාව පිළිබිඹු කරන අපේ සමාජ ක්‍රමයේ උත්කර්ෂවත්ම මංගල්‍යයයි.

සොබා දහම හා මොනවට ඒකාත්මික වූ ලක්වැසි ජනතාව සොබාදම් මෑණියන්ගේ ආශීර්වාදය නොමඳව ලබන්නට භාග්‍යයවන්ත වූහ. බක් මස ඒ බැව් මැනවින් තහවුරු කරන මාසයයි. භාග්‍යය කැන්දූ මාසය වූ නිසාම එය බක් මාසයයි.

තුරුලිය පැහැයෙන්, පලඑල්ලවයන්ගෙන්, සියොත් නදින් මෙන්ම සමඟි දමින් බැඳුණු සිවු හෙළයේ මිනිස් පවුරෙන් සූර්ය මංගල්‍යය විසිතුරු වෙයි. හෙළයන්ගේ අහිංසක දිවිපෙවෙත, ආදර්ශ සම්පන්න ගති සොබා තුළින් බුදු දහමේ හරයන් – සම්මා ආජීවය, ලක්වැසි ජීවන දර්ශනය මූර්තිමත් කරයි. වසරක් පුරා ගතේ දහඩිය මහන්සිය කුඹුරේ අස්වැන්නට කැප කළ "මඩ සෝදා ගත් කල රජකමට සුදුසු" ගොවියාගේ අභිමානය කියාපෑවේ සිරිලක් සමාජයේ ස්ව ශක්තියයි.

කලට වේලාවට වැඩ කිරීමේ කලාව බක් මහ අවුරුදු චාරිත්‍රයන්හි මොනවට අරුත් ගන්වයි. ස්වභාවික හිරු සඳු ගමනේ සංසිද්ධිය මනාව ග්‍රහණය කරගත් අපේ ඇත්තෝ වෙලාවට කලාවට මොනවට ක්‍රියා කළහ. යල කන්නය, මහ කන්නයන්හි සරු අස්වැන්නකින් අටුකොටු පුරවන්නට අපේ ගොවි නෑසියන් මොනවට පේ වූහ. සිරිලක් සමාජයේ ජාතිය ජීවත් කරවීමේ යෝධ උත්කෘෂ්ට ව්‍යායාමයක අහිංසක ගොවි ජනතාව නිරත වූහ.

නැකතට වැඩ කිරීමේ අවුරුදු සිරිත කියාපාන්නේ මේ යථාර්ථයයි. බුදුසිරිතෙන් දිනචර්යාවකට වැඩකිරීම අරුත් ගැන්වුණි. ඒ අනුව අපේ හෙළ සිරිතට විරිතට බුදු දහමින් පණ ලැබුණි.


සොබා දහමේ ශක්තිය හා රිද්මය අනුව දිවි ගෙවන්නටත්, අපට දිවි දෙන සොබාදම් මෑණියන්ට ගරු කරන්නටත්, කෘතගුණ දක්වන්නටත් මේ භාග්‍යවත් මංගල්‍යයේ දී අපේ අය ප්‍රමුඛස්ථානය ලබා දුන්හ. හිරු, සඳු, නැකැත්, තාරුකාවන්හි ස්වභාවික චලනයන්හි යහබලපෑම 'සුබ මුහුර්තීන් හා සුසංයෝගයෙන් ස්වභාවික ශක්තිය මිනිසාගේ දෙලොව අභිවෘද්ධියට යොදා ගන්නට අපේ මුතුන්මිත්තෝ ප්‍රඥ සම්පන්නව ක්‍රියා කළහ. එනිසාම කෘෂිකාර්මික ආර්ථික සශ්‍රීකත්වයත් ලක්වැසි ජනතාවගේ සෞභාග්‍යයත් උදාපත් විය.

එදා මෙදා තුළ ලක්වැසි ජනතාව බුදුදහම හා බද්ධ වූයේ ගහට පොත්ත මෙනි. එනිසාම කෙනකුගේ ජීවිතයේ කවර කටයුත්තක දී වුව ආගම, දහමට මුල්තැන දී කටයුතු කිරීම අපේ අයගේ සද්ගුණයක් විය.

සිංහල අවුරුදු චාරිත්‍රයන්හි දී පුණ්‍ය කාලයට ලැබෙනුයේ මුල් තැනකි. සිංහල හින්දු අවුරුදු සිරිත් ආගමික වතාවත්වලින් ඇරඹීම මෙහිදී සිදු වෙයි. පුණ්‍ය කාලය උදා වීමට ප්‍රථම ආහාර පාන ගෙන සියලු වැඩ අත්හැර ආගමික වතාවත්වල යෙදීම පුරාතනයේ පටන් පැවැතෙන චාරිත්‍ර ධර්මයයි.

අවුරුදු උදා වීමේ දී මුළු ජන සමාජයම අලුත් අවුරුදු අසිරියෙන් එකට බැඳෙයි. එකම වේලාවකට එකම නැකතකට පවුලේ සියලු දෙනාම සතුටු සිනා මැද නිවෙසේ පිසෙන කිරිබතක් අනුභව කරයි. ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රයන්ට අනුව ද මෙලෙස කිරිබතක් අනුභවය මිනිස් දිවිපැවැත්මට සෞඛ්‍යයට හිතකර ය. සරල පහසු වියහියදම් අඩු ගැමි පරිභෝජන රටාවේ වටිනාකම, සෞඛ්‍යයට හිතකර බව, සිංහල අවුරුදු කෑම මේසයද කියාපායි. අහල පහළ නෑසියන්, හිතමිතුරන් හා සමඟිදමින් යුතුව අවුරුදු කෑම පිඟානක් අසල්වාසීන් අතර, බෙදා ගැනීම බෙදාහදා ගැනීමේ සද්ගුණය ප්‍රකට කරයි.

ඉතිරි කොටස 18 පිටුවේ ...



උදම්මිට – ජාඇළ
උත්තමාරාම පුරාණ විහාරයේ
**උදම්මිට ධම්මානන්ද හිමි**

දුසිරිත් දුරු කොට සුසිරිතයෙහි හැසිරීම ආර්ය ශ්‍රාවකයාගේ ලක්ෂණයකි

# හෙළ සංස්කෘතියේ පිවිතුරු රුව ගුණ ඉදිරි පරපුරට ඉතිරි කරමු



මහව,උඩගම ශ්‍රී ඉන්දසුමන මහ පිරිවෙන්හි ප්‍රවීණාචාර්ය , ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛන ශාස්ත්‍රී

**ගලගෙදර රතනවංස හිමි**



**ක්‍රමයෙන් ගිලිහීගෙන යන අලුත් අවුරුදු සිරිත් විරිත් අවුරුද්ද උදාවනවාත් සමඟම මතක් කර ගැනීම ඉතා වැදගත් වන්නේ ය. වසරක් ගෙවී නව වසරක් උදා වෙනවා යනු ළමයි තරුණ වීමත්, තරුණයින් වැඩිහිටියන් වීමත්, වැඩිහිටියන් මරණයට ආසන්න වීමත් ය.**

වයසත් සමඟ සිදුවන විපර්යාසයත් සමඟ පරණ ගති සිරිත් අමතක වී යෑමක් සිදු වේ. ඊටත් වඩා අද ගෙවන නවීන ලෝකයත් සමඟ අපට ආවේණිකව තිබූ ක්‍රීඩා බොහොමයක් අමතක වී තිබේ. එය ඉදිරි පරම්පරාව උදෙසා දායාද කර දීමට අප නිරන්තරයෙන් උත්සාහ කළ යුතු ය.

නවීන තාක්ෂණයත් සමඟ ජීවත් වීමේ දී අපට ආවේණික වූ ක්‍රමවේද හා ගති සිරිත් අමතක නොකළ යුතු ය. ඒවාට පයින් ගසා වල පල්ලට නොදැමිය යුතු ය. කෙනකු අලුත් ලෝකයක් වැළඳ ගැනීමට සිතන්නේ පැරැණි සිරිත් විරිත් අමතක කොට නම්, ඔහු සංස්කෘතික ලක්ෂණ නොමැති රොබෝ මිනිසකු බවට පත් වනු නියත ය.

අලුත් ඇඳුම් අඳිමින්, ගෙවල් දොරවල් අලුත් කරමින් අවුරුදු සැමරුවත් මිනිසුන්ගේ සිතුම් පැතුම් අලුත් නොවන්නේ නම්, එම අවුරුදු සැමරුම් වල පලක් නොමැත.

විහාරස්ථානවලට ගොස් මල් පූජා කිරීම් හා ආගමික චාරිත්‍රවල නියැළීම අලුත් අවුරුද්දේ සුවිශේෂිතම කාර්යය ලෙස හැඳින්වීමට පුලුවන. එයට හේතුව වශයෙන් සැලකෙන්නේ තුනුරුවනට මුල්තැන දී වැඩ කටයුතු සුභ මොහොතින් ආරම්භ කිරීමට සැරසීම ය. සිංහල බෞද්ධයින් උපතේ සිට විපත දක්වා ම ගෙවන කාලය තුළ සියලු කටයුතු තුනුරුවන් මුල් කරගෙන සිදු කිරීම සුලභ කාරණයකි.

අලුත් අවුරුද්ද තුළ ද මුල් තැන ලැබෙන්නේ ආගමික චාරිත්‍ර සඳහා ය. එය ඉතා වටිනා ගුණ ධර්මයක් සේ ම පින්කමක් ද වන්නේ ය. අවුරුද්දක් තුළ විවිධ අංශයන්හි සමඟියත්, සාමූහිකත්වයත්, දැක ගන්නට ලැබෙනු ඇත. මිනිසුන් තුළ නැති වී යන ගුණ ධර්ම නැවත අලුත් වීම, අමතක වී යන චාරිත්‍ර ධර්ම නැවත අලුත් වීම සිංහල අවුරුද්දක් තුළ දැකිය හැකි ලක්ෂණයකි.

සෑම නිවසකම මල් පැළක් තැනීම, පහනක් දැල්වීම, කැවුම්, කිරිබත්, රසකැවිලි හැදීම, අලුත් ඇඳුම් ඇඳීම, ගෙවල් දොරවල් අලුත් කිරිම හා පිරිසුදු කිරීම, නෑගම් යෑම ආදී විවිධ චාරිත්‍ර හා කටයුතුවල යෙදීමට සිංහල දෙමළ සෑම කෙනෙක් ම උත්සාහවත් වනු ඇත.

මිනිසුන්ගේ දුර්වල මානසික මට්ටම් කරණකොට ගෙන හටගන්නා අසමගිකම් මෙවැනි සිංහල අලුත් අවුරුද්දක් තුළ හෝ නැති කර ගන්නේ නම් එය ඉතා වැදගත් සිදුවීමකි.

විශේෂයෙන් සිංහල අවුරුද්ද තුළ වැඩිහිටියන්ට ගෞරව කිරිම ද සිදු වනු ඇත. එහිදී බුලත් අතට ලැබෙන්නේ සුවිශේෂී ස්ථානයකි. බුලත් අතක් දී සුහදව වැඳ නමස්කාර කර සිනා මුසු මුහුණින් කතා කිරීම සිදු කරනු ඇත. මවුපියන්ට දරුවන් ද, ගුරුවරුන්ට ශිෂ්‍යයින් ද, ස්වාමියාට සේවකයින් ද, වැඩිහිටියන්ට ලාබාල අය ද, පැවිදි පක්ෂයට ගිහි අය ද යනාදී පිරිස් අතර එම වන්දනාමාන කටයුතු සිදු වේ. එහිදී කිසිදු වාද භේදයක් නොමැතිව කාටත් පොදුවේ එම චාරිත්‍ර සිදු වනු ඇත. එම ක්‍රියා තුළින් කාටත් ප්‍රීතියක් ලැබෙන ආකාරයට ආශිර්වාද ලැබෙනු ඇත.

දැනට වසර 20කට 30කට පෙර දී අවුරුදු චාරිත්‍ර, සිරිත් විරිත් නොඅඩුව ම සිදු විය. අද වන විට ඒවායේ පිරිහීමක් දක්නට ලැබේ. එනිසා අප මතක් කර දෙන්නේ ඉදිරි පරම්පරාවට ද එම අවුරුදු චාරිත්‍ර දැක බලාගෙන විනෝදවීමට ඒවා සුරැකිය යුතු බව ය. ඉදිරියට පවත්ගෙන යා යුතු බව ය.

සිංහල දෙමළ අලුත් අවුරුද්දත් සමඟ ම යන සිංහල ක්‍රීඩා විධි ද අපට වැදගත් වන්නේ ය.

කුඩා, තරුණ, මහලු කාගේත් සහයෝගය මතම එම ක්‍රීඩා සිදු කරනු ඇත. එයට අවුරුදු උත්සවය කියා සඳහන් කරනු ලැබේ. විවිධ ක්‍රීඩා වර්ග අවුරුදු උත්සවයක් තුළ දැකගත හැකි ය. එම ක්‍රීඩා බොහෝ දුරට දුර්ලභ ගණයේ ඒවා වෙති. විශේෂයෙන් අද පරපුරට එම ක්‍රීඩා සිංහල අවුරුද්දට පමණක් දැකගත හැකි ඒවා ද විය හැකි ය.

අපට ආවේනික ක්‍රීඩා සමූහයක් පැරැණි මුතුන් මිත්තන් ආරක්ෂා කරමින් පවත්වාගෙන ආ අතර ඒවා තුළ උසස් සංස්කෘතික ලක්ෂණ ද විද්‍යමාන වේ. එම ක්‍රීඩා තුළින් සමඟිය සමාදානය, සහජීවනය, ප්‍රීතිය මොහොතක් ගානේ උදාවනු ඇත. එහිදී ආගමික පසුබිමක් ද නිරූපණය වේ.

ආවාට ගියාට නොව චාරිත්‍රානුකූලව ම එම ක්‍රීඩා සිදු කරනු ඇත. එම නිසා අද ජීවත් වන්නන් ද එම ක්‍රීඩා ආරක්ෂා කරමින් ඉදිරි පරම්පරාවට ද දායද කළ යුතු වන්නේ ය.

එම ක්‍රීඩාවලින් කීපයක් මතක් කිරීම වැදගත් වනු ඇත. අං ඇඳිම, පොර පොල් ගැසීම, කඹ ඇදීම, කොට්ට පොර ගැසීම, චක්ගුඩු පැනීම, රබන් ගැසීම, කොඩි ගසේ නැගීම, (ග්‍රීස් ගහේ) ජනකවි ගායනා කිරීම, අවුරුදු කුමර කුමරියන් තේරීම, පංච ඇදීම, එල්ලේ ගැසීම වැනි ක්‍රීඩා අද ළමා පරපුරට මෙවැනි ක්‍රීඩාත් තියෙනව ද කියන තරමට ඒවා ඔවුන් නොදන්නා ක්‍රීඩා සමූහයකි. එනිසා එම ක්‍රීඩා ඉදිරියට පවත්වාගෙන යෑම වනාහි බාල පරපුරට අපේ පැරැණි චාරිත්‍ර විධි ද මතක් කර දීමක් වන්නේ ය.

එම ක්‍රීඩාවලින් දිනුම පැරදුම පමණක් නොව අපේකම, පැරැණිකම, සංස්කෘතිය, ශිෂ්ඨාචාර විධි වැනි දේවල් ද මතකයට නඟාගත හැකි ය.

ඉහතින් සඳහන් කළ ආකාරයට අවුරුදු චාරිත්‍ර නිතර සිහියට ගෙන අපට නැති වී යන එම ගුණාංග හා චාරිත්‍ර විධි ඉදිරියට තව තවත් ගෙන යෑමට උත්සාහවත් විය යුතු ය.

## උතුම් පුරුෂාර්ථයන්ගෙන් විසිතුරුවන ...

*17 පිටුවෙන් ...*

සීයා, ආච්චි, නැන්දා, මාමා ආදි පැතිරුණු පවුලක සියලු දෙනා එකම කෑම මේසයක හිඳ ආදරයෙන්, සෙනෙහසින් යුතුව ආහාර ගැනීම දැකීම දූ දරුවන්ට කදිම ආදර්ශයකි.

අවුරුදු සිරිතෙන් දැනෙන සොම්නස පිරි ආස්වාදය ළමා පෙළට නැවුම් අත්දැකීමකි. අධ්‍යාපන කටයුතුවල නිමග්න වූ ඔවුනට ගතේ සිතේ විවේකය පිණිස මනා පිටිවහලකි. අවුරුදු දා පමණක් නොව මෙලෙස අසල්වාසීන් ඥාති බන්ධුවරයන් සමඟ හොඳ හිත පතුරා මෛත්‍රී සහගතව කටයුතු කිරීම අවුරුදු උදාවේ පටන් දින සති ගණනාවක්ම පවතී. මේ මිතුරු බැඳීම ඥාති බන්ධනයේ සවිමත් බව වසරින් වසර අලුත්වීම අන්‍යෝන්‍ය විශ්වාසය, බැඳීම,අපේකම සේම, මෛත්‍රිය, කරුණාව, මුදිතාව හා උපේක්ෂා යන සතරබඹ විහරණය ද හෙළ හද සන්තානයේ මොනවට තහවුරු කරයි. පිදිය යුත්තන් පිදීම, වැඩිහිටියන්ට ගරුකිරීම, කළ ගුණ සැලකීම ආදී අටතිස් මඟුල් කරුණු කිය දෙන තථාගත දේශනය අලුත් අවුරුද්දේදී බෞද්ධ අබෞද්ධ ගුණගරුක සත්පුරුෂ සැමට සිහි කැඳවයි. හැදූ වැඩූ අම්මා, තාත්තා පාමුල වයසින් කොපමණ වැඩුණ ද කරදඬු උස්මහත් වුව ද පුංචි සන්දියේ පුංචි දුව පුතා පරිදිම අම්මට තාත්තාට බුලත් හුරුල්ලක් දී වැඳීම කොපමණ කාර්යබහුල ජීවිත ගත කළත් අවුරුදු සමයේ වුව දුව පුතා මුනුබුරු මිනිබිරියන් හා එක්ව බත්කටක් එකට භුක්ති විඳීම අම්ම, තාත්තට ගෙන දෙන සහනය, සොම්නස, වචනයෙන් පැවැසිය නොහැකි ය. මව පෝෂණය, පියා පෝෂණය, අඹුදරුවන් පෝෂණය පදනම් කර ගෙන නෑයන්ට සංග්‍රහ කිරීම, පිදිය යුත්තන් පිදීම නිවැරැදි කර්මාන්ත එනම් කෘෂිකර්මය, වෙළෙඳාම, ගවපාලනය ආදි අහිංසක ජීවනෝපායන්හි යෙදීම සිංහල අලුත් අවුරුදු මංගල්‍යයෙන් මනාව ඉස්මතු වෙයි. සැබැවින්ම ඒ වුකලි බෞද්ධ ජීවන දර්ශනය ගිහි දිවියට අදාළ කර ගැනීමයි.

හිසතෙල් ගෑම, ජනක්‍රීඩා ආදියද සිංහල අවුරුදු සිරිත් අතර, වෙයි. ජන ක්‍රීඩා තුළින් එකමුතුකම , සාමය, සමඟිය, සමානාත්මතාව වර්ධනය වෙයි. සෞඛ්‍ය සම්පන්න ජාතියකට ඉන් මඟ විවර කරයි. නැකතට හිසතෙල් ගෑම තුළින් අපේක්ෂා කරනුයේද සුවසෙත සපිරි ජන සමාජයකි. අටුකොටු පිරුණු සෞභාග්‍යය සම්පන්න සමාජයක පදනම හොඳ සෞඛ්‍ය සම්පන්න ජනදිවියයි. නීරෝගී බව උතුම්ම ලාභයකි. සතුට උතුම් ධනයකි. හිතවතා උතුම් නෑයෙකි. නිවණ උතුම්ම සැපතයි. කොපමණ ධනය වස්තුව තිබුණ ද ලෙඩ දුක්වලින් කෙනෙක් පීඩා විඳීනම් වස්තුන්හි ඇති එල කවරේද? රන්,රිදී, මුතු, මැණික් අගය පරදන උතුම්ම ලාභය නීරෝගී බව වනුයේ එනිසාවෙනි. පසුතැවීම, සංතාපය, පශ්චාත්තාප වීම ඇති තැන සැනසීමක් නැත. බුද්ධිමත්, සැමගේ ඒකායන පැතුම් දෙලොව, සැනසීමයි. මව් පිය සහෝදර සහෝදරියන් නැදිමයිල් ඥාති බැම්ම මෙලොව දිවියට මනා පවුරකි. මෙලෙස මෙලොව දිවිය මනාව ගොඩනැංවුණු විටය. නිවන්දොර විවර වනුයේ. එදා බුදුරදුන් පසේනදී කොසොල් මහරජ අරබයා දෙසූ ධම්මපද ගාථා අර්ථය භාග්‍යවත් සිංහල හින්දු අලුත් අවුරුද්දේදී ලක්වැසියෝ සිය ජීවන ගමනට එකතු පහදු කරගන්නා ආකාරය සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර විධි ක්‍රමයන්ගෙන් මොනවට පැහැදිලි වෙයි.

ආරෝග්‍යා පරමා ලාභා
සන්තුට්ඨී පරමං ධනං
විශ්වාසා පරමා ඤාති
නිබ්බාණං පරමං සුඛං
(ධම්මපදය සුඛවග්ගය)

# ආර්ථික අර්බුදය විසඳීමට

# වියහියදම් සිහිනුවණින් කළමණාකරණය කරන්න

**වර්තමාන ආර්ථික අර්බුදය හේතුවෙන් සෑම අයකුම අඩු වැඩි වශයෙන් පීඩාවට පත්ව සිටී. ඇතමකුට තම මූලික අවශ්‍යතා වන ආහාර, ඖෂධ ආදිය පවා සම්පූර්ණ කර ගැනීමට විශාල වෙහෙසක් දැරීමට සිදුව තිබේ.**

එහෙත් අප අතර ඇතැමෙක් කොතරම් අපහසුතා පැවතිය ද විනෝදකාමී, එමෙන් ම අධිපරිභෝජනවාදී ජීවිතයක් පවත්වා ගෙන යන අයුරු දක්නට ලැබේ. අර්බුද සමයෙහි සිහි නුවණින් යුතුව තම වියදම් නිසි පරිදි කළමනාකරණය කර ගනිමින් සැහැල්ලුවෙන් කටයුතු කරන්නේ ඉතාමත් අල්ප පිරිසකි.

පවතින ආර්ථික අර්බුදයට සාපේක්ෂව තාක්ෂණය විසින් නිර්මාණය කරන ලද ඇතැම් දෑ පුද්ගලයාගේ ආර්ථිකයට මෙන් ම සමාජ ජීවිතයට ද දැඩි බලපෑමක් එල්ලකර තිබේ. මේ යටතේ බුදුරදුන් වදාළ සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන භෝග විනාශ මුඛ හයෙහි නූතන අදාළත්වය විමසා බැලීම මෙම ලිපියේ අරමුණ වේ.

ගිහි විනය වශයෙන් හැඳින්වෙන සිඟාලෝවාද සූත්‍රයෙහි කෙනකු උපයන ධනය විනාශ වන අවස්ථා ලෙස මත්පැන් පානය, අවේලාවේ වීථි සංචාරය, නිතර උත්සව හා විනෝද ක්‍රියාවල නිරත වීම, සූදු ක්‍රීඩාවෙහි නිරත වීම, පාප මිත්‍ර සේවනය හා අලසව කටයුතු කිරීම දක්වා තිබේ.

බුද්ධ කාලීන සමාජයේ සුරා පානය විවිධ අයුරින් පැවති අතර, වර්තමානයේ දී එය සුරාවට පමණක් සීමා නොවී ලොව සෑම අයෙක්ම පීඩාවට පත්කෙරෙන විවිධ නම්වලින් හැඳින්වෙන මත් ද්‍රව්‍ය භාවිතය දක්වා විකාශනය වී තිබේ. සාපේක්ෂ වශයෙන් ගත්විට අතීතයට වඩා වර්තමානයේ දී ඒවා සංකීර්ණ වී තිබෙන අතර, සිදුවන හානිය ද ඉතා විශාල ය.

අතීතයේ යම් පමණකට පුද්ගල බද්ධව සිදු වූ හානිය වර්තමානයේ සුරාව හා මත්ද්‍රව්‍ය භාවිතය නිසා පුද්ගලත්වය ඉක්මවා ගොස් ගෝලීය සමාජ අර්බුදයක් බවට පත්ව තිබේ. ඒවා පිළිබඳ නිසි විමර්ශනයක් සිදුකළහොත් ආර්ථිකයට හා ලෝක සාමයට එයින් එල්ලවෙන බලපෑම තක්සේරු කළ නොහැකි තරමට ම විශාල ය.

ඇතැම් විට සුරා පානයටත් වඩා මත්ද්‍රව්‍ය භාවිතය නිසා සිදු වී තිබෙන පුද්ගල හා සමාජ හානිය ගණනය කළ නොහැකි පමණට විශාල ය. එහෙත් සමාජයේ බොහෝ දෙනකු සුරාපානය ගැන පමණක් නිතර අවධාරණය කරන අතර, ගම් මට්ටමින් තරුණ ජීවිත විනාශ කෙරෙන මත්ද්‍රව්‍ය භාවිතය හා අළෙවිය වැළැක්වීම සඳහා ගන්නේ අල්ප උත්සාහයකි. ඉතා රහසිගතව සිදුවන මෙම අපරාධය දිනකට තරුණ ජීවිත සිය ගණනක් ගොදුරු කර ගනිමින් තිබේ.

සෙසු කරුණු අතුරින් අවේලාවේ වීථි සංචාරය හා විනෝදාස්වාදය හා සූදුව ඒකායන අරමුණ බවට පත් කර ගනිමින් එය සැපිරෙන ආයතන ඇසුරු කිරීමෙහිලා තත්පර වීම හා ඒවා භාවිතය කෙරෙහි දැඩි ලෙස ආසක්ත වීම යන කරුණු දෙක වර්තමානය හා සම්බන්ධ කිරීමේ දී ඉතා පුළුල් ව සිතා බැලිය යුතු වේ.

මෙම අවස්ථා දෙක වර්තමානයේ සමාජ ශාලා ඇසුරෙන් ඉතා පුළුල්ව සිදු වේ. වර්තමාන අර්ථයෙන් ගත්විට නූතන සමාජශාලා යනු අතීතයේ මෙම අවස්ථා තුනටම අදාළ අවශ්‍යතා සපයා ගැනීමට තිබෙන පොදු ආයතනය ලෙස සැලකීම වරදක් නොවේ.

නූතන සමාජ පරිවර්තන හමුවේ මෙවැනි දෑ සම්පූර්ණයෙන් ම වැළැක්වීමට නොහැකි ය. වෙළඳ ආර්ථිකය විසින් ඒවාට විවිධ අර්ථකථන දක්වා සාධාරණීකරනය කරනු ලැබේ. මේ පසුබිම යටතේ අවබෝධයෙන් යුතුව තම ධනය හා සෞඛ්‍ය පිරිහෙන එබඳු ආයතන ඇසුරෙන් වැළකී සිටීම හැර වෙනත් විකල්පයක් නොමැත. අනුගමනය කළ හැකි නුවණැති පිළිවෙත වන්නේ ද ආත්ම දමනය ඇති කර ගැනීමයි. එහෙත් අනුවණ පුද්ගලයා එහි ගොදුරක් බවට පත්වීම වැළැක්වීම අසීරු ය.

වර්තමාන සමාජ මාධ්‍ය යටතේ එන ඇතැම් අංශ දෙවන තෙවන හා සිව්වවන භෝග විනාශ මුඛ ගණයට ඇතුළත් කළ හැකි ය. අතීතයේ මෙන් විනෝදාස්වාදය සපයන දෑ සොයමින් මහමඟ ඇවිද යාම නොකළත් තමා අතට පත් විවිධ විද්‍යුත් උපකරණ පාලනයකින් තොරව එම අවශ්‍යතා සඳහා භාවිත කිරීමෙන් සිදුවන හානිය එකක් ම වේ.

අනවශ්‍ය ලෙස සමාජ මාධ්‍ය ඇසුර සඳහා කාලය හා ධනය වැය කිරීමෙන් සිදුවන්නේ බුදුරදුන් භෝග විනාශ මුඛ යටතේ දෙවැනි තෙවැනි හා සිව්වැනි කරුණෙන් අවධාරණය කළ දේ ම ය. ඒ සඳහා ජංගම දුරකථනය හෝ පරිඝණකය භාවිත කෙරෙන අතර, එයින් ධනය මෙන් ම අධ්‍යාපනය, සෞඛ්‍යය විනාශ කර ගත් කෙතෙක් නම් පිරිසක් අප අතර වෙසේ ද යන්න සිතා බැලීම වැදගත් වේ.



කොළඹ විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති රාජකීය පණ්ඩිත මහාචාර්ය

**උඩුහාවර ආනන්ද හිමි**



මෙහි බලපෑමක් ලෙස සමාජ අපරාධ මෙන් ම අපචාර ක්‍රියා සිදුකරන පුද්ගලයන්ගේ ගොදුරක් බවට පත් වූ දරුවන් කොතෙකුත් දැකිය හැකි ය. තම ජීවිතය අර්ථවත්ව පවත්වා ගෙන යාමට යොදාගත හැකි මෙවලම් හා තාක්ෂණය අවභාවිත කිරීමෙන් කාලය හා ධනය විනාශ වන අයුරු බොහෝ දෙනකුට වටහා ගැනීමට අසීරු ය. ඇතැම් විටෙක ඔවුන්ට එය වැටහෙන විට තම දෙමාපියන්, දරුවන්, සමාජ තත්ත්වය, රැකියාව, කීර්තිය, අධ්‍යාපනය හා සෞඛ්‍ය යන සියල්ල අහිමි වී තිබිය හැකි ය.

සමාජ සදාචාරය ගොඩනඟන ගාමක බලවේගය වන ආගම නියෝජනය කරන පුද්ගලයන් එහි ගොදුරක් වීම ඛේදනීය කරුණකි.

වර්තමාන මිනිසා ජීවත් වන්නේ ඩිජිටල් ලෝකයක ය. කොතැන හෝ තැනක තමන් සිදුකරන අයහපත් දෑ වාර්තා වීම නොවැළැක්විය හැකි ය. ඒවායේ අතුරු ප්‍රතිඵල දීර්ඝ කාලීන ය.

ඒ අනුව බුදුරදුන් වදාළ භෝග විනාශ මුඛ අතුරෙන් දෙවැනි තෙවැනි හා සිව්වැනි අංග පෙරටත් වඩා අද සමාජයට අදාළ වේ. නූතන තාක්ෂණයේ පිහිටෙන් සිදුවෙන එම ක්‍රියා නිසා දිනපතා වන හානිය ද බුදුරදුන් වදාළ ආදීනව හා සමාන ය. වර්තමානයේ එම භෝග විනාශ මුඛ තුන සිදුවන ආකාරයේ යම් වෙනසක් පැවතිය ද එයින් වන නරක ආදීනව එක හා සමාන වේ.

පාප මිත්‍ර සේවනය පෙරටත් වඩා පහසුවෙන් සිදුවන්නේ තාක්ෂණයේ පිහිටාධාරයෙන් ය. එය කොතරම් ප්‍රබල ද යත් පාප මිත්‍රයන් සඳහා ම සකස් වූ විවිධ නම්වලින් හැඳින්වෙන අන්තර්ජාල වෙබ් පිටු සියදහස් ගණනක් දක්නට ලැබේ. මේවායේ සැරි සරන්නන් එක් අතකින් තම ධනය හා කාලය විනාශ කර ගන්නා අතරම, මානසික වශයෙන් අවුල් සහගත ජීවිතයක් උරුම කර ගෙන ඇති අයුරු දක්නට ලැබේ. එවැනි වෙබ් අඩවිවල සහයෝගය නිසා ළමා අපචාර, පවුල් ආරවුල්, සමාජ අපරාධ ක්‍රමයෙන් වර්ධනය වෙමින් තිබේ. අන්තර්ජාලය හරහා එවන් ආයතනවල ඇසුර ලබන කුඩා දරුවන් තරුණ තරුණියන් නිවසේ දී ම අපයෝජනයට ලක්වන අවස්ථා එමට ය. තාක්ෂණය විසින් ඇතිකෙරෙන වැරැදි උත්තේජනයන් නිසා කාලයත් සමග දරුවන් මෙන්ම වැඩිහිටියන් ද මානසික වශයෙන් විවිධ රෝගවලට ගොදුරු වෙමින් තිබේ.

බුදුරදුන් වදාළ පරිදි පාප මිත්‍ර සේවනයෙන් ලැබෙන ආදීනව ඒ අයුරින්ම වර්තමානයට ද අදාළ වේ.


අවසන් භෝග විනාශ මුඛය වන අලසකම සාකල්‍යයෙන් ම පුද්ගලයා මත තීරණය වේ. ඒ සම්බන්ධයෙන් සමාජයට දොස් පැවරිය නොහැකි ය. නිවසේ මෙන් ම තමාට අදාළ රාජකාරිය අතපසු කොට කල්දමා අලසව කටයුතු කරන පුද්ගලයාගේ පුද්ගලික දියුණුවක් මෙන්ම ඔහු නියෝජනය කරන සමාජය මෙන් ම රටේ ද දියුණුවක් අපේක්ෂා කළ නොහැකි ය. එබැවින් මෙම ආර්ථික අර්බුද සමයේ බුදුරදුන් වදාළ භෝග විනාශ මුඛ පිළිබඳ ගැඹුරින් සිතා බැලීම අත්‍යවශ්‍ය වේ.

අනුවණයන් හා එක්ව විසීම හැම විටම විපත් ගෙන දේ

# ජාති ආගම් භේද නොසලකන ආකල්පමය වෙනසකට යා යුතු කාලය එළැඹිලා



ජාතික නාමල් උයනේ 32 වැනි සංවත්සරය නිමිත්තෙනි



## වනවාසී රාහුල හිමි

**ජාතික නාමල් උයන ව්‍යාපෘතිය ලෝකයේ ම අවධානය දිනා ගත් ලෝක උරුමයක් බවට පත් වීමට ඉතා සුදුසුම මහා සුන්දර වනස්පතියකි.**

ජෛව විවිධත්වයෙන් පිරිපුන් ජාතික නාමල් උයන දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය දිනූ සෞඛ්‍ය සම්පන්න වාතාශ්‍රයත්, සිසිලසත් කැටිකොට ගෙන සැදුම්ලත් සුවදායක පරිසරයකි. මෙම පරිසර පද්ධතිය ආගමික, පාරසරික, හා භූගෝලීය වශයෙන් වටිනාකමින් ඉහළ අගයකින් යුක්ත වූ අපේ ජාතික සම්පතකි. මෙහි භූමි ප්‍රමාණය අක්කර 2000කින් සමන්විත ය. මේ සුන්දර වන පියසේ රෝස තිරුවාණා කඳුවැටිය අක්කර 300 - 700 අතර භූමි ප්‍රමාණයකින් යුක්ත වේ. වසර මිලියන 500 ක ඉතිහාසයකට උරුමකම් කියන රෝස තිරුවාණා කඳුවැටිය ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් වේ. මෙය සොබා දහමේ විස්මිත නිර්මාණයකි. ක්‍රිස්තු පූර්ව 02 වැනි සියවසේ දී අනුරාධපුර මුල් යුගයේ රජකම් කළ දේවානම්පියතිස්ස රජු සමයට අයිති බෞද්ධ සිද්ධස්ථානයකි. බොහෝ රජවරුන් මෙම සිද්ධස්ථානය වැඩිදියුණු කොට රැකවරණය ලබා දී ඇත.

අප රට මොනතරම් ගස්වැල්වලින් පිරිපුන් වනාන්තරවලින් සශ්‍රීක රටක් වුව ද 21 වැනි සියවසය වන විට මිනිස්සු බොහෝ මහන්සි වූයේ කොන්ක්‍රීට් වනාන්තර බිහි කිරීමට ය. රටේ බහුතරය එසේ කටයුතු කරමින් සිටියදී මේ මහා නා ගස්වලින් පිරුණු ඓතිහාසික වනස්පතිය බේරා ගැනීමට ශ්‍රේෂ්ඨ ශ්‍රී ලාංකිකයෙක් වගේම උතුම් බුද්ධ පුත්‍රයන් වහන්සේ නමක් වන වනවාසී රාහුල හිමියෝ ඉදිරිපත් වූහ. එවකට මිනිස් වාසයෙන් තොර වූ ඒ මහා මූකලාන බේරා ගැනීමේ සටන සුළුපටු නොවීය. උන්වහන්සේ තම රට ජාතිය වෙනුවෙන් ඒ භාරධූර කටයුත්ත මහත් අභිමානයෙන් තමන් වහන්සේගේ කරට ගත්හ. ඒ පිළිබඳ උන්වහන්සේ තමන් වහන්සේගේ මතකය අවදි කළහ.

"1991 මාර්තු 28 වැනි දින මම මෙම ඓතිහාසික මෙහෙයුම ආරම්භ කළා. ඒ වන විට මිනිස් වාසයට සුදුසු පරිසරයක් මෙහි තිබුණේ නැහැ. දැව ජාවාරම්කරුවෝ, නිධන් හොරු මේවා විනාශ කරලා තිබුණේ. මොර ගහක් උඩ පැලක් අටවාගෙන රටක් වශයෙන් ජාතියක් වශයෙන්, මම මේ මෙහෙයුම ජය ගන්නවා කියන අධිෂ්ඨානය ඇතිව පටන් ගත්තා. වසර 2000ක පැරැණි ඉතිහාසයක් නාමල් උයන සතු වන අතර, කියන්න බොහොම සතුටුයි, 2023 මාර්තු මස ජාතික නාමල් උයනේ 32 වැනි සංවත්සරය යෙදිල තිබුණා.

රෝස තිරුවාණාවල ඇති ශක්තිය මොනතරම් ද කිව්වොත් මේ විශ්ව ශක්තිය, ගබඩා කොට තිබෙන ස්ථානවලින් එකක් වනවා. අර්ධ මැණික් වර්ගයක් වීම අති විශේෂ කාරණාවක්.. ඒ වගේම මෙම මැණික් වර්ගය මානසික සුවය ලබා දෙනවා වගේම කායික සුවයක් ලබා දෙනවා. රෝග රැසකට ඖෂධයක් වෙනවා. ලෝකයේ විවිධ රටවලින් සංචාරකයන් පැමිණියත් ජපන් ජාතිකයින් රෝස තිරුවාණාවල ශක්තිය ලබා ගැනීමට වැඩි වශයෙන් මෙහි පැමිණීම සුවිශේෂී වෙනවා. ජෛව විවිධත්වය සහ පාෂාණ පිළිබඳ අධ්‍යයනයේ යෙදෙන පර්යේෂණ පවත්වන අයට, එවැනි දෑ ගැන අධ්‍යයනය කරන අයට වගේම කඳු තරණය කරන්නන්ට මම ආරාධනා කර සිටිනවා මෙහි පැමිණෙන්න, මෙහි දී ඔබට අධ්‍යාපන වටිනාකමක් වගේම හොඳ අත්දැකීමක් ලැබේවී."

මේ සම්පත ජාතික උරුමයක්. අපි මෙය අපේම දෙයක් ලෙස රැකගත යුතුයි. අපි වැඩි වැඩියෙන් ජාත්‍යන්තරයේ අවධානය දිනා ගත යුතු වනවා. මක්නිසාද අප රටට සංචාරකයන් වැඩි වශයෙන් ගෙන්වා ගැනීමට නම් මේවා ආරක්ෂා කොට වැඩිදියුණු කළ යුතුයි.

ජාතික නාමල් උයනේ ආරම්භයේ සිට අද දක්වාම පැවැති සියලු රජයන්ගේ සහාය ජාතික නාමල් උයන සඳහා ලැබී තියෙනවා. මම කා සමඟවත් කිසිදු ගැටලුවක් ඇති කරගෙන නැහැ. මක්නිසාද මම දේශපාලනය කරන භික්ෂුවක් නොවේ. මම බොහෝම සත්භාවයෙන් මේ කර්තව්‍යයට සෘජු නායකත්වය ලබා දුන්නා පමණයි. ආරම්භක අවස්ථාවේ සිට 2018 වර්ෂය දක්වා මෙහි සියලුම පරිපාලන කටයුතු කළේ මම. ඉන්පසුව මම ජාතික නාමල් උයන මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත ලිඛිතව භාරදුන්නා. දැන් මෙහි සියලුම මෙහෙයුම් කටයුතු ඒ හරහා සිදුවෙනවා. මම බෞද්ධ භික්ෂුවක් හැටියට අත්හැරීම කියන වචනයට නියම අර්ථය වටහාගෙන කටයුතු කළා. මෙය සියල්ලන්ට ම උතුම් ආදර්ශයක් වෙනවා. මක්නිසාද කොයි කවුරුත් කැමති පාලන බලයක් තමන් සතුව තියෙනවා නම්. මා මෙහි අයිතිකරුවා නොවේ, මුරකරුවා පමණයි.

සියලු සත්වයාගේ හිත සුව පිණිසයි මා මේ මෙහෙවර ආරම්භ කළේ. ඒ වගේම මෙහි අයිතිය සියලුම ජාතීන්ට හිමි වෙනවා. බෞද්ධයන් පමණයි කියන ලේබලය කොහෙවත්ම වලංගු වන්නේ නෑ. ජාතික නාමල් උයන නැරඹීම සඳහා ලංකාවේ සියලුම පළාත්වල සිංහල, දෙමළ, මුස්ලිම්, කතෝලික පාසල්වල සිසුන් පැමිණෙනවා. ඒ වගේම දෙස් විදෙස් උගතුන්, බුද්ධිමතුන් ඇතුළු සියලුම සංචාරකයන් මෙහි පැමිණෙනවා. මෙහි ඇති අධ්‍යාපනික දැනුම ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සපයා දීමට වගකිවයුතු බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුයි.

භූ විද්‍යාව, පරිසර විද්‍යාව හා පුරාවිද්‍යාව පිළිබඳ පරීක්ෂණ කිරීමට මෙය හොඳම තෝතැන්නක්.

වනවාසී රාහුල හිමියන් සියලු ජාතීන්ගේ ගරු බුහුමන් ලබන තම රට ජාතිය වෙනුවෙන් අමිල මෙහෙවරක් ඉටුකරන උතුම් හිමිනමකි. 2004 වසරේ ජනාධිපති පරිසර සම්මානයෙන් වනවාසී රාහුල හිමියන් පිදුම් ලබන ලදී.

ජාතික නාමල් උයන ව්‍යාපෘතියෙන් තවත් ජාතික මෙහෙවරක් ඉටු වන බව රාහුල හිමියෝ පැවසූහ.

එනම් නිවාස අහිමි අයට නිවාස ලබාදීම, අධ්‍යාපනය ලබන දරුවන්ට අවශ්‍ය උපකරණ ලබාදීම, රෝගීන් සඳහා ආධාර උපකාර ලබා දීම වැනි බොහෝ ප්‍රජාසත්කාර වගේම මේ ප්‍රදේශයේ කිවුල් වතුර වෙනුවට පිරිසුදු පානීය ජලය පවුල් 5000ක් වෙත ලබාදීමට ද කටයුතු කර තිබෙනවා. ප්‍රදේශයේ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ද සෘජු දායකත්වයක් ලබා දී තිබෙනවා.

ජාතික නාමල් උයන වසර 32ක් සපිරෙන මේ මොහොතේ වනවාසී රාහුල හිමියන්ගේ පණිවිඩය වන්නේ "බෙදී වෙන්වලා හිටපු කාලය අවසන් කොට ජාතිවාදය, ආගම්වාදය තවදුරටත් මාතෘකාවක් කොට නොගෙන, අපි හැමෝම ශ්‍රී ලාංකිකයන් විදිහට ජාතික නාමල් උයනේ දී, අත්වැල් බැඳගෙන ආකල්පමය වෙනසක් ඇති කරමු." යන්නයි.



# සම්බුදුරජාණන් වහන්සේගේ දෙවැනි ලංකාගමනය හා සබැඳෙන බක් පුරපසළොස්වක පෝ දා

**බක් මාසයේ සිදු වූ වඩාත් ම වැදගත් ශාසනික සංසිද්ධිය නම් බුදුරජාණන් වහන්සේගේ දෙවැනි ලංකාගමනයයි.**

සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩසිටි බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පස් වැනි වර්ෂයේ බක් මස අව පසළොස්වක් පොහෝ දින ලක්දිව සිටි චූලෝදර හා මහෝදර යන නාග ගෝත්‍රික රජුන් දෙදෙනා අතර මිණිපළ ගක් වෙනුවෙන් ඇතිවීමට ගිය ආරවුලක් සංසිඳුවීමට සෘද්ධියෙන් ලක්දිවට වැඩම කළ සේක.



මෙම නාරජවරුන් ලක්දිව සිටි නාග ගෝත්‍රික රජවරුන් වශයෙන් අනුමාන කෙරෙයි. මහෝදර නාග රාජයා මුහුදේ පන්සිය යොදුනක් විශාල වූ නාග භවනෙහි ආධිපත්‍යය

විට තවත් සුවිශේෂී සිදුවීම් දෙකක් බක් පොහෝ දිනය හා සබැඳෙයි. බුදුවීම සඳහා අභිනිෂ්ක්‍රමණය කිරීමට සිදුහත් කුමරුගේ සිත නැඹුරු වූයේ සතර පෙර නිමිති දැකීමෙනි. සතර පෙරනිමිති අතුරින් පළමු පෙර නිමිත්ත වූ මහල්ලකු දුටුවේ බක් පොහෝ දිනයක ය. ඉන් පසු මසකට එක බැගින් අනෙක් පෙර නිමිති තුන දැකීමෙන් පසු ඇසළ පොහෝ දින අභිනිෂ්ක්‍රමණය සිදු වූ බව පිළිගැනීමයි. ඒ අනුව අභිනිෂ්ක්‍රමණය පිණිස සිදුහත් කුමරුගේ සිත මුලින් ම නැඹුරු වූයේ බක් පුර පසළොස්වක පොහෝ දිනයක දී ය.

අනෙක් සිදුවීම නම් බුද්ධත්වයෙන් පසු මැදින් පුර පසළොස්වක පොහෝ දිනය ආරම්භ කළ

දැරීය. මහෝදර නා රජුගේ සහෝදරිය කන්වඩමන් නම් පර්වතයෙහි විසූ නා රජකුට විවාහ කර දී තිබුණි. මෙම පිරිස ගොඩ විසූ නාගයන් ලෙස හැඳින්වෙයි. එම නැඟනියගේ පුත්‍රයා චූලෝදර නම් විය. මෙම ගොඩබිම සහ මුහුදේ විසූ නාග කොට්ඨාස දෙක ම අතිශය බලවත් දෙපිරිසක් වූ බව මූලාශ්‍රවල කියැවේ.

මහෝදරගේ පියා වූ නාග රාජයා කළුරිය කරද්දී තමා සතු වූ මැණික් පුටුව හෙවත් මිණිපළඟ දියණියට ලබා දී තිබූ අතර එහි අයිතිය තමා වෙත ලබා ගැනීමට මහෝදර නා රජු චූලෝදර නම් වූ තම බෑණනුවන් සමග යුද්ධයට එළඹියේ ය.

ඇතිවීමට යන උවදුර දුටු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ දොරකඩ කිරිපලු රැකට අරක් ගෙන සිටි සමිද්ධි සුමන දිව්‍ය රාජයා සමඟ ලක්දිවට වැඩම කළ සේක.

පෙර භවයේ ලක්දිව නාගදීපයේ ඉපදී එකල කිරිපලු රුකක් මුල වැඩ හිඳ දන් වළඳන පසේ බුදුවරයන් වහන්සේ දැක උන්වහන්සේට පාත්‍ර පිරිසුදු කිරීමට කොළ කඩා දුන් පිනෙන් දෙව්රම් වෙහෙර අසල කිරිපලු රුකෙහි දෙවියකු වී ඉපදුණු බව මහාවංසයේ කියැවේ. සමිද්ධි සුමන දෙවිඳුන් තම වාසභවනය වූ කිරිපලු රුක උදුරා ඡත්‍රයක් වශයෙන් බුදුහිමියන්ට සෙවණ පිණිස ඔසවාගෙන පැමිණියේ ය.

බුදුරජාණන් වහන්සේ බක් මස අවපසළොස්වක හෙවත් අමාවක පොහෝ දින උදෑසන ලක්දිවට වැඩම කරවා අහසෙහි හිඳ ඝන අන්ධකාරයක් සහ ඉන් පසු ආලෝකයක් මවා නාගයන් දමනය කළහ. දැමුණු නාගයෝ බුදුරජාණන් වහන්සේ සරණ ගියහ. එම පිරිසට යුද්ධයේ ආදීනව පෙන්වා දී සසර ආදීනව, අන්‍යයන්ගේ දොස් දැකීමේ ආදීනව විස්තර කර සමඟිබවේ අනුසස් සහ වෛරයෙහි ආදීනව දැක්වෙන කාකෝලූක, ඵන්දන, ලටුකික, වට්ටක යන ජාතක කථාවන්ගෙන් දහම් දෙසූහ.

දම් අසා ප්‍රසාදයට පත් නාග රජවරු තමන් යුද්ධයට එළඹීමේ නිමිත්ත වූ මිණි පළඟ බුදුරජාණන් වහන්සේට පූජා කළහ.

අහසින් පොළොවට වැඩ මිණිපළඟෙහි වැඩහුන් බුදුරජාණන් වහන්සේ වෙත නාගයෝ දානය පූජා කළහ. මෙහිදී අසූ කෝටියක් නාග පිරිස් තෙරුවන් සරණ ගිය අතර, මහෝදර නාරජුගේ මාමා වූ කැලණියේ විසූ මණිඅක්ඛික නා රජු තම වාසභවනට වැඩමවන ලෙස බුදුරදුන්ට ආරාධනා කළේ ය.

සමිද්ධි සුමන දෙව් රජුගේ වාසභවනය වූ බුදුරදුන්ට සෙවණ සැලසූ කිරිපලු රුක සහ නා රජවරුන් පිදූ මිණිපළඟ පාරිභෝගික චෛත්‍යයක් වශයෙන් සලකා වැඳුම් පිදුම් කිරීමට නාගයන් වෙත ම පවරා බුදුරජාණන් වහන්සේ දෙවුරම් වෙහෙරට වැඩම කළහ. මෙම මිණිපළඟ නිධන් කොට නාගදීප චෛත්‍යය බඳවා තිබේ.

බුදුරදුන්ගේ දෙවැනි ලංකාගමනය හැරුණු කිඹුල්වතට වැඩමවීමේ ගමන් මගෙහි අර්ධයක් සම්පූර්ණ කරන ලද්දේ බක් පොහෝ දිනයක දී ය. රජගහනුවර වේළුවනාරාමයේ සිට කිඹුල්වත්පුරය දක්වා යාමට මැදින් පෝ දා ආරම්භ කළ සැට යොදුන් මඟෙහි යොදුන් තිහක් සම්පූර්ණ කරන ලද්දේ බක් පුර පසළොස්වක දිනය දී වීම ද විශේෂ සිදුවීමකි.

මෙලෙසින් ඉතා වැදගත් ශාසනික කරුණු කිහිපයක් අනුස්මරණය කරනු ලබන බක් පුර පසළොස්වක පොහොය දිනය ලෝකවාසී බොදු දනන්ගේ හිතසුව පිණිස ධර්මාවබෝධයට හේතුවන දිනයක් බවට පත් කර ගැනීමට සියල්ලෝ ම කටයුතු කරත්වා.



රාජකීය පණ්ඩිත
**දෙදියගල නන්දරතන හිමි**

## ලොව සැනසේවා සුමියුරු වදනින්

තෙපළා සුමියුරු වදන්
සනසනු සැම සිත් තුටින්
විස කටුවැනි රුදු බසින්
පෙළනු එපා සත දුකින්

රුවන් රිදී මුතු මැණික්
නියම කළැකි හොඳ මිලක්
මියුරු රසැති මුදු වදන්
අමිලය ලොව නැති නිමක්

අරුතක් නැති පුහු වදන්
යවුලකි පෙළනා සවන්
සතහට නොමැතිය සියුම්
සතුටක් කිසි කල එයින්


තැනට ඔබින පිය හැඟුම්
තෙපළන සැම ලොව උතුම්
මහ කරුණා බුදු උවම්
ලොව වේ පින්බර සිතුම්

ආචාර්ය
**රත්නපාල වික්‍රමසිංහ**



# තමන්ගේ ගෞරවය රැකෙන්න අනුන්ගේ ගරුත්වය රකින්න

**සිරුරත්, මනසත් ලද පමණින් පුද්ගලයෙක් මිනිසෙක් බවට පත් නොවේ. ක්‍රියාවත්, වචනයත් යමකුගේ මිනිසත් බව ප්‍රදර්ශනය කරන වේදිකා දෙකකි. මේ වේදිකා දෙකේ රඟ දක්වන ආකාරය මත ඕනෑම පුද්ගලයෙක් මිනිසෙක්, දෙවියෙක්, තිරිසනෙක්, යකෙක්, භූතයෙක් හෝ ප්‍රේතයෙක් ආදි වශයෙන් ඒ ඒ පුද්ගලයාගේ ක්‍රියාව හා වචනය මත තමා කවරෙක් දැයි තීරණය වනු ඇත.**



ක්‍රියාවත්, වචනයත් යහපත් හෝ අයහපත් වීමට මූලික වන්නේ මිනිසා සතු මනස හෙවත් සිතයි. 'මනෝ පුබ්බංගමා ධම්මා, මනෝසෙට්ඨා මනෝමයා' යනුවෙන් සියල්ල මනස පෙරටුකොට ඇත, මනස ශ්‍රේෂ්ට කොට ඇත සහ මනස ප්‍රධාන කොට ඇත යනුවෙන් ශාන්ති නායක බුදු පියාණන් වහන්සේ දේශනා කළ සේක. එනිසා අයහපත් මනසින් පිටවන වචනය නරකට නපුරට යොමුවූ දුෂ්ඨ කුරිරු පාපී වචනයක් ම වේ. එම වචනය තමාටත් අන්‍යයන්ටත් හානිය පිණිස, විනාශය පිණිස ඒකාන්තයෙන් ම පවතී.

නරක නපුරු දුෂ්ට කුරිරු සිතකින් යුත් ක්‍රියාව ද යහපත පිණිස පවතින්නේ නැත. එවැනි ක්‍රියා තමාගේත්, අන්‍යයන්ගේත් විනාශය පිණිස ම හේතුවේ. මේ අනුව අයහපත් මනසින් පිටවන වචනයත්, අයහපත් මනසින් සිදුකරන ක්‍රියාවත් කරත්තය ඇදගෙන යන ගොනා පසුපස පැමිණෙන කරත්ත රෝදය මෙන් තමා පසුපස විපාක දෙමින් පැමිණෙන බව 'තතො නං දුක්ඛමන්වෙති චක්කංව වහතෝ පදං' යන බුද්ධ භාෂිතයෙන් මොනවට පසක් වේ.

තෘප්තියට පත්නොවන අසීමිත ආශාවන්ගෙන් තොර, අනිවාර්ය අවශ්‍යතා පමණක් සපුරා ගන්නා, සරල, චාම්, පරිසර හිතකාමී දිවිපෙවෙතක් පිළිබඳ බුදුදහම නිර්දේශ කරන්නේ මිනිසා සොබාදහම අතික්‍රමණය නොකළ යුතු හෙයිනි. උපාසක උපාසිකා උදෙසා නිර්දිශ්ට නිත්‍ය ශීලය වූ පංච ශීලයෙන් ද මේ බව මනාව තහවුරු වේ. මිනිසාගේ ක්‍රියාවත්, වචනයත් පංච ශීලය තුළ සොබාදහමට හිතකාමී ලෙස හික්මවන්නට ගෙන ඇති ප්‍රයත්නය අතිවිශිෂ්ට ය.

පළමු ශික්ෂා පදයෙන් අනෙක් ජීවීන්ගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කරන අතර එකී ජීවීන් ආරක්ෂා කිරීම නැමැති උතුම් යුතුකම මනාව ඉෂ්ට සිද්ධ කරනු ලැබේ. අන්‍යයන් සතු දෑ පැහැර ගන්නේ නැති බැරිකම හා දැඩි ආශාව හේතුවෙනි. නැති බැරිකම හොරකමක් කිරීමට සාධාරණ හේතුවක් නොවේ. යහපත් මනසින් යුත් යම් තැනැත්තෙක් වේ නම්, ඔහු උත්සාහයෙන් හා කැපවීමෙන් සිය අවශ්‍යතා සාධාරණව සපුරා ගනී. එබැවින් හොරකමට බුදුදහමේ කිසිදු ඉඩක් නැත

බුදු දහමට අනුව හොරකම් නොකිරීමටත්, අන්සතු වස්තූන් සුරක්ෂිත කිරීමටත් පැහැදිලි යුතුකමක් හා වගකීමක් මිනිසාට ඇත.

පසිඳුරන් අසීමිතව පිනවීම පුද්ගලයකුගේ අභිවෘද්ධිය හීනවීමට ඉවහල් වේ. තවද පසිඳුරන් අසීමිතව පිනවන්නා අන්‍යයන්ගේ ගෞරවය කෙළෙසන්නෙකි. අන්‍ය ගෞරවය ආරක්ෂා කිරීම සැමගේ යුතුකමක් හා වගකීමක් වේ. එය පංච ශීලයෙහි තුන්වැනි ශික්ෂා පදයෙන් ආරක්ෂා කෙරේ. එය ද සොබාදහමට ම අනුකූල වූ පැනවීමක් බව පැහැදිලි ය. කෙසේ වුව ද සමස්ත පංච ශීලයම යුතුකම් හා වගකීම් පිළිබඳ සොබාදහමට අනුකූල වූ නියමයන් පද්ධතියකි. එකී යුතුකම්වලින් හා වගකීම්වලින් මිනිසා මුක්තනොවීම පංච ශීලයෙහි ඇති විශේෂත්වයයි. මේ අන්දමින් පංචශිල ප්‍රතිපදාව සොබාදහමේ අභිමතයට අනුකූලව එය අබිබවා නොයමින්, ජීව අජීව සියලු වස්තූන්ගේ උන්නතිය වෙනුවෙන් කැපවීම කොතරම් නම් චමත්කාරජනක ද?

එසේම තමාටත් අන්‍යයන්ටත් යහපත පිණිස ඉවහල් වන සාර්ථකවූත් සරලවූත් දිවිපෙවෙතකට පංච ශීල ප්‍රතිපත්තිය පමණක් වුව ද ප්‍රමාණවත් ය.



ත්‍රිකුණාමලය ජයසුමනාරාමාධිපති
කැලණිය විශ්වවිද්‍යාලයේ
වාග්විද්‍යා අධ්‍යයන අංශයේ
**ආචාර්ය කපුගොල්ලෑවේ ආනන්දකිත්ති හිමි**

# සිඳී ගිය මෙත් ගඟුළ – උදම්මිට නා සමිඳු

| | |
|---|---|
| නික්මී ගිය ද දිනකර ලොවැ එළිය | කර |
| සැක නැහැ යළිදු පායයි කළු දෙබෑ | කර |
| නා සමිඳුගේ සවිමත් හඬ අරුත් | බර |
| සුදිලෙන තරු විලස පායයි හද | අඹර |
| රන්දු මිනිස්කම ශ්‍රාවක හද | පත්ල |
| සිඳී ගියත් කරුණාබර මෙත් | ගඟුල |
| සත්‍ය වදන් පද නාහිමි නිති | මතුළ |
| සැමදු ගිගුම් දෙයි උත්තම වෙහෙර | තුළ |
| හදවත ලස්සනයි නෙත්සිත් ගත් | මලට |
| කෙසරිඳු පසුබසියි නා සමිඳුගෙ | හඬට |
| උත්තම ගුණය පෙන්වා ලොවට ම | හැඩට |
| සමුගෙන වැඩියෙ උත්තම මිනිසකු | ලෙසට |
| පින්සරු වුණෙමු නා සමිඳුන් දැක | ගන්ට |
| බැහැ ගුණවරුණ මට වදනින් | පවසන්ට |
| උපදින බවේ හමුවේවා හිමි | අපට |
| අමර නිවන් සුව අප නා | සමිඳුන් ට |
| නිවනට යන්නෝ අද හරි | විරලයි |
| අපා දකින්නෝ නම් අද | බහුලයි |
| මදහස පාමින් පැවසූ | වදනයි |
| නාහිමි උපදෙස සැමදු | මතකයි |

**උදම්මිට ධම්මානන්ද හිමි**



**ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ අඹගහපිටිය පාර්ශ්වයේ වැඩ බලන මහා නායක ධුරන්ධරව වැඩ විසූ උදම්මිට උත්තමාරාම පුරාණ විහාරාධීශ්වර අති ගෞරවණීය උදම්මිට අස්සජීතිස්ස මහා ස්වාමීන්ද්‍රයාණන් වහන්සේගේ තෙමස් පූර්ණ පින්කම නිමිත්තෙනි!**

# අජාන් බ්‍රහ්මවංසෝ හිමියන්ගේ දම් දෙසුම් මාලාවක් ශ්‍රී ලංකාවේදී

**ජනතාවට සමීප ධර්ම දේශකයන් වහන්සේ නමක් ලෙස සුපතළ අජාන් බ්‍රහ්මවංසෝ හිමියන් ලබන මස නැවතත් ලංකාවට පැමිණීමට නියමිත ය.**



අජාන් බ්‍රහ්මවංසෝ හිමියන්ගේ දෙසුම සරල ය. උන්වහන්සේගේ නිරන්තර සිනාවෙන් යුතු නිහතමානි මුහුණ ධර්ම දේශනාවට සම්බන්ධ වන පිරිස සතුව යම් පීඩනයක් වේ නම් ඒ සියල්ල සමනයට පත් කරනු සමත් බව බොහෝ දෙනාගේ අදහස ය.

උන්වහන්සේ මෙරට වැඩවසන කාලය තුළ ප්‍රධාන වැඩසටහන් ත්‍රිත්වයක නියැළීමට කටයුතු කර ඇති බව සංවිධායකයෝ පවසති. මැයි 20 සිට 30 දක්වා දින නවයක භාවනා වැඩසටහනක් බණ්ඩාරවෙල දී සිදු කරන අතර, එයට භික්ෂු, භික්ෂුණී සහ ගිහියන් 150 දෙනකු සහභාගිවීමට නියමිත ය.
වෘත්තීයවේදීන් සහ ව්‍යාපාරිකයන් සඳහා ම සුවිශේෂී වූ විශේෂ දෙසුමක් මැයි 29 දින ගාලුමුවදොර හෝටලයේ දී පවත්වනු ලැබේ. ධර්ම දේශනය සහ භාවනා උපදෙස් වැඩසටහන් මැයි 30 වැනි දින පෙරවරු 7 සිට 11 දක්වා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වනු ලැබේ. මෙහි ශාලා 3 ක දී සැසිවාර සංවිධානය කර ඇති අතර, උන්වහන්සේ ඉංග්‍රීසි භාෂාවෙන් දේශනය පවත්වනු ලබන අතර, පසුව සිංහලෙන් සාරාංශගත කරනු ඇත.

බණ්ඩාරවෙල භාවනා වැඩසටහනට සම්බන්ධවීමට කැමති භික්ෂූන් වහන්සේට සහ භික්ෂුණීන් වහන්සේ ajahnbrahmsociety @ gmail. com විද්‍යුත් තැපෑලෙන් ලියාපදිංචි කිරීමේ පෝරමය ලබාගත හැකි බව ශ්‍රී ලංකා අජාන් බ්‍රහ්ම සමාජය දන්වා සිටී.

සම්පූර්ණ කරන ලද අයදුම්පත අප්‍රේල් මස 10 වැනි දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

මැයි 30 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වෙන සැසියට සහභාගි වීම සඳහා

ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරය,
තුම්මුල්ල, කොළඹ 05,
බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
25 ඇන්ඩසන් පාර, නැදිමාල,
දෙහිවල.
සමයවර්ධන පොත්හල,
බෞද්ධ මහා සම්මේලනය 380,
බෞද්ධාලෝක මාවත, කොළඹ 7,
සරසවි පොත්හල One Galle Face යන ස්ථානයන්ගේ මාර්තු 15 සිට නොමිලයේ අවසරපත් ලබා ගත හැකි ය.

# නිවැරැදිව පිහිටුවා ගත් සිත ජීවිතයට පිහිටකි

**උපන් දා පටන් අප මවුපියන්ගේ සිට ඥාතීන්,අසල්වැසියන් ආදී වශයෙන් නොයෙක් අය සමඟ බන්ධනයන් ඇති කර ගනිමු. කුඩා කල සිට යොවුන් විය දක්වා මවුපියන් හා දැඩිව බැඳෙන අප ඉන් අනතුරුව බැඳෙන්නේ තමා අතිනත ගන්නා ස්වාමි දියණිය සමඟ ය.**

කෙමෙන් කෙමෙන් කාලය ගතවෙද්දී දූ දරුවන් ලබා ඔවුන් සමඟින් බැඳෙන්නේ අන් බැඳීම්වලට වඩා දැඩි ලෙසිනි. මේ අයුරින් ඇති කර ගනු ලබන බැඳීම් උපාදාන යන නාමයෙන් ධර්මය තුළ සඳහන් වේ.

පටිච්ච සමුප්පාදය තුළ ද මෙම උපාදානය විස්තර වන්නේ මෙලෙසිනි.

**“තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති”**

මෙහිදී අපට පෙනෙන්නේ තණ්හාවෙන් උපාදානයත්, උපාදානයෙන් භවයත්, භවය කරණ කොටගෙන ඉපදීමත් සිදු වන ආකාරයයි. අප මේ අනන්ත වූ සංසාරය පුරාවට මැරෙමින් ඉපදෙමින් ගමන් කරන්නේ ද මෙම කරුණු නිසාවෙනි. අප තුළ පවත්නා නොදැනීම නිසාවෙන් අප දකින බලන විඳින සෑම දෙයක් සමග බැඳීමක් ඇති කර ගනු ලබයි. එහි අවසාන ප්‍රතිඵලය වන්නේ දුක් විඳිමින් මෙන්ම තාවකාලික සැපයක් වින්දනය කරමින් සසර පුරා ඇවිදීම ය.

බුදුරජාණන් වහන්සේ තරම් මෙම ලෝකය පිළිබඳවත්, සත්වයා පිළිබඳවත්, කරුණු දන්නා අන් කෙනෙක් නොමැති බව අවිවාදිත ය. එබැවින් උන්වහන්සේගේ සෑම දේශනාවක ම අන්තර්ගතය තුළ ඇතුළත් වන්නේ සත්වයා දුකින් නිදහස් කිරීමට අවශ්‍ය කරන මාර්ගෝපදේශනය ලබා දීම ය.

ඉහත සඳහන් ගාථා පාඨය ද එලෙසින් සත්ත්වයාගේ දුක නිවා සැප ලබන්නට මඟ කීමට දේශිත ගාථාවකි. පෙර සඳහන් කළ පරිද්දෙන් යමකු උපාදාන ඇති කර ගන්නේ නම්, ඒ සඳහා සෘජුව ම බලපානු ලබන ඉන්ද්‍රියන් අතර පෙරමුණෙන් ම සිටින්නේ සිතයි. කර්මය පිළිබඳ සඳහන් කරන තැන දී බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද්දේ සිත ඒ සඳහා මූලික වන බවයි.

එලෙසින් අප යමක් සමග හෝ යමෙකු සමග ඇති කර ගනු ලබන උපාදානය, නො එසේ නම් බැඳීම සඳහා ද සිත මූලික වෙයි.

මවුපියන් හා දරුවන් අතර ඇතිවන බැඳීම, ස්වාමියා හා භාර්යාව අතර ඇතිවන බැඳීම, ගුරුවරුන් හා ශිෂ්‍යයන් අතර ඇතිවෙන බැඳීම ආදී බැඳීම් සියල්ල ම පාහේ සිත මූලිකව ම ඇතිවන්නක් බව සනිදර්ශනාත්මකව වටහා ගැනීමට පුළුවන.

එමෙන්ම සිතින් සිතා උපාදානය නැති කළහොත් සැප ලැබීමට හැකි වන බව ද බුදුරජාණන් වහන්සේ දේශිත ය.

සැප යන්න පිළිබඳ විමසීමේ දී එහි ආකාර දෙකක් දැක ගත හැකි ය. එනම් ලෞකික සැප හා ලෝකෝත්තර සැප වශයෙනි. ධම්ම පදයේ චිත්ත වග්ගයේ එන ඉහත සඳහන් ගාථාවේ අපට ලෞකික ජීවිතයේ සැප සලසා ගැනීමට උදව් වන අය කිහිපදෙනකු සම්බන්ධයෙන් සඳහන් වේ. මෑණියන්, පියාණන්, අනෙක් ඥාතීන් ආදීන් මේ අතර මූලිකව දැක ගන්නට ලැබෙන පිරිසයි.

කුඩා කල පටන් තම දරුවාට අවශ්‍ය රැකවරණයත් පෝෂණයත් ලබාදී අනතුරුව යොවුන් වියේ දී අවැසි පරිද්දෙන් ආවාහ විවාහ, රැකීරක්ෂා සම්පත් හා මිල මුදල් ආදිය ලබා දෙමින් දරුවාට සුඛදායක දිවිපෙවෙතක් ලබා දීමට මවුපියන් කටයුතු කරති. මේ අතරට ඥාතීන් ද ඇතුළත් වෙති. එහෙත් මරණයෙන් පසුව මෙන් ම ජීවත්ව සිටින කාලය තුළ ද චිත්ත අභ්‍යන්තරය තුළ ඇතිවන ඇතැම් ගැටලු සඳහා ද කිසිවකුටත් සහාය වීමට නොහැකි ය. එහිදී අපගේ මනසට එන මූලිකම අදහස වන්නේ සිත සකස් කර ගැනීමයි. නොදැමී පවතින සිත පෙර දැක්වූ කරුණු පරිදිම

> **“උපතේ පටන් මරණ මංචකය දක්වා අප ඇති කර ගනු ලබන්නේ බැඳීම් ම ය. එමෙන්ම දකින දකින දෙයට ආශා කරමින් බොහෝ කාමභෝගී ජීවිත ගත කරන අප නිවැරැදිව සිත පිහිටුවීම, සිත දමනය කිරීම කළ යුතු ම ය. එසේ නොවන්නේ නම් අපට ද මෙලොවත් පරලොවත් දුක් මුසු බොහෝ අත්දැකීම්වලට පත්වීමට සිදුවේ.”**

දුක්ඛිත විපාකයන්ට අපව කැඳවා ගෙන යයි.

දිනක් සොරෙය්‍ය නම් සිටුවරයෙක් තම යහළුවන් පිරිසක් සමඟ නගරයෙන් පිටත දිය නෑමට ගමන් කරමින් සිටියේ ය. එම අවස්ථාවේ දී මහා කච්චායන මහ තෙරුන් වහන්සේ ද පිඬු පිණිස ඒ අතරමඟ හැසිරෙමින් සිටියහ. උන්වහන්සේගේ රන්වන් සිරුර දුර තියාම දුටු සොරෙය්‍ය සිටාණන්ගේ සිත එයට ලොබ බැන්දේ ය. “මටත් මෙවැනි රූ සපුවක් ඇති බිරියක් සිටියේ නම් කෙතරම් අගේ ද? මුන් වහන්සේ මගේ බිරිය වූයේ නම් කෙතරම් වටීද?” වශයෙන් සිටුතුමාට සිහි විය.

එවේලෙහි ම ඔහු කාන්තාවක් බවට පරිවර්තනය විය. පසු ව මොහුට වෙනත් සිටුවරයකු හා සරණ යන්නට ද සිදුවිය. කාලානුරූපව මෙම සිටුවරයාට දාව දරුවන් දෙදෙනෙකු ද කාන්තාවක් බවට පරිවර්තනය වීමෙන් පසුව දරුවන් දෙදෙනකු ද වශයෙන් දරුවන් හතර දෙනකු විය.

පසු කලෙක මෙම කාන්තාවක් බවට පත් වූ සිටුවරයාගේ මිත්‍රයකු මහා කච්චායන තෙරුන් හමුවේ එම සියලු පුවත් සැළ කළහ. ඉන් අනතුරුව මහා කච්චායන තෙරුන් වහන්සේ සමීපයට ගොස් තෙරුන් වහන්සේට දානය පූජා කොට උන්වහන්සේ කමා කර ගැනීමෙන් පසුව සිටුවරයා නැවතත් පිරිමි ස්වභාවයට පත්විය. අනතුරුව පැවිදිව නොබෝ දිනකින් ම රහත් භාවයට පත් විය.

සිත නිවැරැදිව පිහිටුවා නොගැනීම, සිත දමනය කර නොගැනීම තුළ එවැනි බරපතළ භයානක විපාකයන්ට පවා සසර තුළ මුහුණ පෑමට සිදුවන බව දැක්වීමට පෙර කී කතා පුවත කදිම උදාහරණයකි.

උපතේ පටන් මරණ මංචකය දක්වා අප ඇති කර ගනු ලබන්නේ බැඳීම් ම ය. එමෙන්ම දකින දකින දෙයට ආශා කරමින් බොහෝ කාමභෝගී ජීවිත ගත කරන අප නිවැරැදිව සිත පිහිටුවීම, සිත දමනය කිරීම කළ යුතු ම ය. එසේ නොවන්නේ නම් අපට ද මෙලොවත් පරලොවත් දුක් මුසු බොහෝ අත්දැකීම්වලට පත්වීමට සිදුවේ.

සෑම දෙයක් පිළිබඳව ම අවබෝධයෙන් බලන්නට හැකි නම් අපට එවැනි දුක් අවම කර සැපවත් ව සැනසීමෙන් ජීවත් වීමට හැකි වන බව බුදුරජාණන් වහන්සේ ඉහත ගාථාව තුළින් දේශනා කොට වදාළ සේක.

මෙහිදී බුදු රජාණන් වහන්සේ මනාකොට පිහිට වූ සිත යනුවෙන් අදහස් කරන්නේ දස කුසල ධර්මයෙහි යොදන ලද සිතයි. දස කුසල ධර්මයන්ට සිත යොමු කිරීම යනු සිත, කය, වචනය යන තිදොර යහපතෙහි යෙදවීමයි. සතුන් මැරීමෙන් වැළකීමෙන්, සොරකම් කිරීමෙන් වැළකීමෙන් හා කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම යන කරුණු මඟින් කය යහපත් කර ගත හැකි ය.

එපමණක් නොව වචනයෙන් සිදු කරනු ලබන බොරු කීම, කේළම් කීම, හිස් වචන කීම, පරුෂ වචන කීම වැනි වාචසික අකුසල්වලින් ඈත් වී වචනය යහපත් කර ගත හැකි ය. සිත යහපත් කර ගැනීම සඳහා දැඩි ලෝභය අත්හැර, ක්‍රෝධ කිරීම දුරලා, වැරැදි දැකීමෙන් වැළකී කටයුතු කළ යුතු ය.

මේ අයුරින් සිත, කය , වචනය යන තිදොර දස කුසලයෙහි යෙදවීම මඟින් සිත මනාකොට පිහිටුවීමටත්, එසේම දෙමාපියන් ආදී වූවන්ට දිය නොහැකි සක්විති සැප, දෙව්ලොව සැප හා ලොව්තුරු සැප ලබා දීමටත් හැකියාව පවතී.

දෛනික ජීවිතයේ දී අප කෙතරම් මානසික පීඩනයකින් පසු වෙමු ද? නිවස තුළත්, ඉන් පිටතත් බොහෝ විට අප සිටින්නේ සැනසීමකින් නොවේ. එවැනි අසහනකාරී ව ජීවත්වන අපට සැනසුණු අයකු ලෙසින් මැරෙන මොහොත දක්වාම දිවි ගෙවන්නට නම් අප අනිවාර්යයෙන් ම සිත නිවැරැදිව පිහිටුවා, සිත දමනය කොට ජීවත් වන්නට මේ උතුම් බක් පොහෝ දින අධිෂ්ඨාන කර ගනිමු.





පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
**පොත්තේවෙල ඤාණලක්ඛණ හිමි**

# වැරැදි විවේචනය පුද්ගලයා මහත් විපතට පත්කිරීමට හේතුවෙයි

**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ ගණේගම දකුණ, බද්දේගම ශ්‍රී ඉන්ද්‍රසර ධර්මායතන විහාරාධිපති පරිවේණාධ්‍යක්ෂ විහාරගණයේ ප්‍රධාන අනුශාසක ශාස්ත්‍රවේදී**

**කෙරදේවල වජිරඤාණ ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය**




**ව්‍යක්ත, විනීත, බහුශ්‍රැත ධර්මානුධර්ම මහා ස්වාමින්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් ගිහි පැවිදි උභය පිරිසේ ම ගෞරවාදරයට පාත්‍රව සසුන් වැඩ වසන කෙරදේවල වජිරඤාණ නායක හාමුදුරුවනේ ඔබ වහන්සේගේ පැවිදි ජීවිතයේ ජීවන තොරතුරු දිග හරිමින්ම සාකච්ඡාව ආරම්භ කරන්න.**

මම ජන්මලාභය ලැබුවේ 1941 මැයි මස 27 වෙනිදා. මම ළමා කාලය ගත කළේ දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රදේශයේ කෙරදේවල නමින් හඳුන්වන බොහොම සොඳුරු ගම්පියසක. දස දෙනකු සිටි අපේ පවුලේ පස්වැනි දරුවා වශයෙන් තමයි මම උප්පත්තිය ලැබුවේ. ඒ වගේම මගේ මවුපියන් වුණ දොන් ප්‍රැන්සිස් ජයසේකර ගුණවර්ධන පියාණන් හා නෝනාහාමි හෙට්ටිආරච්චි මැණියන් තුනුරුවන් කෙරෙහි බොහෝම ශ්‍රද්ධාවෙන් , ගෞරවයෙන් කටයුතු කළ ආදර්ශවත් මවුපිය දෙපළක් බවත් මේ අවස්ථාවේ දී සිහිපත් කිරීම වැදගත්.

ඒ වගේම මාපුවානේ කණිෂ්ඨ විද්‍යාලයෙන් මූලික අක්ෂර ශික්ෂාව ලබා ගැනීමෙන් අනතුරුව ගුණසේන ජයසේකර ගුණවර්ධන යන ගිහි නාමයෙන් මාපුවාන ශ්‍රී ඉන්ද්‍රසර පිරිවෙනේ ආරම්භක ගිහි ශිෂ්‍යයකු වශයෙන් අධ්‍යාපන කටයුතු සිදු කළා. 1957 ඔක්තෝබර් මස 21 වැනිදා විද්‍යෝදය විශ්වවිද්‍යාලාධිපති වැලිවිටියේ සෝරත නාහිමිපාණන් වහන්සේ එම පිරිවෙන විවෘත කළා. එම පිරිවෙනේ වැඩ සිටි වියත් පඬිවරුන් ඇසුරේ හොඳින් අධ්‍යයන කටයුතු සිදු කළා.

පෙර සංසාරයේ පුරණ ලද පාරමිතා බලයක් නිසාදෝ පැවිදිවීමේ බලවත් ආසාවක් ඇති වුණා. ඒ අනුව සංසාරගත පුණ්‍ය ශක්තිය මත 1958 මාර්තු මස 30 වැනි දිනට යෙදී තිබුණු සුබ මොහොතින් කෙරදේවල වජිරඤාණ යන උතුම් ශාසනික නාමයෙන් සම්මා සම්බුද්ධ ශාසනයේ පුණ්‍යවන්ත පැවිදි ජීවිතයට එළඹුණා. පරිවේණාධ්‍යක්ෂ විහාරාධිපති මාපුවානේ උපරතනාභිධාන මහා ස්වාමින්ද්‍රයන් වහන්සේගේ හතරවැනි ශිෂ්‍යයා වශයෙන් තමයි පැවිදිබිමට පත් වුණේ. පැවිදි දිවියට ඇවැසි වුණ මූලික බණ දහම් ගුරු හාමුදුරුවන් ඇසුරේ හොඳින් පුරුදු පුහුණු වුණ බවත් සිහිපත් කළ යුතුයි. සංඝ සෝබන ගුණයන්ගෙන් පිරිපුන්ව ශාසනානුලෝමී හැඟීමෙන් කටයුතු කළ එවැනි සංඝ නේත්‍රෑන් වහන්සේ ඇසුරෙන් ලබාගත් මූලික ශික්ෂණය පැවිදි ජීවිතයට ම ආලෝකයක් වුණ බව පුණ්‍යානුමෝදනා පූර්වකව සිහිපත් කිරීම වැදගත් කොට සලකන්න පුළුවන්. මාපුවානේ පිරිවෙනේ වැඩ සිටි සුපේශල ශික්ෂාකාමී ශාස්ත්‍රඥයන් වහන්සේ යටතේ මැනවින් ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණ කටයුතු සිදුකරමින් 1959 වර්ෂයේ දී ප්‍රථම වරට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට ඉදිරිපත් වී ප්‍රථම පන්ති සාමාර්ථයක් ලබා ගැනීමට කටයුතු කළා. ඒ වගේම එම කාල පරිච්ඡේදය වෙන විට උපසම්පදා ශීලයට පත් වීමේ අවස්ථාවට ළඟා වෙලා තිබුණේ.




භික්ෂු සමාජයේ භික්ෂුවක් ලෙස පෙනී සිටීමට අවශ්‍ය අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලබා ගත යුතුයි. භික්ෂූන් ලෙස සංඝ සමාජය පිළිගන්නේ උපසම්පදාවෙන් පසුවයි. එනිසා 1961 ජුනි මස 05 වැනිදා මල්වතු මහා විහාරයේ දී අධිශීල සංඛ්‍යාත උපසම්පත්ති ශීලයට පත් වීමට තරම් පුණ්‍යවන්ත වුණා. උපසම්පදා පුණ්‍යකර්මයේ දී මා පැවිදි කළ ආචාර්යයන් වහන්සේලාම ආචාර්ය උපාධ්‍යායන් වහන්සේ වශයෙන් කටයුතු කළ බවත් කෘතවේදීව සිහිපත් කළ යුතුයි.

ඒවගේම ප්‍රාචීණ ප්‍රාරම්භ විභාගයෙන් උසස් ලෙස සමත් වීමටත් අවස්ථාව ලැබුණා. මාපුවාන පිරිවෙනේ වැඩසිටි බහුශ්‍රැත ව්‍යක්ත ඇදුරු මඬුල්ලක් හමුවේ ඉතාමත් හොඳින් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා ගෙන 1963 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශයෙන් සමත් වුණා.

විද්‍යෝදය විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙලා සිංහල පාලි, බුද්ධ ධර්මය විෂයන් තුනෙන් ම ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගෙන මාපුවානේ ඉන්ද්‍රසර විද්‍යාලයානුබද්ධ පිරිවෙන් ආචාර්ය මණ්ඩලයට ඇතුළත් වුණා.

**දහම් පාසල, ධර්ම ශාස්ත්‍රීය සංවාද මණ්ඩප, සමාජ සුබසාධක සමිති ආදිය සංවිධානය කරමින් යහපත් සමාජයක් ගොඩනැඟීමට ගන්නා ලද ප්‍රයත්නයන් ඔබ වහන්සේගේ වචනයෙන් ප්‍රකාශ කරන්න අපේ හාමුදුරුවනේ,**

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, අභිවෘද්ධිය වෙනුවෙන් සුපේශල ශික්ෂාකාමී සඟ පරපුරක් සම්බුද්ධ ශාසනය වෙත දායාද කිරීමේ අරමුණින් පිරිවෙන් ආචාර්යවරයකු වශයෙන් බොහෝ කාලයක් ධර්ම ශාස්ත්‍රීය දැනුම ලබා දීමට කටයුතු කළා. ගමේ දායක පිරිසගේ දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ සහජ දක්ෂතා ඔප්නැංවීමට සිරි සිදුහත් ළමා සමුළුව නමින් ළමා සංවිධානයක් ආරම්භ කළා. ඒ වගේම 1967 - 1968 වර්ෂවලදී 'ප්‍රදීප' නමින් සඟරාවක් නිකුත් කිරීම ආරම්භ කළා.

1970 වර්ෂයේ දී තිස්සමහාරාම විහාරාධිපතිව වැඩ විසූ ගණේගම ශ්‍රී ඉන්ද්‍රසර නාහිමියන්ගේ ආරාධනාවකට අනුව මද්දේගම බුද්ධරක්ඛිත මා හිමියන් සමඟ ගණේගම පිහිටි වීරසිංහ වලව්වට පැමිණ ශ්‍රී ඉන්ද්‍රසර ධර්මායතනය ආරම්භ කිරීමට කටයුතු සම්පාදනය කළා. ඒ අනුව 1970 අගෝස්තු 17 දින විද්‍යෝදය පරිවේණාධිපති සිටි කළුකොඳයාවේ පඤ්ඤසේකර මහ නාහිමි වජිරඤාණ ධර්මයතනාධ්‍යක්ෂ මඩිහේ පඤ්ඤසීහ සහ මහාචාර්ය ගුණපාල මලලසේකර මැතිතුමාගේ සහභාගිත්වයෙන් ශ්‍රී ඉන්ද්‍රසාර ධර්මායතනය, ආරම්භ කිරීමටත් ඉදිරියට පවත්වා ගෙන යාමටත් කටයුතු කළා. ඒ කටයුතු සිදු කරන අතර, "සිරිසිදුහත්" ළමා සමුළුව ද නොකඩවාම පවත්වා ගෙන ආවා. ඒ ළමා සමුළුවේ සාර්ථකත්වය නිසාම තරුණ පිරිස් ප්‍රාදේශීය ශාඛා සමුළු ආරම්භ කරමින් දීප ව්‍යාප්ත සිරි සිදුහත් ළමා සමුළුව පවත්වාගෙන ගියා. 1977 වර්ෂයේ දී මාපුවාන කෙරදේවල රන්සෑගොඩ බද්දේගම උතුර ගිනිමැල්ලගහ කොත්මලේ ද ශාඛා ආරම්භ කරමින් ත්‍යාග සහතික පත්‍ර ප්‍රදානෝත්සව පැවැත්වීමට කටයුතු කළා.

මේ කටයුතුවලදී මඟ පෙන්වමින් පෙරමුණ ගත්ත මද්දේගම බුද්ධරක්ඛිත ස්වාමීන් වහන්සේ හදිස්සියේ රෝගාතුරව අපවත්වීම නිසා 1990 වර්ෂයේ සිට ධර්මායතනයත්, සිසිලස ළමා සමාජයක් අඛණ්ඩව පවත්වාගෙන යාමේ සම්පූර්ණ වගකීම ඉදිරියට කරගෙන යාමට සිදු වුණා.

**පැවිදි ජීවිතයේ දීර්ඝ කාලීන අත්දැකීම් සම්භාරයකින් හෙබි සෝබමාන උදර පැවිදි ජීවිතයක් ගත කරන ඔබ වහන්සේ නූතන සමාජයේ පැන නැඟී ශාසනික ගැටලු පිළිබඳ දරන මතය මොන වගේද?**

මෙයින් දශක හතරකට ඉහතදී තමයි අපි ඔය ප්‍රශ්නයට පිළිතුරු සපයන්න උත්සාහ කළේ. ඒ කියන්නේ 1977 වර්ෂයේදී භික්ෂූන් වහන්සේලා දේශපාලනයට පිවිසීමට උත්සාහ ගත් අවස්ථාවේ මා විසින් "මහ සඟරුවන, මහජනතාව සහ මහ මැතිවරණය" නමින් පොත් පිංචක් එළි දැක්වූවා. එම පොතේ අන්තර්ගත කරුණු කිහිපයක් උපුටා දක්වන්න කැමැතියි.

"බහුජන හිත සුව පිණිස සම්බුද්ධ ශාසනය තවදුරටත් රැක ගැනීම වර්තමාන ශ්‍රද්ධා බුද්ධි සම්පන්න මහා සංඝයා වහන්සේගේ පරම යුතුකමයි. එදා ලක් පොළවින් අතුරුදහන් වන්නට ගිය සම්බුද්ධ ශාසනය රැකගෙන ධර්ම ශාස්ත්‍රීය පුනරුප්පත්තිය ඇති කිරීම සඳහා වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන්ට ජීවිත පරිත්‍යාගයෙන් ඉදිරිපත්ව මහ සටනක් කරන්නට සිදු වූයේ අන්‍ය දෘෂ්ටිකයන් සමඟ පමණක් නොවේ. ශාසනයේ නාමයෙන් උදාර පෝෂණයේ යෙදුනු ශාසනික දේපළවලින් අඹුදරුවන් රැකි පුද්ගලයන්ගෙන් එල්ල වූ අතවර අපමණ ය. එලෙසින් රැකගත් ශාසනයේ රැකවරණය අදත් අපි ලබමු. එහෙත් එදාටත් වැඩි අන්ත පරිහානියට ශාසනය පත්වන ලකුණු අද පහළ වී ඇත. එවැනි තත්වයක් උදාවන්නට පළමු, ශාසනය රැකගැනීමට ක්‍රියා කළ නොහැකි නම්, භික්ෂූන් වහන්සේලා වශයෙන් අප සතු බලවත්ම වගකීමක් පැහැර හැරීමක් නොවේද?

විවේචනය පිරිසුදුකම සඳහා අවශ්‍යය. එහෙත් වැරැදි විවේචනය පුද්ගලයා මහත් විපතකට පත්කිරීමට හේතුවෙයි. භික්ෂුව භික්ෂූන් වහන්සේගේම විවේචනයට ලක් විය යුතු අතර, ශාසනය නොහඳුනන ගිහි බෞද්ධයන්ගේ වැරැදි විවේචනවලට ඉඩ නොතැබිය යුතුය. භික්ෂූන් වහන්සේගේ පාරිශුද්ධත්වය, පිළිබඳ තමන්ම සහතික විය යුතු ය. අන්‍ය භික්ෂුවකට හෝ ගිහියකුට නිගමනයකට බැසගත නොහැකි වෙයි. මේ නිසා සංඝ සාමග්‍රියෙන්ම සංඝ ගෞරවය ආරක්ෂා කර වැරැදි විවේචන වළක්වාගත යුතු ය.

**හේමමාලා රන්දුනු**

**පළිගැනීම වෙනුවට සමාවදීම තෝරා ගන්න**



# මෙලොව පිරිහුණොත් පරලොවත් පිරිහෙනවා

## අඳුරෙන් ආලෝකයට එන්න

**අපගේ ශාන්තිනායක අමාමෑණී බුදුරජාණන් වහන්සේ සාර අසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පාරමී දම් පුරා සොයාගත්තා වූ සැබෑ දහම සසර කතරේ අතරමංව දුක් විඳින හුදී ජනයා වෙත පතළ මහා කරුණාවෙන් දේශනා කළහ.**

උන්වහන්සේගේ දහමට අභියෝග කළ හැකි කිසිවෙක් අදටත් නොමැත. උන්වහන්සේගේ දහමට අභියෝග කිරීමට විද්‍යාව ද සමත් වී නොමැත. තුන් කල් දක්නා නුවණින් උන්වහන්සේ දෙසූ දහම සැබෑවට ම තුන් කාලයට ම වලංගු වන ආකාරය හරිම අපූරුයි.

වරෙක බුදුන් වහන්සේ වදාළා අඳුරෙන් අඳුරට, අඳුරෙන් ආලෝකයට, ආලෝකයෙන් අඳුරට, ආලෝකයෙන් ආලෝකයට යන මිනිසුන් වර්ග හතරක් මේ ලෝකයේ ජීවත් වන බව.

අඳුර යනු අපාය පමණක් ම නොවේ. මනුෂ්‍ය ආත්මයක් ලැබුව ද අන්ධකාරයේ සිටින මිනිසුන් ඕනෑ තරම් ඇත. ලෞකික වශයෙන් මෙන්ම ලෝකෝත්තර වශයෙන් ද අන්ධකාරයේ ගමන් කරන පිරිස බොහෝම යි.

ලෞකික සැපය සොයන ඇතැම් මිනිසුන් තමන්ගේ කටයුතු කර ගන්නේ දීර්ඝ කාලීන නොවන කෙටි කාලීන ක්‍රමවලිනි. වංචනික ලෙස සිදු කරන ක්‍රියාවන්වල ප්‍රතිඵලය ලෙස තමන්ගේ දියුණුව අතරමඟ නැසේ.

අද සමාජයේ දරුවන් විසින් මවුපියන්ට සලකන ආකාරය ද අප විමසා බැලිය යුතු ය. තම මහලු මවුපියන් මහ මඟ දමා යන්නේ අකාරුණික සිතිනි. තමාගේ නිවසේ සිටිය ද බලු කූඩුවක, හෝ ගේ පසුපසට වෙන්න සකසන ලද ලෑලි කාමාරයක දමා සතුන්ට මෙන් සලකයි. දරුවන්ට ආදරය, කරුණාව, සෙනෙහස, සාරධර්ම, සිරිත් විරිත්, වැඩිහිටියන්ට සැලකීම, වැඩිහිටියන්ට ගරු කිරීම, පිදිය යුත්තන් පිදීම ආදි කරුණු වෙනුවට අනෙකා පරයමින් තරගකාරීව ඉදිරියට යන ආකාරය කියාදීමේ ප්‍රතිඵල එසේ වීමට හේතුවයි. අද දහම් දෙසුමේ මාතෘකාව තමෝ ජෝති පරායනෝ වේ.

“තමෝ” නම් අන්ධකාරයයි “ජෝති” නම් ආලෝකයයි. මිනිසත්භාවය ලැබීම ද ආලෝකයකි. එහෙත් ඒ බව දැන හෝ නොදැන මිනිසුන් තමන් ලැබූ ජීවිතයේ වටිනාකම අඩු තක්සේරු කරයි. මේ උතුම් ආත්මය තුළින් අන්ධකාරය කරා ගමන් කරයි.

අප කළ යුතු වන්නේ ලැබුණා වූ මනුෂ්‍ය ආත්මයේ වටිනාකම තේරුම් ගෙන මෙලොව හා පරලොව තුළදී ආලෝකය කරා ගමන් කිරීමයි. මෙලොව දී ලෞකික වශයෙන් දියුණු වීමට නම් සාධාරණ වෙළෙඳාම මෙන්ම සාරධර්ම, සදාචාර, සිරිත් විරිත්, ගුණ ධර්ම රකිමින් වැඩිහිටියන්ට ගරු කරමින් කටයුතු කළ යුතු ය. මවුපියන් දරුවන් අතර යහපත් සබඳතාව, ගුරුවරයා ශිෂ්‍යයා අතර යහපත් සබඳතාව ස්වාමියා බිරිඳ අතර යහපත් සබඳතාව, ස්වාමියා සේවකයා අතර යහපත් සබඳතාව තිබිය යුතු ය.

අනික් පසින් වංචනිකභාවය අයත් වන්නේ අදින්නාදානා නම් ශික්ෂා පදයටයි. මෙලොව දී මිනිසුන් වශයෙන් ලැබුවා වූ පිරිහීම පරලොව දී ද එලෙසින් ම ඔහුත් ලබයි. කර්ම විපාක දීම නිසා ඊළඟ භවයත් දුගීව උපදින්නට සිදුවී ආර්ථික වශයෙන් විශාල ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වේ. ඒ අන්ධකාරයේ එක පැත්තකි. බුදුන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේ යුතුකම් කොටසේ දී මවුපියන් විසින් දරුවන්ට හා දරුවන් විසින් මවුපියන්ට කළ යුතු යුතුකම් පැහැදිලිව දේශනා කොට ඇත.

මවුපිය දරු සබඳතාව ගිලිහී යන අද සමාජයේ මහ මඟ සිටින දරුවන්ට උරුම වන්නේ දුක්බර ජීවිතයකි. සුරාවට, සොරකමට පවා පුරුදු වී සමාජයම මහා විනාශයක් කරන දරුවන් බවට ඔවුන් පත්වේ. නීතියේ රැහැනට හසුවී සිරගෙවල්වල දඬුවම් විඳීමට සිදු වේ. එය මෙලොව වශයෙන්ම අන්ධකාරයට යාමක් නොවේද? මෙවැනි වූ ක්‍රියාවන් නිසා පරලොව ජීවිතය ද අපාගාමී වන්නේ ය.

රට, ජාතිය වෙනුවෙන්, අනුන් වෙනුවෙන් යුතුකම් සිදු කරන්නේ නම් තමාගේ මෙලොව ජීවිතය සහ පරලොව ජීවිතය ආලෝකවත් කරගත හැකි ය. ඒ වාගේම දාන, සීල, භාවනා ආදි පුණ්‍ය ක්‍රියා සිදු කර පරලොව භවගාමී ජීවිතය ද නිවන නම් සුන්දර ආලෝකය කරා ගමන් කළ හැකි ය. කළ යුතු වන්නේ මිනිසත් භවයේ ඉපිද මනසෙන් උසස් වූ මනුෂ්‍යකු ලෙස ජීවත් වීම ය.

අද බොහෝ දෙනා මිනිසත් ආත්මයේ ඉපදුණ ද එය අමතක කර අමනුෂ්‍යයන් ලෙස කටයුතු කරයි. මනුසත් ආත්මයේ වටිනාකම තේරුම් ගෙන මනසෙන් උසස් වූ මිනිසුන් ලෙස ගෙවා මෙලොව පරලොව ආලෝකවත් කරගෙන ජාතියක්, ජරාවක්, මරණයක් නැත්තා වූ උතුම් වූ නිවන කරා ගමන් කිරීමට අපි උත්සුක වෙමු.



වැල්ලවත්ත ශ්‍රී සුගත විහාරයේ
විහාරාධිපති
ශ්‍රී ජිනානන්ද ළමා සංවර්ධන
මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ
**අම්බලන්තොට සීලානන්ද හිමි**

## ගංගාරාම විහාරයේ සති පිරිත් පින්කම මෙවරත්

කොළඹ 02, ශ්‍රී ජිනරතන පාර ගංගාරාම විහාරස්ථානයේ දී රටවැසියනට යහපත් වූ හෙට දවසක් උදාවේවායි ප්‍රාර්ථනා කරමින් පුරා වසර 90ක් අඛණ්ඩව පවත්වා ගෙන එනු ලබන සති පිරිත් දේශනය මෙවර ද 91 වැනි වරට මේ මස 01 වැනි දා ආරම්භ කොට 09 වැනි දා දින දවල් දේවාල දානයෙන් අවසන් කිරීමට කටයුතු යොදා ඇත.

උදේ 6.00 ට, සවස 3.00ට සහ රාත්‍රී 8.00 ට සහ රාත්‍රී 8.00 මහ පිරිත් දේශනය පැවැත්වේ. අප්‍රේල් 07 දින රාත්‍රී සූත්‍ර දේශනාව, 08 දින රාත්‍රී දොරකඩ අස්න, අනුශාසනාව සහ ආටානාටිය සූත්‍ර දේශනා පැවැත්වේ. ආශිර්වාද පතා තැබීම පිණිස තෙල්, බෙහෙත්, යන්ත්‍ර, මුහුදු වැලි ආදී ආරක්ෂක දේ විහාරස්ථානයට ගෙනැවිත් බාරදිය හැකි බව ගංගාරාමාධිකාරී කිරින්දේ අස්සජී නාහිමියෝ දන්වා සිටිති.

## ගොතටුව ශ්‍රී මහා බෝධිමළු විහාරය

ගොතටුව පාරමිතා ශ්‍රී මහා බෝධිමළු විහාරයේ වාර්ෂිකව පවත්වාගෙන එනු ලබන හිස තෙල් ගෑමේ උත්සවය මෙවරත් අරම ශ්‍රී ධම්මතිලක නා හිමිගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙහි විශේෂත්වයක් වන්නේ වසර ගණනාවක් පුරා දෛනිකව පිරිත් කරන ලද තල තෙල්, මී තෙල්, අබ තෙල්, කොහොඹ තෙල් හා එඬරු තෙල් යොදා සකස් කර ගන්නා ලද තෙල් සහ කලාඳුරු අල, කුංකුමප්පු , සුදුහඳුන්, විෂ්ණු ක්‍රාන්තිය, ගොරෝචන, සස්සඳ මුල්, ඉරිවේරිය,බෙලි මුල්, වෙනිවැල් ගැට, ඊතන, නෙළුම්දඬු , ගොඩමානෙල් අල, නස්නාරං මුල්, සැවැන්දරා මුල්, ඖෂධ වර්ග 14 ක් යොදා සකසන ලද කෂාය හා නානු හිසතෙල් ගෑම සඳහා යොදා ගැනීම යි. මහා සංඝරත්නයේ පිරිත් දේශනා මධ්‍යයේ අප්‍රේල් 16 දින හිසතෙල් ගෑම සිදු කිරීමට නියමිත ය.

## පිහිට පතයි

ගාලදිවුල්වැව, ඔත්තප්පුව, අංක 412/2/4 හි පදිංචි සෙනුල්ක සතිවි දුල්සඳ දරුවා දරුණු අක්මා රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට ඕ පොසිටිව් වර්ගයේ අක්මාවකින් කොටසක් ඉතා ඉක්මණින් බද්ධ කළ යුතු බව කියයි. වැඩි විස්තර 0729974950 හෝ 0768920964 දුරකතනයෙන් විමසිය හැකි බව ද දන්වා සිටියි.

.......................................

මාතර, ඌරුගමුව, මුරුතවලවත්ත, රන්නාවල පදිංචි ජී.ජී.නන්දසිරිගේ වකුගඩු දෙකම අක්‍රිය වී ඇති බව කියයි. ඔහුගේ ජීවිතය සුරක්ෂිත කර ගැනීමට $O^+$ වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය බව කියයි. පරිත්‍යාගශීලියකු වෙතොත් දුරකතන අංක 071 -3968940 කතා කරන ලෙසද මහජන බැංකුව වලස්ගල ශාඛාවේ ජී.ජී.නන්දසිරි නමින් ආරම්භ කොට ඇති අංක 304200120001795 වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්මය සඳහා වන බරපැන දැරීමේ ගිණුමට මුදල් බැර කළ හැකි බව ද කියයි.

.......................................

කැස්බෑව, සර්වෝදය මාවත, අංක 29හි පදිංචි යූ.බී. විජේකෝන් යන අය දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට ඕ පොසිටිව් වර්ගයේ වකුගඩුවක් පරිත්‍යාග කළ හැකි අයකු වේ නම් 0714491383, හෝ 0112602708 දුරකතනයෙන් විමසිය හැකි බව ද කියයි.

.......................................

වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගියකු සඳහා (බී පොසිටිව්) වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය වී ඇති බව කියයි. පරිත්‍යාගශීලියෙකු වේ නම් 0762522538 / 0773721502 දුරකතන අංකයට දන්වන ලෙස ඉල්ලීමක් කරයි.

**වචන හරඹයෙන් පමණක් දිනන්නේ ජීවිතයේ පරාජිත මිනිසුන් ය**

# ආකල්ප දුර්වල වුණොත් උගතෙක් වුවද වරදට පෙළඹෙනවා



නුගේගොඩ පඤ්ඤෙද්දය මහ පිරිවෙනෙහි ආචාර්ය,
කිරිමැටිමුල්ල ශ්‍රී වර්ධනාරාම විහාරවාසී ශාස්ත්‍රවේදී
**විල්පිට ගුණසිරි හිමි**

**ගෞතම බුදුරජාණන් වහන්සේ නමක් මේ ලෝකයට පහළ වන්නේ ලෝක සත්ත්වයාට යම් යථාර්ථයක් තේරුම් කර දීමටයි. එසේත් නොමැති නම් පහදා දීමටයි.**

ඒකාග්‍රතාවයෙන් යුතු සිත පිරිසුදු දිය පොකුණක් සේ පැහැදිලි භාවයට පත් කිරීමටයි. ඒ හරහා චර්යාවන් හික්මවීම තුළ මිනිසුන්ගේ කායික මානසික පැවැත්ම යහපත් කරලීමටයි.

මෙහිදී සිත පාරිශුද්ධත්වයට පත්කරලීමට ප්‍රථම ව පුද්ගලයාගේ කය පිරිසුදු කරග ගත යුතුයි. එම පිරිසුදු බව බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබෙන්නේ කුඩා දරුවකුට වුවත් පහසුවෙන් තේරුම්ගෙන යහපත් කායික ක්‍රියා පටිපාටිය පිළිපැදිය හැකි අයුරිනි. බෞද්ධ දර්ශනය යනු එවැනි ප්‍රායෝගික දහමකි.

කුඩා දරුවකු, කුඩා අවදියේ දී අපිරිසුදු බව හේතුවෙන් ඔවුන්ට අත් වන අවාසි සහගත තත්වයන් හා තම පෙනුම, පිරිසුදු බව මඟින් ඇතිවන විවිධ වාසිදායක ස්වභාවයන් පිළිබඳ නොදැන සිටීම ඔවුන්ගේ අපිරිසිදු භාවයට මූලික හේතුව බවට පත්වෙයි. වැඩිහිටියකු මේ තත්ත්වය මඟ හරවාලීම සඳහා වගකිව යුතු හෝ භාරකරුවකු තම දරුවන් කෙරෙහි දැක්විය යුතු කරුණු පිළිවෙත් පහත ආකාර වේ.

ඔවුන් කෙරෙහි දැඩි අවධානය ලබා දීම,
ඇහුම්කන් දීම,
නිසි මඟ පෙන්වීම හා
ආදරය සහ ආරක්ෂාව ලබා දීමයි.

දරුවන් සෑම විටම අනුගමනය කරන්නේ මව්පියන් බව නොරහසකි. එහිදී දරුවන් මව්පියන්ගේ හැසිරීම් රටාව අධ්‍යයනය කරයි. දරුවන්ගේ අහිතකර චර්යාවන්ට මව්පියන්ගේ චර්යාවන්වල දැඩි බලපෑමක් එල්ල වන බව කිව යුතු ය. දරුවන් ඉදිරියේ මව්පියන් සෑම විටම අදර්ශවත් සහ නිවුණු ස්වභාවයකින්, විනයක් සහිත, වැදගත් දෙපළක් ලෙස හැසිරීමට වග බලා ගත යුතු ය.


බුදුරජාණන් වහන්සේ විනය පිළිබඳ දක්වා තිබෙන්නේ සසුනේ මූලික පදනම ලෙසත්, බාහිර සමාජයේ මිනිසුන්ගේ යහපත් චර්යාවන්ට හේතු පාදක වන බවත් ය. මංගල සූත්‍ර දේශනාවේ සඳහන් කර තිබෙන්නේ “විනයො ච සුසික්ඛිතො...“ යනුවෙන් විනයානුකූල හික්මීම දියුණුවට හේතුවන බවයි.

මෙහිදී අපි කතා කළ යුතු ප්‍රධාන මාතෘකාවක් බවට පත් වන්නේ අනුන්ට ගරු කිරීමේ ගුණය, කීකරුකම හික්මීම වර්තමානය වන විට බොහෝ දරුවන් සතුව දක්නට නොලැබීම පිළිබඳවයි.

අතීතයේ කුඩා දරුවාගේ ගුණ යහපත්කම පෝෂණය කළේ කිරි අම්මා සහ කිරි අත්තා ය. සවස් යාමයේ කුඩා දරුවන් ළං කරගෙන කියාදුන් බණ කතා, යහපත් චරිත කතා, දරුවන් තුළ ගුණ දහම් වර්ධනය කරවීමට සමත් විය.

මවුපිය වැඩිහිටියන්ට සලකන ආකාරයත්, ගුරුවරුන්ට සලකන ආකාරයත්, ඥතීන්ට අසල්වැසියන්ට සලකන ආකාරයත් සිතට දැනෙන සේ නිදසුන් සහිතව පෙන්වා දුන්හ.

**බුදුරජාණන් වහන්සේ විනය පිළිබඳ දක්වා තිබෙන්නේ සසුනේ මූලික පදනම ලෙසත්, බාහිර සමාජයේ මිනිසුන්ගේ යහපත් චර්යාවන්ට හේතු පාදක වන බවත් ය. මංගල සූත්‍ර දේශනාවේ සඳහන් කර තිබෙන්නේ "විනයො ච සුසික්ඛිතො..." යනුවෙන් විනයානුකූල හික්මීම දියුණුවට හේතුවන බවයි.**



හොඳ නරක කියා දුන්හ. කුඩා දරුවෝ ඒවා ඉතා කැමැත්තෙන් අහගෙන සිටියහ. පුංචි මනසේ මේ කතාර්ථයන් නිදන් විය. ඒත් ඉස්සර හිටපු ආච්චි සීයා චරිත වර්තමානය වන විට දකින්න ලැබෙන්නේ නැත. වර්තමානය වන විට වයසින් අඩු දරුවන් වැරැද්දිවලට යොමුවීමේ වර්ධනයක් පෙනේ. තමන්ගේ නිවස තුළින්ම ඔවුන් එවැනි තත්ත්වයකට පත්කර ඇති බව පැහැදිලි ය. අයහපත් විදිහට හැසිරෙන බොහෝ දරුවන් තම නිවස තුළ යම් මානසික පීඩාකාරී බවකින් පසුවන බව පැහැදිලි ය. එවැනි තත්ත්වයන් හඳුනාගත් සැණින් කළ යුත්තේ ගැටලුව තේරුම් ගැනීම ය. ඒ දරුවන් පිළිබඳ අවධානයෙන් යුතුව යහපත් ක්‍රියාවන්ට හුරු පුරුදු කොට නිවැරැදි පුද්ගලයකු ලෙස සමාජ ගත කිරීමට කටයුතු කිරීම ය.

සමාජයේ බොහෝ දරුවන් වැරැදි මාර්ගයට පිවිසීම් පිළිබඳ ව විමසා බැලීමේ දී කුඩා කල පටන් ම ඔවුන්ට යම් යම් වැරැදි මාර්ගෝපදේශ ලබී ඇතිබව පැහැදිලි වේ. එමෙන්ම කුඩා කල පීඩාකාරී හැඟීමකින් යුතුව කටයුතු කර ඇති බව ද පැහැදිලි වේ. කුඩා කාලයේ දී යම් සෙනෙහසක්, ආදරයක් නොලැබීම හේතුකොට ගෙන මුළු ජීවිතය ම වියවුල් තත්ත්වයකට පත්ව ඒ හරහා ඔවුන්ගේ පීඩාකාරී ස්වභාවය මුළු සමාජය කෙරෙහි ම ඇති කරගෙන ඒ හරහා විවිධ විනාශ කරන අයුරු දැක ගත හැකි ය.

අපි කළ යුතු එවැනි පිරිස් නිසි ක්‍රමවේදයකට භාජනය කොට ඔවුන්ගේ ඉදිරි ගමනට යම් පාරිශුද්ධ භාවයක් ඇති කරලීමයි.

දහම තුළ පෙන්වා දී තිබෙන්නේ කෙනකු මෙවැනි කායික මානසික අපිරිසුදු භාවයට පත්වීමට බලපාන හේතු කාරණා ලෙස

වැරදි ප්‍රදේශයන්හි ජීවත් වීම, දැනීම තිබුණත් ආකල්පමය වශයෙන් දුර්වල වීම, සාංසාරික වශයෙන් ගෙන එනු ලබන යම් නරක පුරුදු, කුඩා කල සිට පෙනෙන දැනෙන වැරැදි ක්‍රියාවලිය හා කුඩා කල සිට නොලැබෙන ආදරය සෙනෙහස යි.

මෙ කාරණා හේතුකොට ගෙන අවාසනාවන්ත තත්ත්වයන්ට පත්වීම දැකිය හැකි ය. එමඟින් දරුවාගේ මුළු අනාගතය ම කඩා වැටෙන බව නො නොරහසකි .

සතුටින් ජීවිතය ගතකිරීම සඳහා බාධා වී තිබෙන අපේ ම හැසිරීම් අනාගත පරපුරෙන් දුරස් කිරීම සඳහා සුදුසු ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම වැදගත්ය.

ප්‍රථමයෙන් ගුරුවරුන්ගේ වටිනාකම සහ ආකල්ප සංවර්ධනය හරහා හැසිරීම යම් මඟකට ගෙන ඒම යහපත් දරුවකු සමාජගත කිරීමට රුකුලක් වනු ඇත.

පිරිසුදුබව සහ පිරිසුදු වටපිටාව දරුවන්ගේ වඩා හොඳ ඉගෙනීම සහ සංවර්ධනය වැඩි දියුණු කරන බව බොහෝ දෙනා පිළිගෙන ඇත.

අධ්‍යාපනය ලබන අවධියේ දී ඔවුන්ගේ වට වටපිටාවත්, පරිසරයක් අපිරිසුදු වීම විවිධාකාර ගැටලු රාශියක් මතු කරීමට සමත් වෙයි. එය දරුවන්ගේ මානසික සංවර්ධනයට සහ අධ්‍යාපන කටයුතුවලට වැදගත් වන්නේ කෙසේ දැයි සොයා බැලීම නූතන අවශ්‍යතාවයකි. ළමයින්ට අධ්‍යාපනය ලබාදෙන ගුරුවරයාට මෙන්ම අධ්‍යාපනය ලබන දරුවා ට ද අපිරිසුදු වටපිටාවක අධ්‍යාපන කටයුතු නිසියාකාරව සිදු කර ගැනීමට බාධා මතු කරයි. පුංචි කාලයේ පටන්ම දරුවන්ට අප දිය යුතු යහපත් චර්යාමය ප්‍රතිපදාව දරුවාගේ නිවසෙන් ම එනම්, මව්පියන්ගෙන් ම ආරම්භ විය යුතු කරුණකි. යම් දරුවෙක් පිරිසුදු බව ප්‍රතික්ෂේප කරමින් අපිරිසුදුව, ඉගෙනීමට මැලිකමක් දක්වන්නේ නම් එය ඔහුගේ මවුපියන්ගේ යම් ගැටලුවක ප්‍රතිඵලයක් බව අප තේරුම් ගත යුතු වේ.

මීට අමතරව අධ්‍යාපනයය ලැබීම සඳහා යම් වයස් සීමාවක් ගත කරන දරුවන්ට ඔවුන්ගේ අපිරිසුදු බව හරහා සිදුවන තවත් අහිතකර කටයුත්තක් ලෙස නිරෝගීකම පිරිහීම පෙන්වා දිය හැක. සෞඛ්‍ය පිරිහීම හරහා එම දරුවා විවිධ රෝගාබාධයන්ට ලක් වෙයි. ඒ හරහා ඔහුගේ ඉදිරි ඉගෙනීම් කටයුතු අඩාල වන බව පැහැදිලි වේ.

එහෙයින් අනාගත පරපුර යහපත්ව සමාජගත කිරීමට වගකිවයුත්තන් ලෙස මව්පියන් වගබලා ගත යුතු බව පසක් කරමි.

**බොරුව අදහාගෙන සිටින මිනිසුන් ඉදිරියේ ඔබ නිහඬ වන්න**

# සංඝ සෝභිත ගුණ පූජිත
# ඇල්ලේ ඉන්දසෝභන නා හිමි



හබරාදුව තලාතුඩුව ආරණ්‍ය සේනාසනාධිපති, කොග්ගල ගුණදස්සනාරාමාධිපති තලාතුඩුව තෝමස් අමරසූරිය පරිවේනාධ්‍යක්ෂ ඇල්ලේ ඉන්දසෝභන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත මහා විහාරවංශික ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ගාලු සංඝ සභාවේ අනුවිජ්ජ (අධිකරණ නායක) පදවිය සමග ශ්‍රී වනරතන ඉන්දෝභාස වංසාලංකාර ශාසන සේවා කීර්ති සංඝ සෝභන ගෞරව නාම දේහෝපලක්ෂිතව ගාලු දිසාවේ අධිකරණ නායක පදවිය පිරිනමා ඇත.

ඇල්ලේ ඉන්දසෝභන නාහිමි 1968 අප්‍රේල් 08 වන දින උපත ලබා ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලබා පුරාකෘත පුණ්‍ය මහිමයෙන් තලාතුඩුව ආරණ්‍ය සේනාසනාධිපති දොරපේ ඉන්දෝභාෂ නායක සාමීන්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍ය රත්නයක් ලෙස ඇල්ලේ ඉන්දසෝභන සාමණේර නමින් පැවිදි විය.

තෝමස් අමරසූරිය පරිවේනස්ථානයෙන් මූලික ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කර වැඩි දුර අධ්‍යාපනය සඳහා මරදාන ශ්‍රී ලංකා විද්‍යාලයට ඇතුළත් ව මැනවින් ශබ්ද ශාස්ත්‍රාදිය ප්‍රගුණ කර බණදහම් උගෙන විසි වයස් සම්පූර්ණ ව හද යෞවන වියේ දී භික්ෂුවකට ලද හැකි භාග්‍ය සම්පන්න වූ අධිශීල සංඛ්‍යාත උපසම්පදා ශීලයෙහි පිහිටියේ දියවන්නාවේ උදකුක්ඛේප සීමා මාලකයේ දී 1995 ජූලි 02 වන දින දී ය.

ස්වකීය ගුරු දේවයන් වහන්සේගේ අපවත් වීමෙන් පසු තලාතුඩුව ආරණ්‍ය සේනාසනයේ ආධිපත්‍යයට පත් ව එහි දියුණුවටත් අභිවෘද්ධියටත් ජීවිත පරිත්‍යාගයෙන් ඇප කැප වී නීතිමය වශයෙන් ඇති සියලු අභියෝගයන් ජයග්‍රහණය කර අති විශේෂ ගැසට් පත්‍රයක් මඟින් මෙම සුන්දර වන අරණ පූජා භූමියක් බවට පත්කර ලන්නට ඉන්දසෝභන නායක සාමීන්ද්‍රයන් වහන්සේ දිවා රාත්‍රී නොබලා කාලය ධනය ජීවිතය ගැන පවා නොසලකා මිල මුදලට යටත් නොවී සෘජුව අවංකව එඩිතර ව තම වගකීම අනාගත ශාසනාභිවෘද්ධිය පිණිස සිදුකරන ලදී.

දෙස් විදෙස් ජනතාවගේ ගෞරවාදරයට පත්වන ලෙස මෙම ආරණ්‍ය සේනාසනය පත් කිරීමේ දී ඉන්දසෝභන නාහිමියන් කළ මෙහෙය ප්‍රමාණ කළ නොහැකි ය. උන්වහන්සේ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ගාලු සංඝ සභාවේ ලේඛකාධිකාරී ධුරය දශකයකට වැඩි කලක් සිදුකරමින් සංඝ සභාවේ ද අභිවෘද්ධියට ක්‍රියා කළහ. තෝමස් අමරසූරිය පිරිවෙනේ ද කෘත්‍යාධිකාරී ධුරය දරමින් පරිවේනස්ථානය තුළින් අතිවිශාල මෙහෙයක් ද ඉටු කරති.

ඉන්දියාව, මැලේසියාව, සිංගප්පූරුව, තායිලන්තය, එංගලන්තය වැනි රටවල ද සංචාරය කරමින් ධර්ම දූත මෙහෙවරෙහි ද ඇල්ලේ ඉන්දසෝභන නාහිමියන් ක්‍රියා කළහ.

උන්වහන්සේගේ මේ ලෝක ශාසනික සේවය අගය කළ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ශ්‍රීමත් මහා නායක ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ කාරක මහා සංඝ සභාව විසින්, ශ්‍රී වනරතන ඉන්දෝභාෂ වංසාලංකාර ශාසන සේවා කීර්ති සංඝ ශෝභන යන ගෞරව නාම සහිතව මහා විහාර වංශික ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ගාලු සංඝ සභාවේ අනුවිජ්ජ (අධිකරණ) නායක පදවියට පත් කරන ලදී.


ඒ පිළිබඳ ශ්‍රී සන්නස් පත්‍ර ප්‍රදානෝත්සවය නිමිති කර ගනිමින් අභිනව නා හිමියන් පිළිගැනීමේ පෙළහර 2023.04.08 දින සවස 2.00 හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ආරම්භ කරනු ලබයි.

09 වැනි දින ශතාදික මහා සංඝරත්නය විෂයයෙහි දන් පූජා කර අභිනව නාහිමියන්ට සෙත් ප්‍රාර්ථනය කරනු ලබන අතර, පස්වරුවේ තුන් නිකායික මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

සංඝ සෝභිත ගුණ පූජිත ඇල්ලේ ඉන්දසෝභන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට තුණුරුවන් සරණින් සියලු දෙවි රැකවරණින් ශත වර්ෂාදී කාලයක් සසුන් කෙත වැඩ වඩන්නට ශක්තිය ධෛර්යය ලැබේවා'යි ප්‍රාර්ථනය කරමි.

**පලල්ලේ සරණජෝති හිමි**

## සුපේශල ශික්ෂාකාමී බහුශ්‍රැත
# වැලමිටියාවේ ඤාණරතන නාහිමි



1875 නොවැම්බර් මස පළමු වන දින බෝධිසත්ව ගුණෝපේත අතිගරු රත්මලානේ ධර්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ආරම්භ කළ පෑලියගොඩ විද්‍යාලංකාර මහ පිරුවන දෙස් විදෙස් වියතුන්ගේ ඉමහත් සම්භාවනාවට පාත්‍ර වුණ පෙරදිග අධ්‍යාපනයේ මහා තක්ෂිලාවක් බව අමුතුවෙන් සඳහන් කළ යුතු නොවේ.

අර්ධ ශතවර්ෂ තුනකට ආසන්න කාලයක් ජාතික ආගමික ශාසනික සාමාජික හා ශබ්ද ශාස්ත්‍ර වශයෙන් මෙම ශාස්ත්‍ර නිකේතනය මගින් සිදු වී ඇති මෙහෙවර අතිශයින් ම ප්‍රශංසා කටයුතු ය. එදා මෙදාතුර විද්‍යාලංකාර පිරුවනෙහි ඉතිහාසය විමසා බැලීමේ දී එහි නායකත්වයට පත් වූවෝ ගිහි පැවිදි දෙපාර්ශ්වයේ ම ගෞරවාදරයට පාත්‍ර වූ සුපේශල ශික්ෂාකාමී බහුශ්‍රැත ධර්මධර විනයධර පැවිදි උතුමෝ ය.

එකී සුවිමත්හු සාංසාරික පුණ්‍ය බල මහිමය ම හේතු කොට ගෙන විද්‍යාලංකාර ගමන් මගට නායකත්වය ලබාදීමට සංසාරයෙහි එයට අවශ්‍ය පාරමිතා සම්පූර්ණ කළ යුතු බව අපගේ විශ්වාසයයි. මෙවැනි පෙරවදනක් මෙහිලා පළමුවෙන් ම සඳහන් කළේ සුවිශේෂ කරුණක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට ය.

පෑලියගොඩ විද්‍යාලංකාර පරිවේනාධිපති හා අධ්‍යක්ෂ වැලමිටියාවේ ඤාණරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත ස්‍යාමෝපාලිවංශික මහා නිකායේ මල්වතු පාර්ශ්වය මගින් කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන සංඝනායක පදවිය පිරිනමා ඇත.

අපේ වැලමිටියාවේ ඤාණරතන නාහිමියෝ ඓතිහාසික සත්කෝරලයේ වැලමිටියාව නම් ග්‍රාමයේ අති සම්භාවනීය ප්‍රවේණියක 1974 - 06 - 29 වන දින ජන්ම ලාභය ලැබූහ. අනතුරුව 1987 - 03 - 01 වැනි දින පෑලියගොඩ විද්‍යාලංකාර පරිවේනාධිපති මහෝපාධ්‍යාය අග්ගමහා සද්ධම්ම ජෝතිකධජ සාහිත්‍ය චක්‍රවර්තී ආචාර්ය වැලමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ ආචාර්යත්වයෙන් පැවිදි බිමට පත්ව 1996 - 06 - 22 වැනි දින මහනුවර මල්වතු මහා විහාර මංගල උපෝෂථාගාරයේ දී අධිසීල සංඛ්‍යාත උපසම්පදාව ලබා ගත්හ.

පෑලියගොඩ විද්‍යාලංකාර මහ පිරිවෙනේ වර්ග පටිපාටියෙන් අධ්‍යාපනය ලබමින් විද්‍යාලංකාර අවසාන පරීක්ෂණයෙන් සමත්ව 2007 වර්ෂයේ සිට එහි කීර්තිමත් ආචාර්යවරයෙක් ලෙස කටයුතු කරමින් සිටිති. 2021 සිට උප පරිවේනාධිපති පදවිය උසුලමින් සිදු කරන ආගමික ජාතික ශාසනික සාමාජික මෙහෙවර ද මෙහිලා සිහිපත් කළ යුතු ය. වැලමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අපවත්වීමෙන් පසුව ඤාණරතන නාහිමියන් වෙත පරිවේනාධිපති හා අධ්‍යක්ෂ තනතුර විද්‍යාලංකාර සභාව මගින් පිරිනමා ඇත.

අතීත විද්‍යාලංකාර පරිවේනාධිපතීන් වහන්සේ අනුගමනය කළ වත් පිළිවෙත් මෙන්ම ධර්ම ශාස්ත්‍ර ශබ්ද ශාස්ත්‍ර සේවය එලෙස ම පවත්වාගෙන යමින් අධිෂ්ඨානශීලීව කැපවීමෙන් හා දූරදක්නා ඥානයෙන් උන්වහන්සේ කටයුතු කිරීම නිසා ම ස්‍යාමෝපාලිවංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන කාරක සංඝ සභාව කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන සංඝනායක පදවිය උන්වහන්සේ වෙත පිරිනැමීම මේ මස 07 වැනි දින සිදු කිරීමට නියමිත ය.

වැලමිටියාවේ ඤාණරතන නාහිමියන්ට තුනුරුවන්ගේ ආශිර්වාදය ලැබේවා'යි ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය
**මල්වානේ චන්දරතන හිමි**

# කදුරුදූවේ සුගතවංස නාහිමි



වාද්දුව, මොරොන්තුඩුව ගෝනදුව උත්තරචේතියාරාම පුරාණ මහා විහාරාධිපති, විශ්‍රාමික පරිවේණාධිපති , ත්‍රිපිටකවේදී ශාස්ත්‍රපති කර්මාචාර්ය කදුරුදූවේ සුගතවංස හිමි වෙත මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශ්වය මඟින් "ත්‍රිපිටක විශාරද සද්ධර්ම කීර්ති ශ්‍රී සාරානන්ද" යන ගෞරව නාම සම්මුතිය සහිතව බස්නාහිර පළාතේ කොළඹ, කළුතර දෙදිසාවේ ප්‍රධාන සංඝ නායක පදවිය පිරිනැමී ය. අභිනව කදුරුදූවේ සුගතවංස නාහිමියන්හට අක්ත පත්‍ර පිරිනැමීම මාර්තු 31 වැනිදා මහනුවර මල්වතු මහා විහාරයේ දී ද, පිළිගැනීමේ උළෙල අප්‍රේල් 02 වැනිදා ගෝනදුව උත්තර චේතියාරාම පුරාණ මහා විහාරස්ථානයේ දී ද පැවැත්වුණි.

**ඌරුගමුවේ අස්සජි හිමි**

# ඓතිහාසික ශ්‍රී කල්‍යාණී රාජමහා විහාරයේ පෝදා වැඩසටහන

පෙ.ව. 06.00 - 07.00 සීල සමාදානය හා උදෑසන බුද්ධ පූජාව ශ්‍රී කල්‍යාණී රාජමහා විහාරයේ කෘත්‍යාධිකාරී ශාස්ත්‍රවේදී රන්දිලිගම මහින්ද හිමි, 08.00 - 09.00 භාවනාව ශ්‍රී කල්‍යාණී උපය රාජමහා විහාරාධිපති, කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නා හිමි, 09.00 - 10.00 ධර්ම දේශනාව කොටනෙළුවේ පුඤ්ඤානන්ද හිමි, 10.00 - 11.00 ධම්මපදයෙන් බිඳක් කැලණියේ ශාසනවංශ හිමි, 11.00 - 11.30 බුද්ධ පූජාව ගොඩපොල නන්ද හිමි, ප.ව. 02.00 - 03.00 වෛද්‍ය දේශනය 03.00 - 04.00 ධර්ම දේශනාව කරවිලකොටුවේ ධම්මතිලක හිමි, 04.00 - 05.00 ධර්ම දේශනාව කොබ්බෑවල මේධංකර හිමි, 05.00 - 06.00 භාවනා කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නා හිමි, 06.00 - 07.00 ගිලන්පස බුද්ධ පූජාව දෙහියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි.

## ගෞරව සම්මානයෙන් පිදුම් ලබයි

වසර 40කට ආසන්න කාලයක සිට මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතන රැසක ප්‍රාදේශීය වාර්තාකරුවකු ලෙස සේවය කරන දම්මුල්ලේ සේන වී ගමගේ මහතාගෙන් සිදුවන සේවය ඇගයීම් වස් දේශකීර්ති ශාසනාභිමානී යන ගෞරව සම්මානය පිරිනමා ඇත. බෙලිඅත්ත පලපොත ශ්‍රී විජයාරාම මහා විහාරස්ථානයේ ඉකුත් දින පැවති ආගමික උත්සවයේ දී ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක ආචාර්ය ඕමල්පේ සෝභිත නායක මාහිමිපාණන් වහන්සේ විසින් මෙම ගෞරව සම්මානය පිරිනමා ඇත.



## සසුන් කෙත අස්වද්දමු ව්‍යාපෘතියක්

ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත "සසුන් කෙත අස්වද්දමු" ව්‍යාපෘතිය යටතේ සංඛ්‍යාත්මකව සාමණේර භික්ෂූන් වහන්සේ ගෞතම ශාසනයට දායාද කරනු පිණිස කුලදරුවන් සසුන්ගත කිරීමේ වැඩසටහන් මාලාවක් සංවිධානය කොට ඇත. එහි පළමු අදියර 2023 වෙසක් සතිය තුළ සිදු කිරීමට අපේක්ෂිත ය.

එහිදී පැවිදි පින්කම පොදු පූජනීය ස්ථානයක දී උත්තරීතර මහ නාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් හා පාර්ශවීය මහ නාහිමිපාණන් වහන්සේගේ මෙහෙයවීමෙන් ජාතික පුණ්‍යෝත්සවයක් වශයෙන් සිදු කරන අතර, පැවිදි වන කුල දරුවන් වෙනුවෙන් අවශ්‍ය වන පුදපරිෂ්කාර ආදිය සංඝ සභාව විසින් සපයනු ලැබේ. සෑම සාමණේරයන් වහන්සේ නමක් වෙනුවෙන්ම කැපකරු දායක අනුග්‍රාහකත්වයක් ද සොයා දෙනු ලැබේ.

පැවිදි කිරීමෙන් පසු ආචාර්යයන් වහන්සේ කැමැති වන්නේ නම්, නිශ්චිත එක් ස්ථානයක දී වර්ෂයක මූලික බණදහම් හා වත්පිළිවෙත් පුහුණුවක් ලබා දීමට අපේක්ෂිත යි. මූලික පුහුණුවෙන් පසු සංඝ සභාවේ අධීක්ෂණය යටතේ තෝරාගත් පිරිවෙන් ආයතනයන්හි නේවාසික කොට මූලික පිරිවෙන් අවසානය දක්වා අවුරුදු පහක පිරිවෙන් අධ්‍යාපනය ද, ඉන්පසු බලපිටිය ශ්‍රී ලංකා ප්‍රාචීන භික්ෂු විද්‍යාලයේ තුන් අවුරුදු පණ්ඩිත උපාධිය හා ත්‍රිපිටකාචාර්ය ගෞරව උපාධිය සඳහා යෙමු කරනු ලබයි. අවුරුදු නවයක් සංඝ සභාවේ සෘජු අධීක්ෂණය යටතේ මූලික හා උසස් අධ්‍යාපනය ලබා දී ප්‍රඥාවෙන් මෙන්ම ශ්‍රද්ධාවෙන් පිරිපුන් රාජකීය පණ්ඩිතෝපාධාරී භික්ෂු සමූහයක් අමරපුර වංශයටත්, පොදුවේ සම්බුද්ධ ශාසනයටත් දායාද කිරීම මෙම ව්‍යාපෘතියේ අපේක්ෂාව යි.

ඒ පිළිබඳ වැඩිවිස්තර සහකාර ලේඛකාධිකාරී අහංගම මෛත්‍රීමූර්ති හිමි, ශ්‍රී ලංකා අමරපුර සංඝ සභා කාර්යාලය, නො. 70, ගාලුපාර, කොළඹ 06 යන ලිපිනයට එවීමෙන් උපදෙස් ලබාගත හැකි බව ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ සභාපති කරගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති මහා නාහිමියන් නිවේදනයක් නිකුත් කොට දන්වා ඇත.

## මහර දහම් පාසල් ගුරු සංගමයෙන් දහම් පාසල් ගුරු උපහාර



උත්සවයට සහභාගි වූ මහා සංඝරත්නය ඇතුළු ආචාර්යවරුන්ගෙන් පිරිසක්

දහම් පාසල් ගුරුවරයා යනු කිසි විටෙක නම්බු නාම හෝ වරප්‍රසාද බලාපොරොත්තු වන්නෙක් නොවේ. ඔවුහු කිසිදු ඇගැයීමක් ද බලාපොරොත්තු නොවෙති. ඔවුන්ගේ ඒකායන අරමුණ වන්නේ දරුවන් සුමගට යොමු කිරීම පමණි. තම කාලය , ධනය, ශ්‍රමය වැය කරමින් එසේ නිස්සරණාධ්‍යාසයෙන් කටයුතු කරන දහම් පාසල් ආචාර්යවරුන් ඇගැයීමකට ලක් කරන්නේ නම් එය මහත් වටිනා පින්කමක් ද වන්නේය.

එවන් මහඟු පුණ්‍යකර්මයක් කරන්නට පසුගියදා මහර දහම් පාසල් ගුරු සංගමය විසින් කටයුතු කරන ලදී. ඒ මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මහර ශාසනාරක්ෂක මණ්ඩලයේ දහම් පාසල් ආචාර්යවරුන් උදෙසා ය. ඒ උපහාරය සිදු කිරීමේ මූලිකත්වය ගත්තේ මහර දහම් පාසල් ගුරු සංගමය විසිනි. මහර ශාසනාරක්ෂක මණ්ඩලයේ (1 කලාපයේ) දහම් පාසල්හි 2019 වසරේ සිට වසර 3කට වඩා අඛණ්ඩ සේවා කාලයක් හිමි ආචාර්ය භවතුන්ට එසේ උපහාර පිදීම සිදු කෙරුණේ ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේඛකාධිකාරී ඕනෑගම නන්දරතන, සභාපති පරකන්දෙණියේ ආර්ය ශ්‍රී මනෝරථ, උප සභාපතිවරුන් වන කැන්දලියැද්දපාලුවේ සිරිනන්ද, පොතුවිල චන්දසිරි හා නියෝජ්‍ය ලේඛකාධිකාරි කිරිමැටියාගාරේ සිරිධම්ම ඇතුළු නාහිමිවරුන්ගේ උපදේශකත්වයෙනි.

එම උපහාර උලෙළට ආචාර්යවරුන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වූ අතර එහිදී වසර 3කට වඩා සේවා කාලයක් සැපිරූ ආචාර්යවරුන් 271 දෙනකුට උපහාර හා සම්මාන ප්‍රදානය කිරීමට කටයුතු කර තිබුණි.

සියලු ආචාර්ය භවතුන්ට වටිනා විශේෂිත වූ තිළිණය සඳහා පූර්ණ අනුග්‍රහය ලබා දුන්නේ මැලේසියාවේ ප්‍රධාන සංඝනායක, මැලේසියාවේ සෙන්තුල් බෞද්ධ විහාරාධිපති මහා කරුණා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් බූටාවත්තේ සරණංකර නා හිමියන් විසිනි.

# පෝදා පින්කම්

### මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය - තරුණ ශීල සමාදනය

පෙරවරු 6.00 - 7.00 සිල් සමාදන් කරවීම, අනුශාසනාව හා බුද්ධ පූජාව කුඹුකසිරි වජිරඤාණ ධර්මනිකේතනාධිපති ගල්කිස්සේ සෝමානන්ද හිමි. 8.00 - 9.00 භාවනාව කොත්මලේ ඤාණවංස හිමි, 9.00 - 10.00 ධර්ම දේශනාව රාජකීය පණ්ඩිත නීතියගම චන්දිම හිමි, 10.00 - 11.15 පරෝපකාර සංග්‍රහය අනුශාසනාව හා බුද්ධ පූජාව ශාස්ත්‍රපති පණ්ඩිත මහඔය අනුරුද්ධ හිමි, පස්වරු 12.30 - 1.00 පිරිත් හා තෙරුවන් ගුණ අකුරැස්සේ ධම්මරතන හිමි, 1.00 - 2.00 ධර්ම සාකච්ඡාව රාජකීය පණ්ඩිත කන්දේගෙදර සෝභිත හිමි, 2.00 - 3.00 වෙසෙසි දෙසුම ආචාර්ය චමිල ලියනගේ මහතා, 3.00 - 4.00 ධර්ම දේශනාව ශාස්ත්‍රපති සියඹලාගොඩ ධම්මින්ද හිමි, 4.15 - 5.00 ධම්මපදය ශාස්ත්‍රපති පණ්ඩිත ගබ්බෙල වජිර හිමි, 5.00 - 6.00 ධර්ම දේශනාව දියතලාවේ පියදස්සි හිමි, 6.00 - 6.30 බෝධි පූජාව මෙහෙයවීම ශාස්ත්‍රපති පණ්ඩිත හක්මණ සුමනසිරි නාහිමි.

### මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය වැඩිහිටි ශීල සමාදන වැඩසටහන

පෙරවරු 6.00 - 7.00 සිල් සමාදන් කරවීම සහ බුද්ධ පූජාව පැවැත්වීම, ත්‍රිපිටකාචාර්ය මලංගම පඤ්ඤාසාර හිමි, 8.00 - 9.00 භාවනාව රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හක්මණ සුමනසිරි නාහිමි, 9.00 - 10.00 ධර්ම දේශනාව ශාස්ත්‍රවේදී අමුණුමුල්ලේ ජිනවංස නාහිමි, 10.00 - 11.00 සූත්‍ර දේශනාව රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පාණදුර පසන්න හිමි, 11.00 - 11.15 බුද්ධ පූජාව බදුල්ලේ සුනීත හිමි, පමුණුවිල නන්ද විමල හිමි, පස්වරු 12.20 - 1.00 පිරිත් හා තෙරුවන් ගුණ තලංගල්ලේ ධම්මරතන හිමි, බණ්ඩාරගම ධම්මවිජය හිමි, 1.00 - 2.00 ධර්ම සාකච්ඡාව ශාස්ත්‍රපති පණ්ඩිත වේරදූවේ මහින්ද හිමි, 2.00 - 3.00 ධර්ම දේශනය ශාස්ත්‍රපති පණ්ඩිත ගොම්බද්දල දමිත හිමි, 3.00 - 3.45 ධර්ම දේශනාව කොබෙයිගනේ ධම්මදස්සි හිමි, 4.00 - 5.00 ධර්ම දේශනාව ශාස්ත්‍රපති පණ්ඩිත මීගොඩ සුඛිත හිමි, 5.00 - 6.00 ධම්ම පදය ශාස්ත්‍රවේදී පූජාපිටිය සන්තුසිත හිමි, 6.00 - 6.30 බෝධිපූජාව සහ සිල් අලුත් කිරීම, රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හක්මණ සුමනසිරි නාහිමි.

### තලවතුගොඩ සංඝමිත්තාරාමය

අලුයම 05.30 අටවිසි බුදුරජාණන් වහන්සේ සහ අසූ මහා ශ්‍රාවිකාවන් වහන්සේ උදෙසා ප්‍රණීත ක්ෂීරපායාස පූජාව, පෙරවරු 6.00 - 7.00 ශීල සමාදානය සහ සම්බුද්ධ පූජාව, 8.00 - 9.00 ධර්ම දේශනාව ගල්කිස්සේ සෝමානන්ද හිමි, 10.00 - 11.00 ධර්ම දේශනාව වතුරුවිල සිරි සුජාත හිමි, 11.00 සම්බුද්ධ පූජාව, 12.30 - 1.30 ධර්ම දේශනාව කැලණියේ අජිත හිමි, 1.30 - 2.30 දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව, 4.00 - 5.00 ධර්ම දේශනය තලගල ධම්මගවේෂී හිමි, 6.00 අටවිසි බුදුරජාණන් වහන්සේ සහ අසූමහා ශ්‍රාවකයන් වහන්සේ උදෙසා පවත්වන ගිලන්පස පූජාව.

### රද්දොළුව ශ්‍රී අමර මහා විහාරස්ථානය

අලුයම 5.00 ට ශ්‍රී දළදා වහන්සේ, අටවිසි බුදුරජාණන් වහන්සේ උදෙසා ප්‍රනීත කිරි ආහාර පාත්‍ර 32ක් පූජා කිරීම, 5.30ට පින්වතුන් අෂ්ටාංග උපෝසථ ශීලයෙහි පිහිටුවීම හා අනුශාසනාව, උදෑසන 6.00 ට ආහාර බුද්ධ පූජාව හා තෙරුවන් වන්දනාව, පෙරවරු 7.45 සිට 8.45 දක්වා ධර්ම දේශනාව, ගෞරව ශාස්ත්‍රවේදී මාදුවේ කොලිත හිමි, 9.00 සිට 10.45 දක්වා ධර්ම සාකච්ඡාව, මහාචාර්ය අශෝක ප්‍රියදර්ශන මහතා, ධර්මාචාර්ය කේ. එච්.ඒ.ආර්. කුමාරසිංහ මහතා, ශාස්ත්‍රපති නීල් ධර්මප්‍රිය බණ්ඩාර මහතා, ධර්මාචාර්ය කේ.ඒ.එස්. ආර්. දයානන්ද මහතා ඇතුළු වියතුන්, 10.45 ට ව්‍යංජන, පලතුරු, කැවිලි වර්ග 32 ක් ඇතුළු ශ්‍රී දළදා වහන්සේ, අටවිසි බුදුරජාණන් වහන්සේ උදෙසා මුරුතැන් බුද්ධ පූජා පූජා කිරීම, පස්වරු 12.00 සිට 12.30 දක්වා සක්මන් භාවනාව, 01.15 සිට 02.15 දක්වා කාව්‍ය ධර්ම දේශනාව ශාස්ත්‍රවේදී ගල්වලයායේ සුගතරංසි හිමි, 2.45 සිට 3.45 දක්වා විශේෂ ධර්ම සාකච්ඡාව, වෛද්‍ය, කීර්ති බණ්ඩාර රත්නායක මහතා, 3.45 සිට 4.45 දක්වා ධර්ම දේශනාව, ශාස්ත්‍රවේදී ඇල්ලේවල ඉන්ද්‍රජෝති හිමි, 5.30 ට අටවිසි බුද්ධ පූජාව සහිත පහන් පූජා, බෝධි පූජා පින්කම පැවැත්වේ.

### බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන

පෙරවරු 6.00 - 7.00 සීල සමාදානය හා අනුශාසනාව, 7.00 - 7.30 තෙරුවන් වන්දනාව, 8.15 - 10.00 භාවනාව, 11.00 - 11.30 තෙරුවන් වන්දනාව උදෑසන වැඩසටහන් මෙහෙයවීම ප්‍රධාන අනුශාසක ආචාර්ය මිරිස්සේ ධම්මික නාහිමි, පස්වරු 12.30 - 1.00 සූත්‍ර සජ්ඣායනාව, 1.00 - 2.00 ධර්ම දේශනය හිගුරේ පඤ්ඤාසේකර හිමි, 2.00 - 3.30 ධර්ම දේශනය මඩිහේ සුගතසිරි හිමි, 4.00 - 5.00 ධර්ම දේශනය ඉද්දමල්ගොඩ වජිරඤාණ හිමි.

### කොබවක ශ්‍රී සුමනාරාමය

පෙරවරු 8.30ට ධර්ම දේශනාව බේරුවල මග්ගොන ශ්‍රී නිග්‍රෝධාරාම විහාරාධිපති කොබවක ධම්මසීවලී හිමි, 10.00ට සදහම් වන්දනාව හා දහවල සම්බුද්ධ පූජාව ආදළුවේ සුබෝධනී මෙහෙණින් වහන්සේ, පස්වරු 1.30ට භාවනාව වෑකඩ භද්‍රා මෙහෙණින් වහන්සේ, 3.30ට උපදේශන වැඩසටහන පේමරතන ගමගේ මහතා, සවස 6.00 ගිලන්පස බුද්ධ පූජාව වීරියගම අනුරුද්ධ හිමි.

# රෝහණපුරට අභිමානයක් වූ පුවක්දණ්ඩාව පන්ථාරාම මහා වෙහෙර බිම



**බෙලිඅත්ත පුවක්දණ්ඩාව නැඟෙනහිර ග්‍රාමසේවා වසමෙහි පිහිටි මෙම විහාරස්ථානය ක්‍රි.ව. 1775 දී පමණ ආරම්භ විය. පැරණි සීමා මාලකය 1815 පිහිටු වූ බවට ගල් කුලුනක සටහන් කර ඇත. එම යුගයේ තල්පත්ඉරු ලිපි ලේඛන ආදිය තවමත් විහාරස්ථානයේ සුරක්ෂිතව පවතී.**

මෙම විහාරස්ථානය සියම් මහා නිකායේ මල්වතු පාර්ශ්වයට අයත් ස්ථානයකි.

වේහැල්ලේ ධම්මදින්න හිමිගේ පළමු ශිෂ්‍යයා කදුරුපොකුණේ ස්වර්ණජෝති හිමියෝ ය.

බද්දේගම ගුණරතන නම් මාහිමියන් වහන්සේ තමන්ගේ ශිෂ්‍ය හිමිවරු කිහිප පොලක් සමඟ ක්‍රි.ව. 1775 දී පමණ පුවක්දණ්ඩාව පන්ථාරාමය පිහිටා තිබෙන ස්ථානයේ වස් වසා ඇත. වස් කාලය නිම වීමෙන් පසුව උන්වහන්සේගේ පළමු ශිෂ්‍ය උඩයාලේ ධම්මපාල හිමි එම ස්ථානයේ නතර කර ඇත. උඩයාලේ හිමියන් විසින් පුවක්දණ්ඩාව පාර අද්දර විහාරස්ථානයට අවශ්‍ය සංඝාරාම, සීමා මාලකය ආදිය පිහිටුවා ස්ථානය දියුණු කිරීමට කටයුතු කළේ ය.

උඩයාල හිමිගේ පළමු ශිෂ්‍යයා ගාල්ලේ සුනන්ද හිමියන් ඉන්පසු විහාරාධිපති පදවියට පත් විය. උන්වහන්සේගේ පළමු ශිෂ්‍යයා දබරැල්ලේ සරණංකර හිමියෝ ය.

මූලගිරියේ නන්දාරාම හිමි, කදුරුපොකුණේ විපස්සි නා හිමි යන හිමිවරු ද පුවක්දණ්ඩාව පන්ථාරාමයේ විහාරාධිපති ධුරය දැරූහ. වර්තමාන විහාරාධිපති දෙහිගහහේනේ ඥානවිමල හිමියන් ය. විහාරස්ථ භූමියේ ධම්මපාල මහා විද්‍යාලය ආරම්භ කිරීම, පේෂ කර්ම මධ්‍යස්ථානය ආරම්භ කිරීම, ප්‍රජාශාලා ආදිය සකස් කර රජයට පැවරීම, සෞඛ්‍ය මධ්‍යස්ථානය, ගම් සභා කාර්යාලය ආදිය සඳහා ඉඩම් ලබා දීම ආදී භෞතික සංවර්ධනයට දායක වී ඇත. 1947දී වර්ෂයේ දී ශ්‍රී ධර්මෝදය දහම් පාසල ආරම්භ කිරීම මෙන් ම ආධ්‍යාත්මික සංවර්ධනය වෙනුවෙන් විශාල කාර්යයන් ඉටු කරමින් පවතී.

***ඇඹිලිපිටිය සේන වී. ගමගේ***

# දරණාගම කුසලධම්ම නා හිමි ගුණානුස්මරණ පින්කමෙන් ...



2007 වර්ෂයේ ජූනි 29 වැනි දින ලොව ප්‍රථම බෞද්ධ රූපවාහිනී නාලිකාව කොළඹ 7 ශ්‍රී සම්බෝධි විහාරාධිපති ගෞරව ශාස්ත්‍රවේදී පරම පූජනීය බෝධිසත්ව ගුණෝපේත දරණාගම කුසලධම්ම නාහිමිපාණන් වහන්සේ විසින් ආරම්භ කරනු ලැබූහ.

එතැන් සිට පැය විසි හතර මුළුල්ලෙහිම බුදු බණපදයක් අසන්නට ලෝ වැසි බොදු දනන්හට හැකි විය.

තව තවත් බෞද්ධ සන්නිවේදන ආයතන බෞද්ධයා රූපවාහිනී නාලිකාව ආදර්ශ කොට ගනිමින් ආරම්භ විය. එසේ සමාජීය පරිවර්තනයක් සිදු කෙරුණේ දරණාගම කුසලධම්ම මහා යතිවරයන් වහන්සේට පින් සිදු වෙන්නටයි.

උන්වහන්සේගේ ගුණ අනුස්මරණය කරමින් මාර්තු 03 වැනි දින ඓතිහාසික ගැටඹේ රාජෝපවනාරාමයේ දී අභිනව බෞද්ධයා රූපවාහිනී ප්‍රාදේශීය මධ්‍යස්ථානය ගැටඹේ ශ්‍රී රාජෝපවනාරාමාධිපති ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක ධූරන්දර කැප්පෙටියාගොඩ සිරිවිමල අනුනායක හිමිපාණන් වහන්සේගේ ආශිර්වාදයෙන් සහ මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි විහාර පාර්ශවයේ අනුනායක, අතිපූජනීය වේඩරුවේ උපාලි අනුනාහිමිපාණන් වහන්සෙගේ වැඩමවීමෙන් විවෘත කෙරුණි.

මෙම පින්කම් මාලාව ඖෂධ පූජාවෙන් ආරම්භ වූ අතර ධර්ම දේශනා පිරිත් සජ්ඣායනාවලින් සමන්විත වීය. මල්වතු පාර්ශ්වයේ අනුනායක නියංගොඩ විජිතසිරි අනුනාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ හැට නමක් විෂයයෙහි සංඝගත දක්ෂිණාවක්, අඩු ආදායම්ලාභී පවුල් 500 ක් සඳහා වියළි ආහාර සලාක ලබා දීම ද, ගැබිනි මව්වරුන් සඳහා අවශ්‍යය භාණ්ඩ සහ වියළි ආහාර සලාක ද, ආබාධිත අය සඳහා රෝදපුටු අත්වාරු සහ පාසල් දරුවන් සඳහා පාසල් උපකරණ යනාදිය ද බෙදා දීම සිදු කෙරිණි.

තලාව කිරිමැටියාව හිඳෝගම ග්‍රාමයේ හා තලාව කොරකහ වැව 402 තුලාන යන ග්‍රාමයන් හි ජල පෙරණ යන්ත්‍ර දෙකක් සවි කොට දිළිඳු ජනතාව වෙනුවෙන් වියළි ආහාර ද්‍රව්‍ය ද බෙදා දීම සිදු කෙරිණ.

මෙම පින්කම් සංවිධාන කරනු ලැබුවේ බෞද්ධයා නාලිකාවේ වත්මන් සභාපති පූජනීය බොරලන්දේ වජිරඥාන නාහිමිපාණන් වහන්සේගේ අනුශාසකත්වයෙන් ය.

**කලයාණ අලවත්තේගම**




## සිරි සදහම් පැන විසඳුම්

**සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුර ලියා එවා ගුණසේන සහ සමාගමෙන් "මහ පිරිත් පොත් වහන්සේ " ධර්ම ග්‍රන්ථය හිමිකර ගන්න.**

**සතිපතා ජයග්‍රාහකයින් පස් දෙනකුට ත්‍යාග තිළිණ කෙරේ**

බුදුසරණ

මෙවර ප්‍රශ්නය - 93

**බුද්ධකාලීන භාරතයේ ධනිය ගෝපාල නම් ධනවතකු ගැන කියැවෙන සූත්‍රය ඇතුළත් නිකාය කුමක්ද ?**

*ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.*

පිළිතුර : ..............................

නම : ..............................

නිවසේ ලිපිනය : ..............................

..............................

දුරකතන අංකය : ..............................

*ඇම්. ඩී. ගුණසේන - බුදුසරණ සිරි සදහම් පැන විසඳුම් , බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10*

## තෙල්වත්ත සඟ පරපුර ශෝභාවත් කළ

# වෙහෙරගොඩ ශ්‍රී සුමංගල බුද්ධරක්ඛිත නාහිමියෝ



හික්කඩුව තිරාණගම ගණේගොඩැල්ල ශ්‍රී සුදර්ශනාරාම පුරාණ මහා විහාරය, ඓතිහාසික තෙල්වත්ත තොටගමු රත්පත් රාජමහා විහාරය ඇතුළු විහාර ගණයේ ආධිපත්‍ය හොබවා වදාළ, කීර්තිශේෂභාවෝපගත, වෛද්‍යාචාර්ය, වෙහෙරගොඩ ශ්‍රී සුමංගල බුද්ධරක්ඛිතාභිධාන ගාලු කෝරළයේ ප්‍රධාන සංඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ 188 වැනි ජන්ම දිනය පසුගිය දාට යෙදී තිබුණි.

ස්වකීය පැවිදි දිවියට ආලෝකයක් එක් කර ගනිමින් නක්ෂත්‍රය මෙන්ම දේශීය වෙදකම ද උන්වහන්සේ ප්‍රගුණ කළහ. එපමණක් ද නොව පසුකලෙක ස්වකීය දැනුමින් විවිධ පුස්කොළ පොත් ද උන්වහන්සේ රචනා කළහ.

අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ උපදෙස් අනුව තොටගමු රාජමහා විහාරයේ දාගැබ් වහන්සේ ඉදි කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කර ඇත්තේ ද බුද්ධරක්ඛිත නාහිමියන් විසිනි.

1911 දී හික්කඩුවේ නාහිමියන් අපවත් වීමෙන් පසු උන්වහන්සේ හෙබවූ නායක පදවිය ද වෙහෙරගොඩ නාහිමියන්ට ලැබුණු බව ඇතැම් පොත පතෙහි සඳහන් වේ. ඒ හැර උන්වහන්සේ සියම් මහා නිකායේ ගාලු කෝරළයේ ප්‍රධාන සංඝනායක ධුරයෙන් ද සම්භාවනාවට ලක් කළහ.

වෙහෙරගොඩ ශ්‍රී සුමංගල බුද්ධරක්ඛිතාභිධාන ස්වාමීන්ද්‍රයන් වහන්සේ, 1926 ජනවාරි මස 12 වැනි දා කීර්තිශේෂභාවෝපගත වී වදාළහ.

**කහදූවේ දස්සන හිමි**

## සසුන් කෙත පොබකළ පින්බර යතිරුවන


# ලීකොළපිටියේ ධම්මරතන නා හිමි

නිකවැරටිය වදුරැස්ස ශ්‍රී පොත්ගුල් විහාරය, අඹාලේ ශ්‍රී බෝධිරුක්ඛාරාමය, කළුතර දොඩන්ගොඩ ශ්‍රී සීලරතනාරාමය යන විහාරයන්හි අධිපති ලීකොළපිටියේ ධම්මරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සද්ධර්ම කීර්ති ශ්‍රී ජිනරතන යන ගෞරව ශ්‍රී නාමය සහිතව වන්නි දෙමළ හත්පත්තු දෙකේ ද්විතීය සංඝ නායක පදවියෙන් පිදුම් ලැබූහ.

නිකවැරටිය රස්නායකපුර ලීකොළපිටිය නම් වූ ස්වභාව සෞන්දර්යයෙන් පිරි ගමේ උපත ලැබූහ. ආර්.ඇම්. ඩිංගිරි බණ්ඩා පියාණන් වූ අතර ඩබ්ලිව්.ඕ. සෝමාවති මෑණියන් විය.

1981 මැයි මස 18 වැනි දින මහනුවර මල්වතු මහා විහාරීය මංගල උපෝසථාගාරයේ දී අධිශීල සංඛ්‍යාත උපසම්පදා ශිලයෙහි පිහිටවූහ.

ධම්මරතන නාහිමි ශාසනික වශයෙන් ද, සාමාජීය වශයෙන් ද විශාල සේවාවක් සිදු කරන භික්ෂූන් වහන්සේ නමකි. ඒ අතර නිකවැරටිය කොටවෙහෙර රෝහලේ ප්‍රධාන අනුශාසක ධුරය දැරීම, නිකවැරටිය ශ්‍යාම නිකායික භික්ෂු සංගමයේ උප සභාපති ධුරය දැරීම, නිකවැරටිය කොට්ඨාශයේ සිවිල් ආරක්ෂක කමිටුවේ අනුශාසක ධුරය දැරීම. උන්වහන්සේ සිදු කරන සේවාවන් අතර කිහිපයක් වන්නාහ. නිකවැරටිය ශාසනාරක්ෂක බලමණ්ඩලයේ සභාපති ධුරය ද දිගු කාලයක් හෙබවූ උන්වහන්සේ තපෝ වෘද්ධ, ශීල වෘද්ධ ගුණ වෘද්ධ සංඝ පීතෘ වරයාණන් වහන්සේ නමකි. උන්වහන්සේ



උදෙසා පිරිනමන ලද නායක පදවියේ ශ්‍රී සන්නස්පත්‍ර ප්‍රදානෝත්ස්වය 2023.04.21 වැනි සිකුරාදා දින පෙ.ව: 2.00 ට මල්වතු මහා විහාරයේ දී තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පින්බර දෝතින් පිරිනැමෙන්නාහ. අභිනව නායක ස්වාමිපාදයන් වහන්සේ පිළිගැනීමේ මහෝත්සවය 23 ඉරිදා ප.ව: 3.00 ට නිකවැරටිය නගර ශාලාවේ දී සිදු කෙරේ.

අභිනව නායක පදවිවෙන් පිදුම් ලබන ලීකොළපිටියේ ධම්මරතනාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට තව බොහෝ කලක් ශාසනික සේවාවක් සිදු කිරීමට චිර ජීවනය ප්‍රාර්ථනා කර සිටිමි.


**ගලගෙදර රතනවංස හිමි**

## පිහිට පතයි

ගණේමුල්ල, හොරගොල්ල, කිරිඳිවිට පාර අංක 238හි පදිංචි සමන් ප්‍රදීප් ප්‍රනාන්දු යන අය දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඔහුට බී පොසිටිව් හෝ බී නෙගටිව්, ඕ පොසිටිව් හෝ ඕ නෙගටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය බව දන්වා සිටියි. පරිත්‍යාගශීලියකු වේ නම් 0332260890 දුරකතනයට දන්වන ලෙස ඉල්ලීමක් කරයි.

## ව්‍යක්ත විශාරද ධර්ම විනයධර

# වංගියකුඹුරේ බේමානන්ද මහ නා හිමියෝ



ව්‍යක්ත, විශාරද, ධර්මධර, විනයධර, සිල්වත් ගුණයෙන් පිරි, ශ්‍රී ලංකා සම්බුද්ධ ශාසනය හෙබ වූ අතිසම්භාවනීය සංඝ පීතෘන් වහන්සේ නමක් ලෙස ඌව උඩුකිඳ අමරපුර මහා නිකායේ මහානායක ධුරය හෙබ වූ රාජකීය පණ්ඩිත වංගියකුඹුරේ බේමානන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙහි කතා නායකයා වෙති.

1920ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින උපත ලද කුල කුමරුවා මාපා මුදියන්සේලාගේ උක්කුබණ්ඩා නම් විය. පින්වත් කුල කුමරුවාණෝ වංගියකුඹුර ද්විභාෂා මිශ්‍ර පාඨශාලාවෙන් මූලික අධ්‍යාපනය ලබා පූර්වකෘත පුණ්‍ය සම්පත්තියේ මහිමයේ බලයෙන් එවකට වංගියකුඹුර ශ්‍රී සුභද්‍රාරාමාධිපතිව වැඩවිසූ බොරලන්දේ ධම්මාලංකාර මාහිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1934 ජනවාරි මස පළමුවන දින වංගියකුඹුරේ බේමානන්ද හිමි නමින් ප්‍රව්‍රජ්‍යාභූමියට පත් වූහ.

මාතර කෝට්ටගොඩ සෞගතෝදය පිරිවෙනට 1935 දී ඇතුළත් ව රාජකීය පණ්ඩිත කහදාමෝදර ශ්‍රී චන්ද්‍රකීර්ති පියරතන මහ නාහිමිපාණන් වහන්සේ ඇසුරෙන් සිංහල, පාලි, සංස්කෘත, ඉතිහාසය, පුරාවිද්‍යාව, ශිලාලිපි, ඡන්දෝලංකාර සහ තර්කන්‍යාය ආදී භාෂා ශාස්ත්‍ර මැනවින් හදාරා 1941 දී ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වන්නට යෙදුණු ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයට පෙනී සිට ඉන් විශිෂ්ට සාමාර්ථය ද, 1943 දී ප්‍රාචීන මධ්‍යම ද, 1945 දී ප්‍රාචීන අවසාන ආදී විභාගයන්ගෙන් ද ත්‍යාග සහිතව ගෞරව සාමාර්ථය හිමි කර ගත්හ.

1941 ජූනි මස 26 වෙනි දින වංගියකුඹුර ශ්‍රී සුභද්‍රාරාම විහාරස්ථ විශුද්ධ බද්ධ සීමාමාලකයේ දී, ඌව අමරපුර නිකායේ මහානායක අතිපූජ්‍ය මාවුස්සාගොල්ලේ සිරි රතනපාලාභිධාන ස්වාමීන්ද්‍රයන් වහන්සේට උපාධ්‍යායව බොරලන්දේ ධම්මාලංකාර සහ උඩුකිඳ අමරපුර නිකායේ මහානායක ධුරන්ධර සිරිසද්ධම්මවංසපාල තුප්පිටියේ ධම්මජෝති යන දෙනම වහන්සේලාගේ ආචාර්යත්වයෙන් සුපරිශුද්ධ අධිශීල සංඛ්‍යාත උපසම්පදා භූමියට පත්වූහ. උඩුහාවල පියතිස්ස, බෝගහකුඹුරේ ධම්මාලෝක හා ඇකිරියේ පියරතන යන යතිවරයන් වහන්සේ වංගියකුඹුරේ බේමානන්ද හිමියන්ගේ කර්මාචාර්යයන් වහන්සේ වූහ.

පිරිවෙන් අධ්‍යාපනයෙන් සමුගෙන 1951 දී ස්වකීය විහාරස්ථානය වන වංගියකුඹුර ශ්‍රී සුභද්‍රාරාම විහාරස්ථානයට වැඩම කොට විහාරාධිපතිත්වය භාරගෙන කටයුතු කරමින් සිටින අතරතුර, ගෞරවාර්හ රාජකීය පණ්ඩිත පහමුණුතොට සුධම්මානන්ද පරිවේණාධිපතීන් වහන්සේ යටතේ පන්නලවෙල බ/ විද්‍යා ප්‍රදීප පිරිවෙන් ආචාර්ය ධුරය ද, පරිවේණාධිපති ධුරය ද, දරා ශාසනික පැවිදි අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට උත්සුකව කටයුතු සිදු කළහ.

එපමණක් ද නොව කන්දේපුහුල්පොල ගමට ශ්‍රී පුෂ්පාරාමය නමින් නව විහාරස්ථානයක් සහ සමුපකාර වෙළෙඳසැලක් ද, තැපැල් හලක් ද ලබාදීමට උන්වහන්සේගේ අනුශාසනා පරිදි සිදු කර ඇත. එසේම ඌව උඩුකිඳ අමරපුර මහා නිකායේ විනය සෝහනී කාරක සංඝ සභාවේ සහික ධුරයෙන් ද, 1974 මාර්තු 15 වන දින "සද්ධර්ම භාරතීශ්වර සද්ධර්මාලංකාර වංසාවතංශ" යන ගෞරවෝපාධියෙන් හා තෙරසම්මුතියෙන් යුක්තව අනුනායක ධුරයෙන් ද පිදුම් ලැබූහ. තවද 1992 දෙසැම්බර් මස 27 වන දින දී ඌව පළාත් සභාව මගින් පිරිනැමූ "ඌව විද්වත් සම්මානයෙන්" ද අප කතානායකයාණෝ පිදුම් ලැබූහ.

රාජකීය පණ්ඩිත බෝකන්ඔරුවේ ඤානානන්දාභිධාන උඩුකිඳ අමරපුර මහා නිකායේ මහානායක මා හිමියන් අපවත් වීමෙන් පසු 1988 පෙබරවාරි 02 දින තත් නිකායේ මහානායක ධුරයෙන් ගරු සම්භාවනාවට පාත්‍ර වූහ.

මෙලෙස ප්‍රදේශයට පමණක් නොව මුළු මහත් බෞද්ධ ලෝකයාගේ ම හිතසුව පිණිස උදාර සේවාවන් රැසක් සිදු කළ අප මහානායක මාහිමිපාණන් වහන්සේ සියලු සසර දම් අනියත බව ප්‍රකට කරමින් 2000 අප්‍රේල් මස 15 වන දින අපවත් වී වදාළේ සිය සිසු පිරිස ද, දායක ප්‍රජාව ද, ශෝකාර්ණවයෙහි නිමග්න කරවමිනි.

සිරි සුගතශාසනවංසපාල ධම්මාලංකාර රාජකීය පණ්ඩිත මහෝපාධ්‍යාය වංගියකුඹුරේ ශ්‍රී බේමානන්දාභිධාන අප මහනායක මා හිමිපාණන් වහන්සේට උතුම් නිවන්සුව ලැබේවා.

**බඹරපනේ පඤ්ඤාලංකාර හිමි**

# ඕමල්පේ සිරි සීලානන්ද හිමි

## කොළොන්න කෝරළයේ අභිනව ප්‍රධාන අධිකරණ සංඝ නායක පදවි ලබයි

රත්නපුර නව නගරය පුබුදුගම ධර්ම නිකේතනාරාමාධිපති ඕමල්පේ සිරි සීලානන්ද හිමිපාණන් සබරගමු පළාතේ සියම් මහා නිකායේ මල්වතු පාර්ශවයේ සබරගමුව පළාත් බද කොළොන්නා කෝරළයේ ප්‍රධාන අධිකරණ සංඝනායක පදවියට පත්ව සිටී. ඒ පිළිබඳ අක්ත පත්‍ර ප්‍රදානය මෙම 6 වැනි දා පස්වරුවේ මහනුවර මල්වතු මහා විහාර උපෝෂථාගාරයේ දී තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල නාහිමිපාණන් වහන්සේ මහා ප්‍රධාන කාරක සංඝ සභාවේ සහභාගීත්වයෙන් සිදුවේ.

# කළ කුසල විපාක මාරයාටවත් වළක්වන්න බෑ



**අනුරාධපුර රාජ්‍ය පැවැති කාලයේ මහවැලි ගංගාව ළඟ තිබුණා 'පූගලු' කියලා ගමක්. ආහාර පානවලින් කිසිම අඩුවක් ඒ ගමේ මිනිසුන්ට නම් තිබුණේ නෑ. භික්ෂූන් වහන්සේ නිතර පිණ්ඩපාතයේ වැඩියේ මේ ගමට. ශ්‍රද්ධා සම්පන්න අඹුසැමි යුවළක් දැහැමිව පින්කම් කරමින් ජීවත් වුණා. කාලයක් ගත වෙන කොට දෙදෙනාට දරු සම්පතක් ලැබුණා.**

නම දැම්මේ 'තිස්ස' කියලා. කිරිදරුවා දින සති මාස අවුරුදු ගෙවමින් වැඩිවියට පත් වුණා. මව් කිරි බීම නවතා කෑම කන්න පටන් ගත්ත දවසේ ඉදලා මේ දරුවට කෑම විදිහට ලැබුණේ ඇල්හාල් සමග මොනර මස් හා සුවඳවත් ගිතෙල් සහිත බතක්. තුන් වේලට ම ලැබුණා.

භික්ෂූන් වහන්සේගේ වැඩම වීමත්, ධර්මය නිතර අහන්න ලැබීමත් නිසා පැවිදි වීමට කැමැත්තකුත් ඇති වුණා. දෙමාපියන්ගේ අවසරය අරගෙන 'පූගලු' ගමේ තිබුණු පූගලු විහාරයට ගිහින් මහ තෙරුන් වහන්සේට නමස්කාර කරලා පැවිදිවීමේ කැමැත්ත ප්‍රකාශ කළා.

දෙමාපියන්ගේ අකැමැත්තක් නැති නිසා සුදුසු වේලාවක් බලලා උත්වසශ්‍රීයෙන් පැවිදි කළා. ගිහි නාමය ම පැවිදි නාමයටත් යොදා තිබුණා. තරුණ වයසේ සිටි නිසා සිදු වුණා ත්‍රිපිටකය ඉගෙන ගන්න. ටික කලකින් ම මහත් දැනුමැත්තෙක් වෙලා ධර්ම දේශනා කරන්නත් පටන් ගත්තා. හැබැයි පැවිදි වුණ දවසේ ඉදලා ම මේ 'තිස්ස' තෙරණුවෝ වැළඳුවේ ම මොනර මසුත්, සුවඳ ගිතෙල් මිශ්‍ර ඇල්හාලේ බත්මයි. කවදාකවත් පිණ්ඩපාතයේ දී වෙනත් ආහාරයක් උන්වහන්සේගේ පාත්‍රයට ලැබෙන්නේ නෑ.

විහාරයට වැඩම කළහම අනෙක් තෙරුන් වහන්සේ උන්වහන්සේගේ පිණ්ඩපාතය බලනවා. ඒ කිසිම දවසක දැක ගන්න ලැබුණේ නෑ වෙනත් ආහාරයක්. දුප්පත් ගෙදරකට වැඩියත්, පොහොසත් ගෙදරකට වැඩියත්, ගෙපිළිවෙලින් වැඩියත් මේ ආහාරය වරදින්නේ නෑ.

මේ විශේෂ සිද්ධිය විහාරයේ භික්ෂූන් අතර කතාබස් වෙන්න පටන් ගත්තා. දවසින් දෙකින් ගම පුරාම, නගරය පුරාම අනතුරුව ප්‍රදේශය හා රටපුරාමත් මේ කතාව පැතිර යන්න වුණා.

දවසක් එක් ඇමැතියකුට අහන්න ලැබුණා මේ කතාව. ඔහු හිතුවා මේක ඇත්තද කියලා බලන්න. තිස්ස තෙරුන්ගේ අතීත කුසලය පරීක්ෂා කරන්නත්, එම විශේෂත්වය නැති කර දාන්නත් කල්පනා කළා.

දවසක් නිදියහනට ගිහින් බිරිඳ අමතලා'සොදුර, මට හෙට දානයක් දෙන්න හිතුණා. මම උදේ ම පූගලු විහාරයට ගිහින් භික්ෂූන් වහන්සේ නමකට ආරාධනා කරන්නම්. උන්වහන්සේ වැඩියාට පස්සේ නිවුඩු හාලෙන් කුඩමසු කැඳක් හදලා පූජා කරන්න. දහවල් දාන වේලාව පැමිණියහ ම පලා කොළ මාලුවකුත්,කාඩි ඇඹුලකුත් හදලා නිවුඩු හාලේ බතක් එක්ක පූජා කරන්න.'යි කිව්වා.

බිරිඳත් ඒ සියලු ම කටයුතුවලට කැමැති වුණා. පාන්දරින් ම අවදිවෙලා පූගලු විහාරයට ගිහින් 'තිස්ස' තෙරුන් වහන්සේට ආරාධනා කළා තමන්ගේ ගෙදර දානයට. ඇමැති නැවත ගෙදර නො ගිහින් වෙන කටයුත්තකට ගියා. බිරිදත් උදේම අවදි වෙලා දානය සකසන වැඩවල යෙදුණා.

මේ අතරේ ගෙදරට ආවා මහලු මිනිසෙක්. මෙයා ඇමැතියාගේ කටයුතු සොයා බලලා, ඒවා සකසලා දෙන කෙනා. අමාත්‍ය බිරිඳ අමතලා

'මෑණියනි, අද ඇමැතිතුමාට විශේෂ රාජකාරියක් යෙදිලා රජමාලිගාවට ගියා. මට දුන්නා මේ බඩු පාර්සලය දහවල් දානයට වඩින භික්ෂූන් වහන්සේට දානය සකසන්න කියලා'යි පවසා ඔහු ගෙදරින් යන්න ගියා.

ඇමැති බිරිඳ බඩුමල්ල ලිහල බලන කොට මොනර මසුත්, ඇල්හාලුත්, සුවඳ ගිතෙලුත් දැකගන්න ලැබුණා. ඒවායෙන් දානය සකස් කරලා පූජා කළා. ඇමැති සවස ගෙදර ඇවිත් 'අද පූගලු විහාරයේ තිස්ස තෙරුන් වහන්සේ වැඩියද? දානය දුන්න ද?'යි ප්‍රශ්න කර සිටියා.

එවිට බිරිඳ ඔහුට උත්තර දෙමින්

'ඔව් ඔබ වෙනදා ගෙදරට එවන කෙනා අතේ බඩු මල්ලක් එවලා තිබුණානේ මම ඒකෙන් දානය සකසලා පූජා කළා'යි කියා සිටියා. බඩුමල්ලේ තිබුණේ මොනවා දැයි අසා දැනගෙන අදාළ මහල්ලා හමු වී ගෙදරට බඩු මල්ලක් දුන්නා දැයි ඇහුවා. ඔහු එහෙම කිසිම දෙයක් දැනගෙන හිටියේ නෑ. අමාත්‍යවරයා තිස්ස තෙරුන් වහන්සේගේ අතීත කුසලය ගැන හොඳටම පැහැදුණා. කාටවත් එම කුසලයේ විපාකදීම් වළකන්නට බැරි බවත්, බඩු මල්ල ගෙනත් දෙන ලද්දේ දෙවියන් විසින් බවත් වටහා ගත්තා. සම්බුද්ධ ශාසනය කෙරෙහිත් , තිස්ස තෙරුන් වහන්සේ කෙරෙහිත් අපමණ පැහැදීමට පත් වෙලා මහා දානපතියෙක් වුණා. කලක් ගතව යන විට තෙරුන් වහන්සේ උපසම්පදාවෙන් හැටවයසට පත්වුණා. අර්හත්භාවය ලබා සිටි තෙරුන් වහන්සේ පිරිනිවන් පෑමට සූදානම් වුණා. විහාරයේ වැඩ සිටිය හැම භික්ෂූන් වහන්සේ නමකට ම ඇහෙන්න ගෙඩිය ගසමින් කතා කළා තමන් වහන්සේ සමීපයට වැඩම කරන ලෙසට. උන්වහන්සේ අමතලා 'පින්වත් ඇවැත්නි, මම අද පිරිනිවන් පෑමට සූදානම් වෙන්නේ. ඔබ වහන්සේට තවත් යමක් අසා දැන ගන්න තියනවා නම් අද අහල දැන ගන්න පුළුවන්. සැක දුරු කර ගන්න පුළුවනි'යි කිව්වා. එක් භික්ෂුවක් තෙරුන් වහන්සේට නමස්කාර කරලා 'ස්වාමිනි, මට ගැටලුවක් තියනවා. එය පහදලා දෙන්න. ඔබ වහන්සේ මුළු ලංකාවේ ම ප්‍රසිද්ධ තෙරුන් වහන්සේ නමක්. ගිහි-පැවිදි හැම දෙනා ම අහනවා ඔබ වහන්සේට විතරක් විශේෂ දානයක් ලැබීම සම්බන්ධයෙන්. අපට අනුකම්පාවෙන්, සමස්ත සැදැහැති පින්වත් ජනයාට අනුකම්පාවෙන් ඒ අතීත කුසලය කුමක් දැ'යි දේශනා කරන්න'යි ඉල්ලා සිටියා.

තිස්ස තෙරුන් වහන්සේ ඇඳේ වැතිර ගෙන ම අතීත කුසල කර්මය දේශනා කරන්න පටන් ගත්තා. 'පින්වත් ඇවැත්නි, මම කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ වෙළෙන්දෙක්. හැමදාම වෙළඳාමේ ගියා දුර පළාත්වලට. මම විකුණුවේ හිරියල් සුණු. කරත්තයෙන් සමහර දවසක ගියා. තවත් දවසක පයින්ම ගමන් කළා. දවසක් පයින් ගියහම මට බොහොම වෙහෙස දැනුණා. එක් පොහොසත් ගෙදරකට ගිහින් ම හිරියල් විකුණන බවත්, මිල ගණනුත් පවසා සිටියා. ඒ ගෙදර හිටියේ කුලවත් තරුණියක්. ඇය මගෙන් භාණ්ඩ මිල දී ගත්තා. පයින් ම බොහෝ දුරක් ගිය නිසා මට හොඳටම වෙහෙසයි. බඩගින්නත්, පිපාසයත් ඉවසා ගන්න බැරි තැන වතුර ටිකක් ඉල්ලා සිටියා. මගේ කුසගින්න වටහා ගත් ඒ කුලවත් තරුණිය මට මොනර මසුත්, සුවඳ ගිතෙලින් පිසූ ඇල්හාලේ බතුත් පිඟානකට බෙදා දුන්නා. මම ඒවා කන්න ගන්න කොටම කුස ගින්නෙන් වෙවුල වෙවුලා, වැටි එන සුනඛයෙක් එනවා දැක්කා. ඌ මගේ ඉදිරියට ඇවිත් බලාගෙන ඉන්න ගත්තා. මගේ බඩගින්න වැඩියි. ලැබුණු කෑම ටික මට ම මදි බඩගින්නේ හැටියට. ඒත් මම එක බත් කටක්වත් කෑවේ නෑ. පළමු බත් කට මොනර මසුත් එක්ක හොඳට අනලා සතුටු සිතින් ඌට දුන්නා. මමත් කුස ගින්න නිවා ගත්තා.

මෙ ලෙස අප දෙන්නා ම එක බත් පත අනුභව කළා. සුනඛයා වල්ගය සොලවමින් සතුට ප්‍රකාශ කළා. එදා මම ප්‍රාර්ථනාවක් කළා දුප්පත් වෙලා ඉපදුණේ පෙර කුසල් නැති නිසා. අද මේ දුන්න දානයෙන් ජාතියක් ජාතියක් පාසා මට මොනර මස් හා සුවඳ ගිතෙල් සහිත ඇල්හාලේ බත් ලැබේවා'යි ප්‍රාර්ථනා කළා.

ඒ ජීවිතය කෙළවර කරලා මම ඉපදුණේ දෙව්ලොව. බුද්ධාන්තරයක් පුරාවට ම දිව්‍ය සම්පත් වින්දා. මිනිස් ලොව ආත්ම පන්සියයක් ඉපදුණා. ඒ හැම ආත්මයක දී ම මට ලැබුණොම මේ ආහාර. නිවන් දකින ආත්මයෙත් ආහාර ගන්න පටන් ගත්ත දවසේ පටන් අද දක්වාම ලැබුණේත් මේ ආහාර විශේෂය ම තමයි. එක් බත් පිඩක් සතුටු සිතින් තිරිසන් ගත සත්ත්වයකුට දන් දීම නිසා මෙතරම් සැප විපාක මම ලැබුවා. කළ කුසල් විපාක දී ම මාරයාටවත් වළක්වන්න බෑ. ඒ වගේ ම දිව්‍ය මනුෂ්‍ය හා නිවන් සැප වළක්වන්නත් බෑ.'යි රැස්ව සිටි භික්ෂු සංඝයාට තමන් වහන්සේට විපාක දුන් අතීත කුසලය පහදලා දුන්නා.

එදා සිට භික්ෂූන් වහන්සේත්, ගිහි ජනතාවත්, රාජරාජ මහාමාත්‍යවරුනුත් දන් දෙමින් මහා කුසල් රැස් කර ගෙන ත්‍රිවිධ සම්පත් ම වින්දනය කළා'යි කතා පුවතක් රසවාහිනී නම් කෘතියේ සඳහන් වෙනවා.

මේ කතා පුවතින් අපට පෙන්වා දෙන්නේ සතුටු සිතින් තිරිසන් ගත සත්ත්වයකුට හෝ දෙන දානය උතුම් බවයි. පන්සිල් රකින, දසසිල් රකින තැනැත්තන්ටත්, ආර්ය මහා සංඝයාටත් දෙන දානයේ විපාක බුදු නොවූ කිසිවකුටත් කියා නිම කර ගන්න බැරි බවත් පවසනවා.

කොපමණ දුප්පත් වුවත්, අගහිඟකම්වලින් යුක්ත වුවත් ඊළඟ සසරේ සැප සම්පත් ලබමින් නිවන් ලැබීමට නම් දන් දීම් පුණ්‍ය ක්‍රියා කළ යුතු ම වෙනවා.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
ආචාර්ය
**පදියතලාවේ අමරවංශ හිමි**

**මිනිසුන් ගැන තීරණ ගන්න ඉක්මන් නොවන්න**

බුදුසරණ




සංස්කරණය
දීපා පෙරේරා

## ස්ථිර සැපය

අටලෝ දහම හමුවේ නොසැලෙන   මනසක්
සවිමත් කළ විට දී දැක ගත හැකි   වෙනසක්
උදෙසා නිතර ගත යුතු වෙනවා   වෙහෙසක්
අවසන ලැබේ නොවෙනස් ස්ථිර   සැපතක්

**බිබිලේ ධම්මසිරි හිමි**
**කජුවත්ත ආරණ්‍ය සේනාසනය**
**දෙහිඅත්තකණ්ඩිය**

## රන්වැලි සෑරදුන් වඳිමි



දුටුගැමුණු   මහරජ
කරවූ ලොව සුප   තළ
බොදු දනගේ   පින්කෙත
ස්වර්ණමාලි සෑ   රද

රන්වැලි සෑ වඳිමි   මෙමා
සුවඳැති මල් දමින්   පුදා
පව් ඇති නම් වෙන්න   සමා
රන්වැලි සෑ වැන්ද   මෙමා

**අජිත් වික්‍රමනන්ද වීරසූරිය**
**මොරගොල්ල - ඉඹුල්ගස්දෙණිය**




දෙව්ලොව තුසිත පුර දෙව්සැප විඳ   නේක
නිම් නැති සුපින්බර දිවියක   අවිවේක
ගතකොට කෙලෙස් සිඳ වෙසඟෙහි   පෝ දාක
මනුලොව ඉපිද සම්බුදු බව ලැබු   සේක

**ගිලිමලේ රත්නපුර**
**ඩී.එස්.ඇඩ්වින් පෙරේරා**

## බක්මහ වරුණ

මල් පල බරව තුරුලිය   හිනැහෙන්නේ ය
සියොතුන් ගීත රැව් පිළිරැව්   දෙන්නේ ය
මිහිකත තණ නිල්ල තව   බැබළෙන්නේ ය
අවුරුදු කුමරිය හැඩ වැඩ   වෙන්නේ ය

මී මැසි බමර පතුරයි ගුමු ගුමු   නාදේ
මීදුම් පටල සේලේ තාලෙට   වීදේ
සවනත ගැටේ පුදබිම ඝණ්ටා   නාදේ
බොදු බැතියනගෙ හදවත පව් මළ   සේදේ

බුදු හිමි දෙවැනි වර ලංකා ධරණී   තලේ
මෙත් මල් කුසුම් වැසි වස්වා වැඩම   කළේ
බක් මහ දිනෙක බව සනිටුහන්   කළේ
සිත් සන්තොසින් නැහැවෙමි දම් අමා   විලේ

චූලෝදර මහෝදර යුද බිමට   පැන
සාමය සමාදානය කිරි   උතුරවන
දිනයක් බවට පත් කළ බුදු සමිඳු   ගුණ
ගඟුලේ වැතිර නමදින්නෙමි දෙදණ   ඇන

**ඇටම්පොල ඤාණිස්සර හිමි**
**ශ්‍රී චිත්ත විවේකාරාමය**
**දැරණියගල**

## බුදු සමිඳු වඩිනවා



මඟ දෙපස සුදුවතින්
විකසිතය මල් බෝම
පෙළ සැදී පුරුදු සේ
සාධු හඬ ගුවනැසේ

සියොතුන් රජතුන්
මුව උරඟ මලිත්තන්
සුදු මල් දෝතින්
සත්ව ගඟ ගලනවා

නිසල වන අරණේ සැම
දිය දහර සැරසෙනා
සුගන්ධ වී බුදු කුටිය
මේ අරණේ නිමවෙනා

මිහිරි හඬ ඇසෙනවා
තුරු ලතා වඳිනවා
මහ රහත් සමඟිනා
බුදු සමිඳු වඩිනවා
සිත් නිවී සැනසෙනා
දම් රසය දැනෙනවා

සසරෙ ගිනි දුරලනා
සත්ව සැම මුදවනා
මිහිරි දම් දෙසුමට
දහම් මඟ ගලනවා
සාධු නද මැද අපේ
බුදු සමිඳු වඩිනවා

**නිතිඥ කීර්ති කපුවත්ත**
**රිදීගම**

## කියමු තුන් සරණේ

අවරගිය හිරු නැඟෙයි පෙරඹ'ර සමන්ගිර   මුදුනේ
නිවී සනසා සිත් සදාලන උදා රිවි   කිරණේ
නළල තබලා වඳිමු සිරිපා කමල හද   බැතිනේ
පිහිට පතලා සමන් සුරිඳුගෙ කියමු තුන්   සරණේ

**ගාමිණී ජයලත් තල්දෙන**

## මෙතේ බුදුන් ළඟ ...

ලේ කිරි කර පොවා මගෙ කුසගිනි නිවූ   අම්මේ
උකුලේ හොවා නැළවිලි ගී කිවු   අම්මේ
දහමක අගය මට වටහා දුන්   අම්මේ
මෙතේ බුදුන් ළඟ නිවනට යනු   අම්මේ

**ටිවේන් මෙත්නුල**
**ශ්‍රී විජය බෝධි දහම් පාසල**



## නිවුණු සිතකට

සැනහුණු නිවුණු සිතක් පහළ   වන්නට
සියලු සත්වයන් හට   පිළිපදින්නට
දහමක් දෙසා ඇත අප   සැමට
අහුවෙන්න එපා වෙන අයගේ පටු   අරමුණට

**ශාර්මි**
**නුගේගොඩ**

## මුනි සිරිපා පුදමු



නැඟ එන විටදි රන්හිරු රැස් කිරණ   පබා
පේවී සිසිල් ජලයෙන් නා සිරුර   ඔබා
තෙදබල සමන් දෙවිඳුගෙ නිති පිහිට   ලබා
මුනි සිරිපා කමල නමදිමු! නළල   තබා

බිඳහැර ජාති කුල මල සිත්සතන්   තුළ
කරුණාවයි කියා හඬ දෙන සවන්   තල
නමදින මුනිඳු සිරිපද ලස කලින්   කල
එය මහ පිනකි මතු දැක්මට නිවන්   එල

**ජයන්තා රුවන්මලි පෙරේරා**
**පින්නවල - වග**



## ආසිරි පතමි

ගුරු පියතුමකි මුල්තැන ගන්නා   සඳය
තරු රැස බැබළෙනව ගුරුහිමි සඳ   වටය
ඒ තරු රැසින් සුබ පතනවා මේ   සමය
දිගුසිරි පතමි හැත්තෑ නවවැනි   දිවිය

ජන්මය ලබා හැත්තෑ නව වැනි වසරක් ගත   වූවා
කළ මහ මෙහෙවරත් රට ලෝකය ජාතිය   ගාවා
දකිනා කෙනකුගේ සිත සතුටින්   පිරවූවා
මාහරගම පියරතන නාහිමි   වැජඹේවා

**දෙහෙරගොඩ සුමංගල හිමි**
**ශ්‍රී පඤ්ඤානන්ද මූලික පිරිවෙන**
**මාහරගම ගිරිඋල්ල**

බුදුසරණ
## පහන් සිතක කවි

**සම්පූර්ණ නම** :- ................................................................................
**ලිපිනය** :- ................................................................................
**දුරකථන අංකය** :- ................................................................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක**
**සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.**
**ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.**
**සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.**


වර්ෂ 2023 ක් වූ අප්‍රේල් 05 බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.